

# මහණ කම

අත්දැකීම්

අනුව ලියනලද, බුරුම

# පුරාණ සතිපට්ඨාන විදර්ශනා

භාවනාව සහිත

# මහණකම.

ධර්මාචාර්ය

ගරු, ශාසනාධ ධර්මප්‍රභ ස්වාමින් වහන්සේ

විසිනි.

---

ප්‍රකාශක:

ජේ. ඩී. අබේනායක

වවුලුගල වත්ත - ඉමදූව

---

මුද්‍රණය:

සීමාසහිත මාතර වෙළන්දේ - මාතර. 6380

# මේ පොත

ලියන ලද්දේ ශීල විශුද්ධියෙහි පිහිටා භාවනා කරණු කැමති යෝගාවචර කුලපුත්‍රයන් සඳහාය. කලක් තිස්සේ වාද විවාද වෙමින් පැවති නොයෙක් විනය සිකපද පිළිබඳ සැක දුරුකරගැණීමට දරණ ලද උත්සාහයේ ප්‍රතිඵලයකි. විශුද්ධ ශීලයක් රැකීමට උත්සාහ ගන්නහුට විනය කුක්කුච්චය ඇතිවීම ස්වභාවයකි. ආචාර්‍ය්‍ය පරම්පරාවන්හි ඇති වාද විවාදයෝද ඒ සඳහා රුකුල්වෙති. කුකුසෙන් සැකයෙන් යුතු ශීලයක පිහිටා භාවනා කිරීමෙන් ඵලයක් නො ලද හැකි.

උපසම්පන්න භික්ෂු ශීලය වනාහි ලොවැ ඇති ඉතා උසස් භික්මීමකි. අනුපසම්පන්නයා රහත්වූවද උපසපන් පුහුදුන් භික්ෂුවට වත්පිළිවෙත් වැඳුම් පිදුම් කළ බව ධර්‍මයෙහි දක්වේ. විනය පිටකාගත ඒ මහත් ශික්ෂා සංවරය, ඉන්ද්‍රිය සංවරය පිරිසුදු දිවි පෙවෙත හා නුවණින් දැන ජීවත්වීම ද අල්පේච්ඡතාදි මහත් ගුණ සමූහය ද දැරීමෙන් සසුනත් සියලු සුචරිතයන් රක්නා උපසපන් භික්ෂුව දියෙන් මතුවී පෙනෙන මහනෙල් මල මෙන් සමාජයෙන් උස්ව බබලයි.

ඒ ශ්‍රේෂ්ඨ පුද්ගලයා විසින් එයටත් වඩා උසස් දෙයක් කළයුතු බව මේ ගතින් විස්තර වන්නේය. විවාද සහිත සිකපද මනාව වටහා ගෙණ නිවැරදිව පිළිපැදීමෙන් නිසැකව තමන් ශීලපාරිශුද්ධියෙහි පිහිටි බව සපිරව ගැණීමට සැම සුධීන්ටම මෙය උපකාරී වේවා! වාද විවාද කැමැත්තෝ එසේ කෙරෙත්වා !

"විවාදං භය තොදිස්වා
අවිවාදඤ්ච ඛෙමතො"

---

# මගේ බුරුම ගමන.

කුඩා කල වාරණ මඞ්ගලගිරි පිරිවෙන්හි මැදුම් සඟිෂයෙහි 'සතිපට්ඨාන'' සූත්‍රය උගනිද්දී මගේ ජීවිතයෙහි අදත් බලපවත්නා මහත් මානසික විප්ලවයක මූල පිරුණේය. කාලෙක යටපත්ව යළි වේගවත්ව නැග එන මේ හැඟීම් රැස දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව තෙක් ලංකාවේ භාවනානුයෝගීන් හා ඒ පිළිබඳ විශෙෂ උගත්කම් ඇති හිමිවරුන් ඇසුරු කිරීමෙහි මා පෙළැඹිය.

පළමුවර බුරුමයෙන් භාවණා ඉගෙණ වැඩම කළ ගරු ආභිධම්මික පණ්ඩිත දෙඩම්පහල කවිධජ ස්වාමිපාදයන් වහන්සේ ඇරඹූ මාතර දික්වැල්ලේ පිටදෙනියෙහි ශ්‍රී රෝහණ සතිපට්ඨාන විදර්ශනා ආශ්‍රමයේ මසකට අඩුකලක් භාවනානුයෝගී වීමෙන් බුරුම රටට ගොස් භාවනා ක්‍රම පිළිබඳ සොයා බලා ඉගෙණීමට බලවත් ආශාවක් පහළ විය.

මා හිතවත් පවාරිත දායක මාගාල්ලේ 'සේනානී'' නිවසෙහි බී. ආර්. දිසානායක හාමු මහත්මයා සහ එම නෝනාමහත්මයා ද මෙම චිත්ත සඞ්කල්පය සමෘද්ධ කිරීමෙහි ලා ඉදිරිපත් වූයෙන් හිතවත් හැවනිවල දායක පින්වතුන්ගේ මාර්ගෝපකරණ සම්පාදනයෙන් ද හිතවත් පවාරිත දායක ඊ. ඩී. අබේනායක රාලහාමි, කේ. ජී. ශ්‍රීවර්ධන මහතාණන්, ප්‍රෑඩී සෙනෙවිරත්න හාමු මහත්මයා සහ ඩබ්ලිව්. ටී. ඒ. ගුණවර්ධන මහතාණන්ගේ ද සහායයෙන් අවසර පත්‍ර ගැනීමාදි ගමන් පිළියෙල සම්පූර්ණ කොට ගෙණ ගරු පණ්ඩිත ශාස්ත්‍රාචාර්ය මිරිස්සේ ගුණසිරි හිමියන්ගේ මාර්ග දේශකත්වයෙන් 1954 නො: 10 දින කොළඹ වරායෙන් පිටත්ව 14 දින බුරුම බෞද්ධ මහා රාජ්‍යයට ගොඩ බැස්සෙමු.

අප පිළිගත් බුරුම රජයේ ශාසන කවුන්සලයේ මහත්වරු සවන මහා ධර්ම සඞ්ගායනය පවත්වන ලෝක සාම චෛත්‍යස්ථානයට කැඳවාගණ ගොස් එහි ආවාස පහසු ආදිය

සැලැස්වූහ. අග්‍රශ්‍රාවක ධාතූන් වහන්සේලා ද නවබුත් චෛත්‍යයන්හි ධාතූන් හා නොයෙක් නිධාන් වස්තූන් ද ලක්‍ෂයක් වටනා රිදී පිළිමයක් හා ස්වර්ණාලේපිත ප්‍රතිමා වහන්සේලා සතමක් ද තැන්පත් කොට චෛත්‍යාකාරයෙන් කරවන ලද ලෝක සාම් විහාරය මෙහි පළමුව හමුවේ.

ඉක්බිති සත්සියයක් පමණ මහා සඞ්ඝයා වහන්සේලා දිනපතා එක්රැස්වී සවන මහා ධර්මසංගායනාව පවත්වන පසළොස් දහසකට ඉඩකඩ සහ වාතාශ්‍රය ඇති විශිෂ්ඨ නිර්මාණයක් වූ ඇතට කඳු ගැටයක් මෙන් දිස්වන මහා පාෂාණ ගුහාව ද මහා සීමාව හා ජම්බුද්වීප, උත්තරකුරු, පුබ්බවිදේහ, අපර ගෝයාන, යන නම්වලින් හඳුන්වනු ලබන නෙමහල් මහා සඞ්ඝාවාස හා නෙමහල් මහා දානශාලාව ආරෝග්‍යශාලාදී අවශේෂ]; අවශ්‍ය අංගයන්ගෙන් සම්පූර්ණ වූ ලෝක සාම චෛත්‍යය යන අරුත් ඇති කබා- අයේ යන සුන්දර බුරුම නමින් හැඳින්වෙන මෙම ධර්ම සඞ්ගායනාස්ථානය වනාහි බුරුම බෞද්ධයාගේ ශ්‍රද්ධා භක්තිය පිඩුකළ තැනක් වැන්න.

මෙහි නැවතී සවන මහා ධර්ම සඞ්ගායනාවට සහභාගී වෙමින් රැන්ගුන් නගරයේ සෙවදගුන් මහා චෛත්‍ය- රාජයන් වහන්සේ ආදී වන්දනීය ස්ථාන වැඳ පිදුවේ අවකාශ ලැබෙන අයුරිනි. තවද හංසාවතී නගරය (පේගු) රත්නා- පූර්ණ නගරය (මණ්ඩලේ) අමරපුර සගයින් ආදී වන්දනීය දර්ශනීය ස්ථානයන් ද වැඳ පිදූයේ බුරුමයේ ආගමික චාරිත්‍ර චාරිත්‍ර හා භාවනාදී ප්‍රතිපත්තීන් පිළිබඳවද විමසිලිමත්ව ය.

පවත්නා නාමරූපයන් අරමුණු කිරීමේ උපදෙස් සහිත සතර සතිපට්ඨාන විදර්ශනා භාවනා ක්‍රමය උගන්වන බුරුම රටවාසී ධර්ම විනය ධාරී උතුමන් විසිතුදු පසස්නා ලද "ශාසන යෙයිතා" මහා ආශ්‍රමයට ඇතුළත්ව එහි ප්‍රධාන කර්මස්ථානාචාර්ය වූ- ගරුතර අෂින් සොභන මහාසී සයාඩෝ මාහිමියන් වහන්සේගේ කර්මස්ථානාචාර්යත්ව යන් හා ගරු යූ ජවන ස්ථවිරයන් වහන්සේගේ උපදේශාචාර්යත්ව- යෙන් ද ගරුතර යූ. සුජාත මහාස්ථවිරයන් වහන්සේ ගේ විශේෂාචාර්යත්වයෙන් ද ආරම්භ කළ සතිපට්ඨාන විදර්ශනා

භාවනා පුහුණුව දෙමස් දස දිනකින් සම්පූර්ණ කොට ධම්මාදස සූත්‍රය මාතෘකා කොට පැවැත්වෙන මහාසී සයාඩෝ මාහිමියන් වහන්සේ ගේ අවසන් දෙසුම ශ්‍රවණය කොට පට්ඨානාශ්‍රමයට යනු සඳහා අවසර ගතිමි.

වර්තමාන බුරුමයෙහි අභිධර්මය පිළිබඳ මහා විශේෂඥයකු වූ ගරුතර අශින් නාරද පට්ඨාන සයාඩෝ මාහිමියන් වටනෙහි පට්ඨාන ආශ්‍රමයේ නැවතී තෙමසක් පමණ පට්ඨානප්‍රකරණය ඉගෙණීමෙන් ද බුරුමවාසීන් රහත් උතුමකු මෙන් පුදනු ලබන ගරුතර මොඃද්ඃකුත් සයාඩෝ මහාස්ථවිරයන් වහන්සේ ඇසුරෙහි මෛත්‍රී කර්මස්ථානයෙන් විදර්ශනාවට බස්නා අයුරුද හංසාවතී කර්මස්ථාන විහාරයෙහි ආනාපානයෙන් විදර්ශනා ද පුහුණු කෙළෙමි.

බුරුමයට ආසන්නව පිහිටි බෞද්ධ රාජ්‍යයන් වූ සියම්-කාම්බෝජ දෙරටට යෑමට කාම්බෝජ සඟරජ හිමියන් විසින් ගමන් අවසරය ගැණීමට එවනලද විදුලි පණිවුඩය ලද නමුදු වස්සාන කාලය ආසන්න වූයෙන් ආපසු ලංකාවට පැමිණීමට අදහස් විය.

1955 ජූලයි 15 දින බුරුමයෙන් අහස් නැවින් කල්කටාව ට ද කල්කටාවෙන් මදුරාසියට ද පැමිණ මදුරාසියේ තියෝසොපිකල් ආශ්‍රමයෙහි යෝගීන් හා ද මයිලපූර්හි රාමක්‍රිෂ්ණ මිෂන් ආශ්‍රමයේ යෝගීන් හා ද ප්‍රයෝජනවත් සාකච්ඡා කොට එව 25 දින ගුවන් මගින් ලංකාවට පැමිණියෙමි.

මෙය ලියන ලද්දේ බුරුම ගමනට පූර්වයෙන් ය. බුරුම ගමනින් පසු මුද්‍රණය කිරීම වඩාත් මැනවැයි සිතාවත් කැපකරු දායක ඒ. ඩී. අභයනායක රාළහාමි ගේ අදහස විය. එහෙයින් ම බුරුමයේ දී මා පුහුණු කළ සතිපට්ඨාන භාවනා ක්‍රමය පිළිබඳ විස්තරයක් ද මෙහි ඇතුළත් කරන්නට ලැබීම සතුටට හේතු ය. එමෙන්ම බුරුමයේ බෞද්ධ චාරිත්‍ර වාරිත්‍රා-දිය පිළිබඳ ලත් අත්දැකීම් සඳහන් කරන්නට අවකාශ මදැවීම කණගාටුවකි.

තවද මෙහි මුද්‍රණය ආදී සියලු කටයුතු භාරය **ජේ. ඩී. අභයනායක** රාළහාමිට පැවරීමි. තමන් හිතමිත්‍ර ධර්මශාස්ත්‍ර ප්‍රවීණ **ආශීරත්න ශේරුකාණ** මහත්මා ලවා ප්‍රස්තාවනාව සැපයීම පොතේ ගරුත්වයට හා මගේ සතුටට ද හේතු ය. මාගේ සියලු ශාසනික අභිවෘද්ධියෙහි මූලාධාර වූ, පිළිකුත්තුරාජ මහා විහාරය, කොස්කඳවල, හැවනිවල සහ **පහලයාගොඩ** යන චතුර්මහා විහාරාධිපති, ප්‍රව්‍රජ්‍යාචාර්ය, ගරුතර, **යාගොඩ ධම්මානන්ද** අප හාමුදුරුවන් වහන්සේ හා වාරණ මඩගලගිරි පරිවේණාධිපති ගරුතර **ඇස්වත්තේ ධම්මතිලක** අප හාමුදුරුවන් වහන්සේ ඇතුළු සියලු ධර්මාචාර්යයන් වහන්සේලා ද බුරුම ගමනෙහි සම්පූර්ණ වියදම් දැරූ **බී. ආර්. දිසානායක** හාමු මහත්මයා සහ එම නෝනා මහත්මයා ද ඇතුළු සියලු හිතවත් දායක පින්වතුන් ද පින්දීමෙන් සිහිපත් කරමි.

සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!

**නිබ්බාන පච්චයො හොතු.**

**යාගොඩ ධර්මප්‍රභ භික්ෂු**

ශ්‍රී බුද්ධ වර්ෂ 2500 වෙසක්
පුරපසළොස්වක
"තපෝවනයේදී ය
වවුළුගල වත්ත – ඉමදුව.

භාවනා පුහුණුව දෙමස් දස දිනකින් සම්පූර්ණ කොට ධම්මාදාස සුත්තාන්ත මාතෘකා කොට පැවැත්වෙන මහාසී සයාඩෝ මාහිමි-යන් වහන්සේ ගේ අවසන් දෙසුම ශ්‍රවණය කොට පට්ඨානාශ්‍රමයට යනු සඳහා අවසර ගතිමි.

වර්තමාන බුරුමදේශයෙහි අභිධර්මය පිළිබඳ මහා විශේෂඥයකු වූ ගරුතර අෂින් නාරද පට්ඨාන සයාඩෝ මාහිමියන් යටතෙහි පට්ඨාන ආශ්‍රමයේ නැවතී තෙමසක් පමණ පට්ඨානප්‍රකරණය ඉගෙණීමෙන් ද බුරුමවාසීන් රහත් උතුමකු මෙන් පුදනු ලබන ගරුතර මොහ්ඤින් සයාඩෝ මහාස්ථවිරයන් වහන්සේ ඇසුරෙහි මෛත්‍රී කර්මස්ථානයෙන් විදර්ශනාවට බස්නා අයුරුද හංසාවතී කර්මස්ථාන විහාරයෙහි ආනාපානයෙන් විදර්ශනා ද පුහුණු කෙළෙමි.

බුරුමයට ආසන්නව පිහිටි බෞද්ධ රාජ්‍යයන් වූ සියම්-කාම්බෝජ දෙරටට යෑමට කාම්බෝජ සගරජ හිමියන් විසින් ගමන් අවසරය ගැණීමට එවනලද විදුලි පණිවුඩය ලද නමුදු වස්සාන කාලය ආසන්න වූයෙන් ආපසු ලංකාවට පැමිණීමට අදහස් විය.

1955 ජූලයි 15 දින බුරුමයෙන් අහස් නැවින් කල්කටාව ට ද කල්කටාවෙන් මද්‍රාසියට ද පැමිණ මද්‍රාසියේ තියෝසොපිකල් ආශ්‍රමයෙහි යෝගීන් හා ද මයිලපූර්හි රාමක්‍රිෂ්ණ මිෂන් ආශ්‍රමයේ යෝගීන් හා ද ප්‍රයෝජනවත් සාකච්ඡා කොට එම 25 දින ගුවන් මගින් ලංකාවට පැමිණියෙමි.

මෙය ලියන ලද්දේ බුරුම ගමනට පූර්වයෙන් ය. බුරුම ගමනින් පසු මුද්‍රණය කිරීම වඩාත් මැනවැයි සිතාවත් කැපකරු දායක ජ්. ඩී. අභයනායක රාළහාමි ගේ අදහස විය. එහෙයින් ම බුරුමයේ දී මා පුහුණු කළ සතිපට්ඨාන භාවනා ක්‍රමය පිළිබඳ විස්තරයක් ද මෙහි ඇතුළත් කරන්නට ලැබීම සතුටට හේතු ය. එමෙන්ම බුරුමයේ බෞද්ධ චාරිත්‍ර වාරිත්‍රා-දිය පිළිබඳ ලත් අත්දැකීම් සඳහන් කරන්නට අවකාශ මදිවීම කණගාටුවකි.

තවද මෙහි මුද්‍රණය ආදී සියලු කටයුතු භාරය **ජී. ඩී. අභයනායක** රාළහාමිට පැවරීමි. තමන් හිතමිත්‍ර ධර්මශාස්ත්‍ර ප්‍රවීණ **ආශීරත්න රේරුකාණ** මහත්මා ලවා ප්‍රස්තාවනාව සැපයීම පොතේ ගරුත්වයට හා මිනේ සතුටට ද හේතු ය. මාගේ සියලු ශාසනික අභිවෘද්ධියෙහි මූලාධාර වූ, පිළිකුත්තුරාජ මහා විහාරය, කොස්කඳවල, හැවතිවල සහ පහළෑගොඩ යන චතුර්මහා විහාරාධිපති, ප්‍රව්‍රජ්‍යාචාර්ය, ගරුතර, **යාගොඩ ධම්මානන්ද** අප හාමුදුරුවන් වහන්සේ හා වාරණ මඞ්ගලගිරි පරිවෙණාධිපති ගරුතර **ඇස්වත්තේ ධම්මතිලක** අප හාමුදුරුවන් වහන්සේ ඇතුළු සියලු ධර්මාචාර්යයන් වහන්සේලා ද බුරුම ගමෙහි සම්පූර්ණ වියදම් දරූ **බී. ආර්. දිසානායක** හාමු මහත්මයා සහ එම නෝනා මහත්මයා ද ඇතුළු සියලු හිතවත් දායක පින්වතුන් ද පින්දීමෙන් සිහිපත් කරමි.

සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !

**නිබ්බාන පච්චයො හොතු.**

**යාගොඩ ධර්මප්‍රභ භික්ෂු**

ශ්‍රී බුද්ධ වර්ෂ 2500 වෙසක්
පුරපසළොස්වක,
“තපෝවනයේදී ය
වවුළුගල වත්ත – ඉමදූව.

# උපහාර ය.

ගත බුදුවස් දෙදහස් පන්සියයැ සම්බුත්-
සසුන් බැබලුවූ ද අනාගත දෙදහස් පන්සියයැ
බබලවන්නා වූ ද මහා විහාර වංශ මා ඇදුරු
පරපුරෙහි වූ ද
උභය වංශයෙහි මැ වෙසෙසින් මෙ කල,

**සල්ගල, අලවල, කලුගල, මඳුනාගල,**
**මඩකඩ, මැල්ලගල, මාලිගාතැන්න**
**සහ මහ මිහිඳු අරණ්‍යාදී**
**විවේක වනසෙනසුන් සෙවුනා**

පිළිවෙත් සරු

**ගරු මහ සඟ හිමින්**

වෙතැ

**මෙ ගත භක්ති පුෂ්පයක් වේවා !**

*

# සැමරීම

---

මදීය ධර්මාචාර්යවර

ශරුතර බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය

නායක මාහිමි,

ආභිධම්මිකාචාර්ය

ගරුතර දෙවිනුවර ඤාණාවාස

ගරුතර බෝවල සිරිපවර

ගරුතර කොස්කඳවල සොමානන්ද

යන මාහිමිතුමන් වහන්සේලාද

අපවත් වී වදාළ

ගරුතර කුකුල්නාපේ ශ්‍රී දෙවරක්ඛිත,

අස්මඩලේ ශ්‍රී රත්නපාල

ප්‍රාචාර්ය යාගොඩ ශ්‍රී ගුණරත්න

යන මාහිමිතුමන් වහන්සේලාද කෘතවේදීව

පුණ්‍යානුමෝදනා පෙරටුව සිහිකරමි.

# ප්‍රස්තාවනාව

මහණ කම සැදැහැයෙන්, අවංක අදහසින් පිරිසිදුව ධර්මවිනයානුකූලව නොකරතොත් කිරීමට වඩා නොකිරීම ඉතා යහපත්ය. මහණ කම් කරන්නවුන් විසින් මහණ කම් කිරීමේ තේරුම කුමක්දැයි සලකා බැලිය යුතු. ගිහි ජීවිතය නොයෙක් කම්කටොළු හිරිහැර පීඩා වලින් ගහණ වූ අනවකාශත්වයෙන් සම්බාධ සහිත වූවකි. ගිහිව වෙසෙමින් සසර දුකින් මිදීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පූර්ණ කොට පිරිය නොහැකිය. එහෙයින් ගිහි ජීවිතයෙන් වෙන්ව ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපැදීම මහණ කමේ පරමාර්ථයයි. ශාසනයේ මුල් අවදියේ සසුන් ගතවූ සියල්ලන්ම මහණවූයේ මේ අදහසින් බව පෙනේ. කල්යාමෙන් මේ අදහසම පිටුවහල්කොට නොව, වෙනත් නොයෙක් අදහස් මුල් කරගෙන මහණ වන්නෝ වූහ. ඒ අදහසින්ම මහණ වූ අය පවා පසුව ඒ අදහසට පටහැනිව කටයුතු කරන්නෝද වූහ. එහෙයින් පසු කාලවල කොයි රටවලත් කලින් කල බුදුරජාණන් වහන්සේගේ අදහසට විරුද්ධ වූ උන්වහන්සේ විසින් පනවා වදාළ විනය ප්‍රඥප්තීන්ට අනුලෝම නොවූ හාත්පසින්ම මහණ කමට විරුද්ධ වූ මඟක් ගත්තෝද ඇතිවූහ. එමෙන්ම සැදැහැයෙන් මුලින් අදහස් කළ උතුම් අදහසින් චතුපාරිසුද්ධි සීලයෙන් සිල්වත්ව මහණකම් කරන සුපේශල ශික්ෂාකාමී භික්ෂූන්ගෙන්ද ශාසනය මේතාක් හිස් නොවිය. ථෙරවාද බුද්ධාගම පවත්නා කොයිරටවලත් එවැනි භික්ෂූහුද කවදත් සිටිනහ. අදත් සිටිති.

එවැනි ශික්ෂාකාමී භික්ෂූන් ඇරුණු විට අද කොයි රටවලත් බොහෝ භික්ෂූන්ගේ මහණ කම මහණකමේ පරමාර්ථයෙන් බොහෝ ඈතට ගමන්කර තිබේ බ්‍රහ්මජාල, සාමඤ්ඤ ඵල, ධම්මදායාද, ආකඞ්ඛෙය්‍ය, චූලහත්ථිපදෝපමාදී සූත්‍ර දේශනාවන්හි එන මහණකමත් අද බොහෝ මහණුන්ගේ

මහණ කමත් යන දෙක සසඳා බලන විට අහසට පොළොව මෙන් දුරස්තර වී තිබෙන බව පෙනේ. මෙය ප්‍රගතිශීලී කාලයට ඔබින සේ පිළිවෙල විය යුතු යයි ද සමහරු කියති. ශාසනයෙහි එකම ගතියක් මිස ප්‍රගතියක් නැත. ශාසනයට ඔබින සේ මිස කාලයට ඔබින සේ කළ-යුතු මහණ කමක් බුද්ධ දේශනාවේ නැත. නිවන් යන මාර්ග එකක්ම මිස දෙකක් නැත. එකම ප්‍රතිපත්තියක් මිස ප්‍රතිපදා දෙකක් නැත. එකම ආර්යමාර්ගයක් මිස ආර්යමාර්ග දෙකක් නැත. එකම නිවනක් මිස දෙනිවනක් නැත. එහෙයින් මහණකම නොව බෞද්ධ නාමවත් කාලයට හරියන සේ වෙනස් නොකළ හැකි බව තරයේ සිතිය යුතුයි.

මෙහි ආරම්භයේදීම ප්‍රකාශ කළ පරිදි විනය පිළිබඳ මනා දැනීමත් ආචාර්ය උපදේශත් ඇතිව සප්තාපත්තිස්කන්ධයෙන්ම මිදී මනාව මහණකම නොකළ හොත් ආඥාවිතික්කමන්තරායෙන් ස්වර්ගාන්තරාය මාර්ගාන්තරාය දෙකටම පැමිණෙයි. පාරාජිකාපන්නයෙක් නම් භික්ෂු භාවය ප්‍රතිඥා කරන තුරුත් වුට්ඨානගාමිනී ඇවතකට පැමිණියෙක් නම් එයින් නො-නැගිටින තුරුත් දෙසනා ගාමිනී ඇවතකට පැමිණියෙක් නම් දේශනා නොකරන තුරුත් ස්වර්ගාන්තරාය මාර්ගාන්තරාය යන දෙකින්ම යුක්තය. මරණින් පසු ඔහුගේ ගතිය නිරය හෝ තිරිසන් යෝනිය වෙයි.

මෙකල බොහෝ ප්‍රව්‍රජිතයන් වහන්සේලාගේ ප්‍රධාන අදහස්ව පවත්නේ සෙසේ හෝ මිල මුදල් සරසම්බ කරගෙන සුඛෝපභෝගී ජීවිතයක් ගතකිරීම බව පෙනේ. එහෙත් බුදුරජාණන්වහන්සේගේ නියමය **"නාහං භික්ඛවෙ කෙනචි පරියායෙන ජාතරූපරජතං සාදිතබ්බං පරියෙසිතබ්බන්ති වදාමි"** මහණෙනි, මම තොපට කයින් වචනයෙන් හිතෙන් යන කිසිම ආකාරයකින් මිල මුදල් මසු කහවනු ඉවසිය යුතු යයි කියා නොකියමි, යනුයි. මහණ කම නියම මහණ කමින් කොතරම් ඈත් වී තිබේදැයි සලකා ගැනීමට මෙය හොඳම ශාක්ෂියයි. බුදුරජාණන්වහන්සේ මිල මුදල් සැපයීම නොව පිළිගැනීම

ඉවසීමවත් කිසි අයුරකින් නොකළ යුතුයයි වදාළහ. අද භික්ෂූන් වහන්සේලා මිල මුදල් සැපයීමම මහණකම කරගෙන නොතිබේදැයි සිතා බැලිය යුතු.

සමහරු වෙළඳාම් කරති. සමහරු පොත් පත් ලියා මුද්‍රණය කොට විකුණති. සමහරු නොයෙක් විද්‍යාල තබාගෙන උගන්වති. සමහරු කාර් බස් කුලියට දෙති. සමහරු පොල්, රබර්, තේ, ඉඩ කඩම් වලින් උපයති. සමහරු ආවාස පන්සල් ගෙවල් කුලියට දෙති. සමහරු පඩි ලබන රැකී රක්ෂාවල යෙදෙති. සමහරු බණකීමට යන කාර් ගාස්තු දුම්රිය ගාස්තුවලින්ද බණ කීමෙන් ලැබෙන පිරිකර දන්දීම් ආදියේදී ලබන සිවුරු පාත්‍රා තුවාය ලේන්සු ආදිය, පිරිකර කඩයට විකිණීමෙන්ද උපයති. තවත් සමහරු සියක් නමට දහස් නමට දන්දීම් වෙහෙර විහාර පන්සල් ගොඩනැගිලි ඉදිකිරීමාදිය මූල්හරනෙනද නොයෙක් සම්මාදන් ව්‍යාපාර වලින්ද හරිහම්බ කරති. ඇතමෙක් දේවාලවල කපුකම් කිරීම, වෙදකම් කිරීම, කෙන්දර බැලීම, නැකැත් කීම, වස්කවි සෙත් කවි කීම, ගුරුකම් හදිහූනියන් කිරීම කැපීමාදියෙන් මුදල් උපයති. මේ ආදිවශයෙන් ශ්‍රමණ වෙශයෙන් සිට ගෙන මිල මුදල් උපයන සපයන ක්‍රම දහස කුත් එකකටත් වැඩියයි කිව යුතුයි.

මෙසේ භික්ෂූන් විසින් මිල මුදල් සැපයීම සහ පරිහරණය මේ කාලයේ නොකොට නොහැකි දෙයකැයිද මිල මුදල් නැතිව මෙකල මහණකම් කළ නොහැකියයිද කරන ප්‍රකාශයන් නිසා බෞද්ධයන් විසිනුදු එය නිවරද යයි පිළිගන්නා තැනට පවා කරුණු සැලසී තිබේ.

මහණකම නොකළ හැක්කේ මිල මුදල් නැතිව නොව ඇතිවය. ජාතරූප රජත ශික්ෂාපදය පමණ තදකොට පනවා වදාළ අන් ශික්ෂා පදයක් නැති තරම්ය. ශික්ෂාපද සියල්ලම පනවන ලද්දේ කාය වචනය පිළිබඳවය. එහෙත් ජාත රූප රජත ශික්ෂාපදය කයින් පිළිගැනීම වචනයෙන් පිළිගන්වා ගැනීම සිතින් ඉවසීම යයි කාය වචනය සිත යන තුනම ගැන පනවා වදාළ ශික්ෂාපදයකි. ඇවැත් වන්නේ

එළවා තබන ලද රන් රිදී මසු කහවණු සායින් හෝ වචනයෙන් ප්‍රතික්ෂේප නොකිරීම නිසා විනය ක්‍රමයෙන් කාය වාක් දෙදොරෙහි අකිරිය සමුට්ඨානයෙන් වුවද සූත්‍රාන්ත ක්‍රමයෙන් ගත්කල මනොද්වාරයෙන්ද සිදුවන පාපයකි. "කායෙන පටිග්ගහණං උග්ගහණං, වාචාය පටිග්ගාහාපනං උග්ගණ්හාපනං, මනසා පටිග්ගහණං සාදියනං" යි ටීකායෙහි කියන ලද්දේ එහෙයිනි.

බුදුරජාණන් වහන්සේ විසින් මෙය මෙතරම් දැඩිකොට පනවන ලද්දේ මිල මුදල් සැපයීම පිළිගැනීම දුරීම පමණක් නොව සිතින් ඉවසීමවත් කරන්නෙකුට මහණකම නොකළ හැකි හෙයිනි. ශාසනික මහණකම නොව බාහිර මහණකම් පවා මිල මුදල් පරිහරණයෙන් තොරය. මිල මුදල් පාවිච්චිකරන්නෙක් ප්‍රව්‍රජ්‍යාසංඛ්‍යාවෙහි ඇතුළත් නොවේ. ගිහි දශශීල සාමණේර දශශීලයන්ටද මේ ශික්ෂාපදය අයත්ය. අනාගාමී ගිහියාද මිල මුදල් පරිහරණය නොකරයි. ඝටීකාර කුම්භකාර චරිතය ඊට සාක්ෂියකි. ගාමණී සංයුත්තකයේදී වදාළේ "යස්සඛො ගාමණි ජාතරූපරජතං කප්පති පඤ්චපි තස්ස කාම ගුණා කප්පන්ති, යස්ස පඤ්චකාම ගුණා කප්පන්ති, එකංසෙනෙතං ධාරෙය්‍යාසි අස්සමණ ධම්මො අසක්‍ය පුත්තියධම්මො" යනුවෙනි. ගම්දෙටුව, යම් මහණෙකුට රන් රිදී මසු කහවණු කැපනම් ඔහුට පස්කම් ගුණ සැපද කැපය. යමෙකුට පස්කම් ගුණ කැප නම් ඔහු එකාන්තයෙන් අශ්‍රමණයෙකැයි අශාක්‍ය පුත්‍රයෙකැයි දරා ගනුව යන අදහස වෙයි. මෙයින් වදාරා තිබෙන්නේ රන් රිදී මසු කහවණු දරණ මහණ තෙමේ සම්පූර්ණයෙන් නොමහණෙකු බවය. මෙහි තතු දැනගැනීමට තවත් කරුණු කුමටද? මිල මුදල් පරිහරණය කරණ ශ්‍රමණතෙමේ ශාසනික භික්ෂුවක් තබා තාපසයෙකුවත් නොවන බව සිතා ගත යුතු. තවුසන් පවා මිල මුදල් පරිහරණයෙන් වෙන්විය යුතුය.

මෙසේ වුවද මෙකල කොයි රටවලත් බොහෝ බෞද්ධ භික්ෂූහු මිල මුදල් පරිහරණයට බැස සිටිති. ශික්ෂාව සැහැල්ලුකොට සිතා අනාදරය උපදවා එක් ශික්ෂාපදයකුදු මඩින්නාහට සියලු ශික්ෂාපදම මැඩීම අපහසු නොවේ. මේ

නිසා අද බොහෝ භික්ෂූහු මඬින ශික්ෂාපද මිස රකින ශික්ෂාපදය අසවල් ශික්ෂාපදයයි කිය නොහැකි තරම් අවදානමකට මහණකම පැමිණ තිබෙන බව මහණකම කුමක්දැයි දන්නෝ දනිති.

අද භික්ෂූන් වහන්සේට නොයෙක් ලෙසින් පහර ගැසීමට සැදී පැදී සිටින ශාසන විනාශකාරී පුද්ගලයින්ට මහත් අනුබලයක්ව පවත්නේද මේ දුෂ්ප්‍රතිපන්න මහණුන්ය. ඔවුන් කෙසේ කිවත් කුමක් ප්‍රචාරය කළත් අවිච්ඡින්න සුප්‍රතිපන්න භික්ෂු සංඝයාගෙන් පැවතෙන ශික්ෂාකාමී නියම භික්ෂු සංඝයාද නැත්තේ නොවේ.

ලක්දිවද කොයි නිකායවලත් සැදැහැයෙන් මහණව අපායභියෙන් යුක්තව ශ්‍රමණ ධර්මය සම්පූර්ණ කිරීම පිණිස සුලු වරදෙහි පවා බිය දකිමින් ශික්ෂා ගරුත්වයෙන් මහණකම් කරණ ගුණවත් භික්ෂු සංඝයා වැඩ වසති.

ඊට මේ "මහණකම" නමැති පොතම හොඳ සාක්ෂියකි. මේ පොතේ කර්තෘවන යාගොඩ ධර්මරතන හිමියන් වහන්සේ විනය ගැන විනිශ්චයාත්මක දැනීමක් ලබාගෙන ඊට අනුව මනාව පිළිපදිමින් මහණකමේ නිසි ප්‍රයෝජනය ගන්නා කෙනෙකු බව මේ පොත කියවීමෙන්ම කෙනෙකුට සිතාගත හැකිය.

විනයානුකූලව මහණකම් කිරීමට බලාපොරොත්තුවන සැදැහැවත් භික්ෂූන්ට ඒ පිළිබඳව දතයුතු බොහෝ කරුණු මෙහි පෙළ අටුවා ටීකාදියට අනුව පැහැදිලිව විසඳා තිබේ. විවාදභිමුඛව පවත්නා කරුණු කීපයක්ද පොත පතින් කරුණු පෙන්වා විනිශ්චය කර තිබේ. ඇතැම් විනිශ්චයයන්ට අප සම්පූර්ණයෙන්ම එකඟ නොවන නමුත් හැම කරුණක් ගැනම සවමතය කරුණු සහිතව දක්වා තිබීම පැසසිය යුත්තකි. තවද මෙහි ධුතාඞ්ග විස්තරයක් සහ භාවනා විස්තරයක්ද ඇතුළත් වෙයි. ධුතගුණ රැක්ම අද බොහෝ දුරට පිරිහී තිබෙන්නකි. යළිත් ශාසනය ධුතගුණ සම්පත්තයන්ගෙන් යුක්තවීමට ඒ ධුතාඞ්ග විස්තරය ඉවහල් විය හැක්ක. මූන්වහන්සේ විසින් මෙහි එන භාවනා

විස්තරය ලියා තිබෙන්නේ බුරුමයෙහි රැන්ගුන් නුවර "සාසන යෙයිතා" – 'ශාසන සෙවන' යන භාවනා මධ්‍යස්ථානයෙහි විදර්ශනා පුරුදු කිරීමෙන් ලත් අත්දැකීම්ද ඇතිවය.

විදර්ශනා භාවනා පුහුණු කරවීමට ලංකාවට පැමිණ සිටින බුරුම ස්වාමීන් වහන්සේලා ගෙන්ද මේ ධර්මප්‍රභ ස්වාමීන් වහන්සේ භාවනාවෙන් දියුණු තත්ත්වයකට පැමිණි බව අසන්ට ලැබිණ. අත්දැකීම්ද ඇතිව ලියා තිබෙන එම භාවනා විස්තරයෙන්ද විපුල ප්‍රයෝජනයක් ලක්වැයි බෞද්ධයන්ට අත්වෙයි. මේ කොයි ආකාරයෙනුත් මේ ග්‍රන්ථය ඉතා ප්‍රයෝජනවත් මෙකලට ඉතා අවශ්‍ය ග්‍රන්ථයක් බව කියනු කැමැත්තෙමු. මෙය භාවිත කිරීමෙන් මෙහි දැක්වෙන සීල සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ ශාසනය සම්පූර්ණකොට ශාන්ත සුඛය ලබාගනිත්වා!

ආයසීරත්න ථේරුනාන

නො: 28, 2 වැනි මාලිගාකන්ද පටුමාවත,
මරදාන.



# මහණ කම

**නමො සම්මා සම්බුද්ධස්ස.**

සමාජයත් සාමාජිකයාත් පරිසරය විසින් නොයෙක් අතට හරවනු ලැබේ. ඇතිවූ දා පටන් වෙනස් නො වූ සමාජයක් නො සෙවිය යුතු ය. එහෙත් ශාක්‍ය මුනීන්ද්‍ර වූ සර්වඥයන් වහන්සේ මෙයට වර්ෂ දෙදහස් පන්සියයකට පෙර පිහිටුවන ලද ශ්‍රමණ සමාජය තරම් අඩුවෙන් වෙනස් වූ ද දැනුදු මූලික ස්වරූපය හඳුනා ගැණීමට ඉතා පහසුවූ ද සමාජයක් වෙන් නො මැත.

එයට හේතුව නම්- එම භික්ෂු සමාජය සැම දෙනාටම පොදු වූ මහත් නීති රැසකින් බැඳ කරුණු සහිතව දෙසූ ස්වාක්ඛාත ධර්මයක උරුමක්කාරයන් හිමිකාරයන් වීමයි. එහෙයින් ලොවැ ඉතා පැරණිවූ ද අසංකරවූ ද ස්වල්ප වශයෙන් වෙනස්වූ ද අවිච්ඡින්න වැ නො කැඩී පවත්නා වූ ද එකම සමාජය ශ්‍රමණ සමාජය යි.

> **"යාවතා භික්ඛවෙ සඞ්ඝා වා ගණා වා තථාගත සාවක සඞ්ඝො තෙසං අග්ගමක්ඛායති"**
>
> (අග්ගප්පසාද සුත්ත)

මහණෙනි, යම්තාක් ලොවැ සමූහයෝ පිරිස් වෙත් ද ඒ හැමට වඩා බුද්ධ ශ්‍රාවක සඞ්ඝ- සමූහ තෙමේ අග්‍ර ය, උත්තම ය, ශ්‍රේෂ්ඨ ය, ප්‍රවර ය

භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවෝ බුද්ධ ශ්‍රාවකයෝ ය. බුදුපිරිස ය. පළමුව ධර්මාවබෝධකිරීමෙන් බුද්ධශ්‍රාවක භාවයට පත්වූයේ භික්ෂුවකි. එදා සිට පිරිනිවෙනතුරු සන්තිකාවචර වූ වෝ- ළඟ හැසුරුණෝ භික්ෂුහු ම ය. අදත් මතු ත් බුදුනට සමීප චාරීහු නම් පිළිවෙත් පරපුරෙන් පැවතෙන භික්ෂුහුම ය. ගුණෙනු ත් නැණෙනු ත් හික්මී- මෙනු ත් සංසුන් පැවැත්මෙනු ත් මනා අවබෝධයෙනු ත්

උසස් ම කමෙක- ක්‍රියාවෙක යෙදෙන හෙයින් භික්ෂුව ශ්‍රෙෂ්ඨ ය.

**ජ උසස්කම නම් මහණ කම ය.**

උද්දිස්ස හෝ උදිස්ස පැවිද්ද යැ සි අන්‍ය තීර්ථකයන් ගේ පැවිද්දක් විය. එම පැවිද්දෙන් බුදුවන උතුමන් උදෙසා ද බුදු වූ පසු බුදුරදුන් හමු-වන-තුරු ද බුදුන් උදෙසා මහණ වූවෝ වූහ. එනම් කොණ්ඩඤ්ඤ ආදී පස්වග තවුසනු ත් නාලක තවුසා සහ පිපඵලී මානවකාදීහු ය. ඒ උතුමෝ බුදුරදුන් හමු වැ ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යායෙන් ශාසනගත වූහ.

**"කංසි ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො"** ඇවත. ඔබ කවුරුන් උදෙසා පැවිදි වීදැ සි යන බාහිර තවුසන් ගේ පිළිවිසීමෙන් පෙණී යනු යේ මොය අන් තොටුවන්ගේ පැවිද්දක් බව ය. දුරක්ඛාත හෙවත් මුල මැද අග මිනාව දෙසූ ධර්මයක් නැති තීර්ථක ශාසනයන්හි නියම ක්‍රමයකා පැවිද්දක් නො තිබුණු හෙයින් ඒ ඒ ශාස්තෘන් වෙනුවෙන් තමන් ම පැවිදි වැ "මම අසවලා ගේ ශ්‍රාවකයෙමි" සි තමන් විසින් ම දක්වා ගැණීම උදෙසා පැවිද්දෙනි තේරුම ය.

නියම පැවිදි ක්‍රමයක් පැවිදි- ලිඞගයක් අනුදැන වදළ ස්වාක්ඛාත හෙවත් මනාව දහම් දෙසා ඇති බුදුසසුනෙහි, "මම බුඩශ්‍රාවක භික්ෂුවක්මි" සි තමන් උදෙසීමක් අනාවශ්‍යය. මේ බුඩශ්‍රාවකයෙකැ සි එහි නියම ප්‍රව්‍රජ්‍යා ලිඞගයෙන් පැහැදිලි හෙයිනි. මුලින් බුදුරදුන් උදෙසා පැවිදි වූ ඒ මහ පිනැතියෝ නොබෝ දිනකින් ම එහි භික්ෂූපසම්පත් ලත් මහ රහත්වරු වූහ.

**ශාසනික මහණකම.**

ඉහත දැක් වූ එහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාව මුලින් ම ඇති වූ ශාසනික මහණ කම ය. එය සෘතපුණ්‍ය මහෝත්තමයන් හට "එව මහණැ" සි බුදුරදුන් වදළ විගස සෘඬිමය අෂ්ට-පරිෂ්කාර ධර වැ ගිහි වෙස අතුරුදන්වැ පැවිදි වෙස ලැබීමකි. එම පැවිද්ද බුදුරදුන් අතින් මිස අනිකකුගෙන් නො සිදු වෙයි.

ලොවැ රහත් භික්ෂූන් සැටක් වූ පසු ඒ ඒ ප්‍රදේශවල ධර්මප්‍රචාරයෙහි යොදවා එහිදීම කුලදරුවන් මහණකිරීම සඳහා සරණාගමන පැවිද්ද නියම කළසේක. **"අනුජානාමි භික්ඛවෙ, ඉමෙහි තීහි සරණාගමනෙහි පබ්බජ්ජං, උපසම්පදඤ්ච"**

"මහණෙනි, මේ තිසරණගමනයෙන් පැවිද්ද ත් උපසම්පදාව ත් අනුදන වදරමැ" යි නියම කළසේක. එසේම පැවිදි කරණ ක්‍රමය ද **"පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා"** යනාදින් පළමුව හිස රවුළු බහා කසට පෙවූ වස්ත්‍ර හඳවා උත්තරාසංගය එකස් කොට පොරවා භික්ෂූන් ගේ පා වඳවා උත්කුටකයෙන් හිඳුවා ඇඳිලි බඳවා සරණ සමාදන් කරවිය යුතුයැ යි අනුදන්හ.

**"සාමණෙර පබ්බජ්ජා පන උභතො සුද්ධියා වට්ටති"** යනුවෙන් හෙරණ පැවිද්ද ආචාර්‍ය්‍ය ශිෂ්‍ය දෙනමගේ ම ස්ථාන කරණ සම්පත් (අකුරු උපදින ඈදී තැන්) නො නසා නිග්ගහිතාන්ත කොට හෝ මකාරාන්ත කොට සරණ දීමෙන් හා ගැණීමෙන් ම පිහිටන බව අර්ථ කථා නියම යයි. දසවස් ගිය උපසපන් භික්ෂුවක් ම කෙණෙකු පැවිදි කළ යුතු ය. එබඳු ආචාර්‍ය්‍යවරයෙකු නො ලැබ උභතොශුද්ධියක් නො-ලැබේ. මෙසේ ශාසනික මහණකම **එහි භික්ෂු ප්‍රව්‍රජ්‍යා, ශරණගමන ප්‍රව්‍රජ්‍යා** යැ යි දෙ පරිදි ය. එයින් මෙකල ශරණ ගමන ප්‍රව්‍රජ්‍යාවෙන් මහණකම ලැබිය යුතු ය. බුදුරදුන් නියම කළ වෙන පැවිද්දක් නැති හෙයිනි. මෙම සාමණෙර පැවිද්දම රාහුල වස්තුවේ දී නැවතත් සවිස්තර වදාළසේක.

පරිනිර්වාණයෙන් පසු තමන් මැ සිවුරු පෙරවාගත්තවුන් ඇති වූයේ ධර්මාශෝක කාලයේදී ය. පැවිදි වෙස සොරාගත් ඔවුහු විහාරවලට ඇතුල් වැ මහත් කලබල කළහ. ධර්මාශෝක අධිරාජයා ගේ සහායයෙන් මොග්ගලිපුත්තතිස්ස මහ රහතන් වහන්සේ මහණ වෙස සොරාගත්තවුන් සසුනෙන් පන්නා දහසක් මහ රහතුන් පිරිවරා ධර්මසංගායනා කොට බුදුසසුන ලොවැ බැබලවූහ.

ඒ මහත් ශාසන සේවය ම අපට ද පිහිට වූයේ ය. එදා සිට මෙදාතෙක් ඉතිහාසයෙහි සිවුරු හොරුන් ගැණ සඳහන් නැත. දෙදහස් පන්සියය ලංවත්ම සිවුරු හොරුන් සසුනට කඩා වැදුණේ ධර්මාශෝක කාලයෙහි ඇති වූ ශාසනෝද්දීපනිය මෙකල ද ඇතිවීමේ නිමිත්තක් ලෙස නො සිතිය යුතු ද?

**ථෙය්‍ය සංවාසකයා**

**"පුන පබ්බජ්ජං සාමණෙරනාපි න පබ්බාජෙතබ්බො"** (විනය අට්ඨකථාව) ශ්‍රමණ ලිඞ්ගය හෙවත් සිවුර තමන් ම පොරවා හොරෙන් සසුනට ඇතුල් වූ ථෙය්‍යසංවාසකයා මහණ නො-කළ යුතු ය. උපසම්පදා නො කළ යුතු ය. මේ ධර්ම නියමය යි.

මෙහි ශ්‍රමණ වේශය සොරාගත් **ලිඞ්ගත්ථෙනකයා** ද මහණ උපසම්පදාව ලැබ මහණකම නසාගත් හෙවත් පාරාජිකා වූ එහෙත් භික්ෂුවක් මෙන් පෙණීසිට බොරුවස් ගණින **සංවාසත්ථෙනකයා** ද සිවුරුත් සොරාගෙණ බොරු වසුත් ගණින **උභයත්ථෙනකයා** ද යන තුන් වැදෑරුම් සසුන් හොරු නැවත මහණ නො කළ යුතු ය යි නියම කරණ ලදී.

තවද යමෙක් සොර සතුරු භය කාන්තාර දුර්භික්ෂ භය නිසා හෝ ගමේදී ගිහි වැ නැවත සිවුරු ආරාමයට ගෙණ යෑමේ දී අතර මගදී සොරු ගණිය යි සිවුරු පොරවා ගැණී-මෙන් හෝ පැවිදි වෙස් ගණියි ද තමන් භික්ෂුවක් වශයෙන් ඉදිරිපත් නො වැ ඇත්ත ප්‍රකාශ කරයි ද ඔහු නැවත මහණ කළ යුතු ය.

බෝසතාණන්හට සිවුරු පොරවන ලද්දේ කවුරුන් දැ යි අසමින් මෙකල ද තමන් ම සිවුරු පොරවා ගන්නා තාපස වරුන් සසුනට අයිති නැති. බෝසත් තුමා බුදුවන්නට පෙර කාශ්‍යප බුදු සසුනෙන් පසු බුදු සසුනක් තිබුණේ නැත. එසේ ම උන්වහන්සේ බුදුව විනය දෙසූ පසු ශාසනයෙහි තාපස පැවිද්දකුත් නැත. [බෝසතාණන් වහන්සේ ගේ පැවිද්දට අත දිගු කරන්නෝ ඔවුනු ත් බුදුවන්නට දැ යි මහාජනයා ප්‍රවේසම් විය යුතු ය.]

ඉදින් ඒ තාපසවරු තමන් සසුනට අයිති නැතිබව පිළිගනිත් නම්, භික්ෂූන් හා නො ගැටෙත් නම්, පිරිසුදු අදහස් ඇත්නම්, තමන් ගත් ශ්‍රමණ වේෂය අත්හැර පැමිණියොත් විනයානුකූලව භික්මවා මහණ කළ ද වරද නැති බව සැලකිය හැක.

**මහණකම,**

**"යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන, අනුකම්පං උපාදාය, කතං වො තං මයා, එතානි භික්ඛවෙ, රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ ! මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ."**

"ශ්‍රාවකයනට හිතවත් වූ අනුකම්පා ඇති ශාස්තෘවරයෙකු විසින් යමක් කටයුතු ද? එය මා විසින් නුඹලාට සිදුකරණ ලදී. මහණෙනි, මේ අරණ්‍ය වෘක්ෂමූල සහ හිස් ගෙවල් වෙති. මහණෙනි, ධ්‍යාන කරව්, භාවනා කරව්, පමා නොවව්, පසුව විපිළිසර නො වව්,

මෙහි **"ඣායථ! භික්ඛවෙ, මා පමාදත්ථ"** "භාවනා කරව්, මහණෙනි, පමානොවව්" යැ යි දෙශනාකර වදාළේ භික්ෂුව විසින් කළ යුතු දෙය ය. එනම් **මහණකම ය.**

තවද චිත්තවග්ගයේ (ධම්මපද) අඤ්ඤතර භික්ෂුවස්තුවෙහි **"මයං උපාසිකෙ, එකස්මිං ඨානෙ නිසීදිත්වා සමණ ධම්මං කරිමහ," කො එස තාතා! සමණ ධම්මො නාමාති, ද්වත්තිංසාකාරං, සජ්ඣායං කරොම, අත්තභාවෙ ඛයවයං පට්ඨපෙම, මහා උපාසිකෙති"**

මහ උපාසිකාවෙනි, එක්තැනෙක හිඳ මහණදම් කෙළෙමු. ස්වාමිදරුවෙනි, ඒ මහණදම නම් කවරේ ද? මහ උවැසියෙනි, වචනයෙන් පුහුණු කිරීම් වශයෙන් ද්වත්තිංසාකාරය කියවමු. ආත්මභාවයෙහි ක්ෂයවීම විනාශවීම සිහියෙහි තංවමු. (අනිත්‍යානුපස්සනාව) ය යි ඒ භික්ෂූහු පිළිතුරු දුන්හ. මෙහි ද **මහණකම** නම් සමථ විපස්සනා භාවනා වැඩීම බව පැහැදිලි ය.

තවද සමන්තපාසාදිකා විනය අටුවාවෙහි නිසෙන් හෙවත් ගුරු ඇසුරෙන් මිදෙන බහුශ්‍රැත භික්ෂුව හඳුන්වන තැන **"සමණ ධම්ම කාරණත්ථං සමාධි වසෙන වා විපස්සනා වසෙන වා අරහත්ත පරියොසානං තමෙකං කම්මට්ඨානං, එත්තකං උග්ගහෙ තබ්බං"**

"තම මහණකම කිරීම සඳහා සමථ විදර්ශනා වශයෙන් අර්හත්වය අවසන් කොට, එක් කමටහනක් ද යි මෙතෙක් උගත යුතුයැ" යි නියම කරණ ලද හෙයින් දේශනා පෙළෙහි ද අර්ථකථාවන්හි ද නොයෙක් තැන භාවනා කිරීම ම **මහණ-කම** යැ යි ප්‍රසිද්ධ ය.

## වැඩකට නැද්ද?

සමථ විදර්ශනා භාවනා වැඩීමෙන් මේකල මාර්ගඵලාධිගම-යක් නො ලැබෙණ බව ඇතැමෙක් පවසති. ඒ අය සාර සඞ්ග්‍රහය මාන දණ්ඩ කොට ගෙණ අටුවා මතවලට පහර දෙමින් මෙකල අධිගමය නැතැයි තරයේ පවසති.

චූල්ලවග්ග පාළියෙහි භික්ඛුණී ඛන්ධකයෙහි, **"වස්ස සහස්සං සද්ධම්මො තිට්ඨෙය්‍ය"** යන බුදු වදන ගෙණ හැර දක්වා "වර්ෂ සහශ්‍රයක් කල් අධිගම සද්ධර්මය සිටුනේ ය. යනු එහි අර්ථ වෙයි. මෙහෙණි සස්න පහළවීම නිසා වර්ෂයන් සියයෙකින් අධිගමය අතුරුදන් වන බව ද" යන අධිගම ලිපි පාඨයෙක **"වර්ෂයන් සියයෙකින්"** යන්න පල් බොරුවකි. **"පඤ්චවදානි ආනන්ද වස්ස සතානි සද්ධම්මො තිට්ඨෙය්‍ය"** ආනන්ද, යම් හෙයකින් මාගම සසුනෙහි පැවිදිවී ද දැන් සසුන වැඩිකල් පවත්නේ නො වෙයි. ආනන්ද, අවුරුදු පන්සියයක් පවත්නේ" යැ යි මේ බුඩ දෙශනා ය.

අෂ්ටගුරුධර්ම පිළිගත් හෙයින් තවත් අවුරුදු පන්සියයක් ශාසනය පවත්නා බව දෙශනා පෙළෙහි නැත. ගරුදම් අට නො පැණ වුවත් සසුන අවුරුදු පන්සියයක් පවත්නා බවත් පළමුකොට ම ගරු දම් පැණවීම නිසා තවත් පන්සියයක් පවත්නා හෙයින් අවුරුදු දහසම ශාසනය පවත්නා බව අර්ථ-කථායෙහි දක්වයි.

**එස ඉමෙ අනුප්පන්නෙ චෙව වත්ථුස්මිං පටිගච්චෙව අවීතික්කමණත්ථාය ගරුධම්මා පඤ්ඤත්තා, තෙසු අපඤ්ඤත්තෙසුපි මාතුගාමස්ස පබ්බජිතත්තා පඤ්චෙව වස්ස සතානි සද්ධම්මො තිට්ඨෙය්‍ය, පටිකච්චෙව පඤ්ඤත්තත්තා පන අපරානිපි පඤ්ච වස්ස සතානි ඨස්සතීති එවං පඨමං වුත්තං වස්ස සහස්ස මෙව" ඨස්සතීති.** යනු එම විනය අටුවා පාඨයයි.

මෙසේ වර්ෂ දහස අටුවා මතය අනුව ගත් අය **"වස්ස සහස්සන්ති චෙතං පටිසම්භිදාපභෙදප්පත්ත ඛීණාසව වසෙනෙව** වුත්තං" "මේ වර්ෂ සහශ්‍රය නම් සිවුපිළිසිඹියා පත් රහතුන් ගේ වශයෙනැ යි කියන ලද අටුවා මතය බැහැර කරති. එහිදු **"වසෙනෙව"** යනුවෙන් නිර්ධාරණාර්ථයෙන් දක්වා ඇතද එයට වඩා සාරසංග්‍රහ මතය ගරුකොට ගැනීමේ හේතු කිම. මෙහි, සද්ධර්මය නම් මාර්ග ඵල නිර්වාණය යි අසුවල් මාර්ගයැ යි වෙන්කොට පෙළෙහි නො දැක්වූ හෙයින් අටුවාචාරීන් වහන්සේ විසින් දක්වන ලද "වර්ෂ දහසක් පවත්නේ සිවුපිළිසැඹියා රහත් මග" නැමැති සද්ධර්මය ය. ඉන්පසු ෂඩභිඥ ශුෂ්කවිදර්ශක ආදී රහත් මග අනාගාමි - සකෘදාගාමි - සෝතාපත්ති මග නැණ සද්ධර්මය පවතී" යන මතය පිළිගත යුතුය. එයින් බැහැර යෑම සාර සංග්‍රහය හෝ ඒ අය අර්ථකථාචාර්යයන් වහන්සේලාට ඉහළින් පිළිගැනීමකි.

එසේම **"ඉමෙච සුභද්දභික්ඛූ සම්මා විහරෙය්‍යුං අසුඤ්ඤො ලොකො අරහන්තානං අස්ස"** යන බුදු වදනෙහිදු අර්ථය අන් අතකට යවනුයේ යැ.

භික්ෂූහු මනාව ප්‍රතිපත්ති රකිත් නම් ලෝකය රහතුන් ගෙන් හිස් නොවෙයි එය "රහතුන් අතින් හිස් නොවෙයි" කියා **ප්‍රතිපත්ති පරිදීපනා** සඳහා එසේ වදාළ බව දක්වයි. ප්‍රතිපත්ති පරිදීපනය සඳහා බුදුවරයන් වහන්සේ නමක් නො සිදුවන්නක් නො වදාරති. එය "ප්‍රර්ථානත" බවට නො සිදුවන්නකි.

බුදුරදහු ධර්මය බොරුවට වර්ණනා කළහ යි ඔබ මෙයින් කියන හෙයින් "තථාගත"යන් බොරුවෙන් චෝදනා

කිරීමක් වැන්න. එසේම මේකල අරණ්‍ය වාසයෙහි සියලකටත් අඩුතරම් සඟ පිරිසක් විවේක වත් සපයා සාමටගන් වඩති. ගොඩ සිටගෙන නැව් පෙරලන්නා සේ එම පිරිසටත් අධිගම සඳුනටත් පයර නොදී අරණ්‍යය කාට පැමිණි කාලක් භාවනා කොට බලාවත් ඔබඳු දෑ ලියන කියන මෙන් පඬිවරුනට ගෞරවයෙන් ආරාධනා කරමු.

මුල් බුඩ වර්‍ෂ පන්සියයෙහි ලක්වැසි මහ රහතන් වහන්-සේලා ගේද ශාසනය පිළිබඳ වැදගත් සාකච්ඡාවෙක් විය. බුදුසසුන පවත්නේ පර්‍යාප්තිය මුල්කොට ද ප්‍රතිපත්තිය මුල් කොට දැයි ඇති වූ ප්‍රශ්නය යි. පර්‍යාප්තිය හෙවත් ත්‍රිපිටක ධර්‍මය ඇතිතෙක් අධිගමය පවත්නා බව එම ධර්‍ම සාකච්ඡාවේදී ඇතිවූ නිගමනයයි. එය සථිර කිරීම සඳහා මේ සූත්‍රදේශනාව සාධක කොට දක්වන ලදී.

එනම් **"සුත්තන්තෙ රක්ඛිතෙ සන්තෙ
පටිපත්ති හොති රක්ඛිතා
පටිපත්තියං ඨිතො ධීරො
යොගක්ඛෙමා න ධංසති"**

තෙවලා දහම රැකී කල්හි ප්‍රතිපත්තිය රැකුණේ වෙයි. ප්‍රතිපත්තියෙහි පිහිටි නුවණැත්තේ අධිගමයෙන් හෙවත් නිවණින් බැහැර වූයේ නොවෙයි.

**"යථාච නිධිකුම්භියා ජානනත්ථාය පාසාණෙ පිට්ඨෙ අක්ඛරෙසු උපනිබද්ධෙසු යාව අක්ඛරානි ධරන්ති තාව නිධිකුම්භි නට්ඨා නාම න හොති එවමෙව පරියත්තියා ධරමානාය සාසනං අන්තරහිතං නාම න හොති"**

යම්සේ නිදන් සැළක් මතුයෙහි "මෙතැන නිධානයැ යි" ගලෙක අකුරු ලියා තබයි ද එය පවත්නා තුරු නිදන් සැළ නැතිවූයේ නොවෙයි. එපරිද්දෙන් අධිගමූපාය වූ පර්‍යාප්තිය පවත්නා කල අධිගම් සාසනය අන්තර්ධාන වූයේ නොවෙයි. මේ එහි අර්‍ථය යි.

විනය මහ අටුවාවෙහි ද, **"එවං පඤ්චවස්ස සහස්සානි පටිවෙධ සද්ධම්මො ඨස්සති. පරියත්තිධම්මම්පි තානි එව,**

**නහි පරියත්තියා අසති පටිවේධො අත්ථි, නාපි පරියත්තියා සති පටිවේධො න හොති.”**

මෙසේ හවුරුදු පන්දහසක් ප්‍රතිවෙධ සද්ධර්මය පවතී. පර්‍යාප්ති ධර්මය ද එතෙක් ම පවතී. පර්‍යාප්තිය නැති කල්හි ප්‍රතිවේධයක් නොමැත. එසේම පර්‍යාප්තිය ඇති කල්හි ප්‍රතිවේධය නැතැයි නොකිය යුතු ය.

යනුවෙන් ඉතා පැහැදිලිව– ත්‍රිපිටකය තිබිය දී අධිගමය තිබෙන බව දක්වූ රහතන් වහන්සේලාගේ හා අට්ඨකථාචාර්‍ය්‍යයන් වහන්සේලාගේ නිගමනය සාධකථා ත්‍රිපිටක ය, ඇතිතෙක් අවලංගු කළ නො හැකි. ප්‍රතිවේධය නැවත ඇති– කළ නොහෙත බව මිලින්දප්‍රශ්නයෙන් දක්වුව ද රහත් වූ භූම්‍යස්ථ දෙවිවරුන් පවා මේ පන්දහස විද්‍යමාන හෙයින් ප්‍රතිවෙධයෙහි අමුතුවෙන් නැගුටුවන්නට දෙයක් නො මැත.

තවද දිඹුලාගල කාශ්‍යපාදී හිමිවරු අපි මෙතෙක් ධ්‍යාන මාර්ග ලැබුවම්හ යි ප්‍රකාශ නො කළ බව සැබව. ඒ උසස් ගුණදම් ලැබුවෝ තම උසස් ගුණ ප්‍රකාශ නො කෙරෙති. එහෙයින් එව නිගමනය ද අහේතුක ය.

බෞද්ධ පින්වතුනි,

ධර්මය **“සන්දිට්ඨික එහිපස්සික”** ගුණයෙන් තොර වූයේ ද වන්නේ ද නොවේ. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිහිටා ශාන්ත වූ නිවණ ලබාගැනීමට උත්සාහ දැරිය යුතු. ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ඇති භව්‍ය පුද්ගලයනට අද නොව තව අවුරුදු දෙදහසක් ගියද නිවන් ලැබිය හැකිම ය. විතණ්ඩවාදී කථාවන්ගෙන් සසුනට එදත් අදත් සිදු වූ හානිය සුළුපටු නො වේ. සැදැහැත්තෝ නො පමාවෙත් වා !

**තෙවැදෑරුම් මහණකම.**

මහණකම කොටස් තුණකට බෙදත හැකි. විනයානුකූල මහණකම, සූත්‍රානුකූල මහණකම, අභිධර්මානුකූල මහණකම, යනු ඒ තුණයි. පරිජි, සඟවෙසෙස්, ථුලසි, පචිති, පාටි– දෙසනීය, දුක්කට, දුබ්භාසිත, යන සප්තාපත්තිස්කන්ධයෙන් තොර වැ ලජ්ජී ශික්ෂාකාමී වැ අවිප්‍රතිසාර (විපිළිසර නොවන) ශීලයෙන් යුතු වීම **විනයානුකූල මහණකම යි.**

තෙළෙස් "ධූත" ගුණ රැකීම හා එම උත්කෘෂ්ට සංලේඛ (කෙලෙස් ලියා දමන) ප්‍රතිපත්තිය ගැබ්කොට දෙසූ "සතර ආර්‍ය්‍යවංශ" ප්‍රතිපදාව ද නිවන් දැකීමේ ඉක්මන් බව ඇතිකර- ලන "තුවට්ටක" ප්‍රතිපදාව "මොනෙය්‍ය" ප්‍රතිපදාව ආදී උසස් ගුණධර්ම රැකීමෙන් ශීල විශුද්ධියෙහි පිහිටා කසිණාදි සමථ භාවනාවකින් චිත්ත විශුද්ධිය ඇතිකර ගැනීම **ශ්‍රුතානුකූල මහණකම ය.**

මෙසේ ශීල චිත්ත විශුද්ධීන් ලැබූ භික්ෂුව නාම රූප ධර්ම- යන් පරිග්‍රහණය කොට හෙවත් අනිත්‍යාදි වශයෙන් භාවනා වඩා දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණ විසුද්ධි, මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි, පටිපදා ඤාණ දස්සන විසුද්ධි, ඤාණදස්සන විසුද්ධි, යන පස්වූ විසුද්ධීන්හි යෙදීම **අභිධර්මානුකූල මහණකම යි.** මේ සප්ත විශුද්ධීන් ගෙන් සම්පූර්ණ වූ විට මහණකම සම්පූර්ණ ය.

**මහණකමෙහි "ධුර" භේදය.**

"ධුර" යනු ඉසිලිය යුතු භාරය යි. වග කිමයි භික්ෂුව විසින් ඉසිලිය යුතු වගකීම් දෙකොටසකට බෙදා අටුවා ග්‍රන්ථ- යන්හි දක්වේ.

ගන්ථධුර– විපස්සනාධුර = (ධම්මපදා අටුවාව)
වාසධුර– පරියත්තිධුර } (අඞ්ගුත්තර අටුවාව)
වාසධුර– ගන්ථධුර

මෙහි වාසධුර යනු විදර්ශනා ධුරයම ය. පරියත්ති ධුරය යනු ග්‍රන්ථ ධුරය යි. සෑම භික්ෂුවක් ම ග්‍රන්ථ ධුරයෙහි නියමිත ප්‍රමාණයක් සම්පූර්ණ කළ යුතු ය.

නිස්සය මුච්චනක බහු ශ්‍රැතයෙක්වැ තැනක විසිය හැක. අරණ්‍ය වාසයට සුදුසු "නිස්සය මුච්චනක" බහුශ්‍රැත භික්ෂුව නම්- ගුරු ඇසුරෙන් මිදීමට තරම් දැන උගත් හික්මුණු උපසම්පත්තියෙන් පස් වස් ඉක්ම වූවෙක් විය යුතු ය. නියමිත උගත්කම් නො ලද හොත් වස් හැටක් ගත වුව ද නාමා උගත්කු වනතුරු ගුරු ඇසුරෙන් (නිසෙන්) වෙන් වැ සිටි- යහොත් ආපත්ති ය.

**නිසෙන් මිදෙන භික්ෂුවගේ උගත්කම.**

භික්ෂු භික්ෂුණී ප්‍රාතිමොක්ෂ දෙක ප්‍රගුණ කොට කටපාඩම් කළ යුතු ය. සූත්‍රාන්තයෙන් සතර බණවරක් ද අඞ්කවිඥ මහා රාහුලෝවාද අම්බට්ඨ වැනි සූත්‍රයක් ද සඞ්ඛිත දූත, මඞ්ගල අවමඞ්ගල අවස්ථා පිළිබඳ අනුමෝදනා තුනක් ද පොහෝ පවුරුණු ආදී කම්කම් විනිශ්චය ද අභින්නවය අවසන් කොට සමථ විදර්ශනා කම්ස්ථාන ද උගත යුතු ය. මෙ පමණවත් උගත් කමක් නැති භික්ෂුව සැමද තමන්හට වැඩිමහල්ලකු නැති නම් වයසින් බාලවුව ද උගත් ගුරුවරයකු යටතෙහි විසිය යුතු

"නිශ්‍රය මුක්තක බහුශ්‍රැතයාට සුදුසු බණ සවිසා කොට අසා නිමවා කල් පිරුණු හොත් ගුරුන් විසින් උන්ගේ ධුතාඞ්ග-ධරත්වාදී බොහෝ ගුණ කියා නායක තෙනට පාවාදුන් කල උභය ප්‍රාතිමොක්ෂ, කුදුසික, අභිසඞ්ග්‍රහ, පරිහරණ කාරණ ව්‍යාකරණයෙහි සූත්‍ර ධාතුපාඨ පාඨාවලියෙහි අසම්මූඪව ඉගෙණ වතපොත් දන්කල කඞ්ඛාවිතරණියෙන් තුන් තැනක් හා ඉතිරි සත් පොතින් එකි එකි තැන් පරීක්ෂා ගෙණ නිශ්‍රය මුක්තාඞ්ග වත පොත් ගෙණ මෙසේ ගුණ නුවණ පරීක්ෂා කොට නිශ්‍රය මුක්තක සම්මුති දියයුතු."

මේ ලඞ්කා බුද්ධ ශාසනය රැක ගෙණ ආ මහා විහාර කතිකාවතෙහි (දඹදෙනි කතිකාවත) 13 ඡේදයෙහි නිශ්‍රය මුක්තක බහුශ්‍රැතයා විසින් පිරිය යුතු ග්‍රන්ථ ධුරය දක්වා තිබෙන අයුරැයි. මෙහි ඉතිරි සත් පොත නම්, මූල්සික, කතිකාවත, උභය ප්‍රාතිමොක්ෂය, කුදුසික, ව්‍යාකරණ පොත හා ධාතු පාඨයයි මේ උගත්කම ගමෙහි හෝ අරණ්‍යයෙහි සැම භික්ෂුවක් ම ලබාගත යුතු ය මෙය මූලික ඉගෙණීමයි. ග්‍රන්ථ ධුරය නොවේ. මෙයට වඩා ඉගෙණීමට ශක්තිය නැත්-නම් ඔහු අරණ්‍යගතව හෝ විහාරස්ථානයක හෝ තමන්ගේ ප්‍රධානත්වයෙන් සිට මහණ දම් පිරීමට ඉඩ ලබයි නියම ග්‍රන්ථධුරය නම්- "පරිසුපට්ඨාක බහුශ්‍රැත භික්ෂුවක් වීම යි ඉගැන්වීම්, අවවාද දීම් උපසම්පදා දී විනය කම් කිරීමාදී භික්ෂු පිරිසක් හික්මවන ආචාර්ය භික්ෂුව පරිෂදුපස්ථායක බහුශ්‍රැතයා යි.

**ශිෂ්‍යගේ උගත්කම.**

පිරිස අභිවිනයෙහි හා අභිධර්මයෙහි හික්මවීම සඳහා භික්ෂු භික්ෂුණී විභඞ්ග ප්‍රගුණ කොට වාචොද්ගත කළයුතු. කර්මාකර්ම කඳුවත් යනුවෙන් චුල්ලවග්ග මහාවග්ග විනය පොත් ද මජ්ඣිම භාණකනම් මූලපණ්ණාසකාදි වශයෙන් නියමිත ධර්මස්කන්ධය ද ඇතිකරගත යුතු යි.

මෙබඳු ත්‍රිපිටකයෙහි සකල දැනුමක් ඇති දිසාපාමොක්ඛ ආචාර්ය භික්ෂුව විසින් පිරිස හැසිර වීමට- ඉගැන්වීමට කැමති අයුරින් ඉඩ ලබයි. මේ උගත්කම සම්පූර්ණ වුව ද උපසම්පත්තියෙන් දසවස් නො ඉක්මවූවෙකුට මහණ කිරීම හා සාමණේර උපස්ථානාදිය සම්පූර්ණයෙන් තහනම් ය.

**මහා විහාර කතිකාවතෙහි ද.**

“ප්‍රතිපත්තිසම්පන්න බාහුශ්‍රැත්‍යයෙන් සම්පන්න වූ විසුව- හොත් උන් ගේ ධුතාඞ්ග ධර්මාදී බොහෝ ගුණ නිසා ගුරුන් විසින් භාෂක තෙතට පාවාදුන් කළ යටත් පිරසෙයින් තෙර බණ සටිත කොට අසාතිම් පස්වනු හවුරුදු යට ත් උභය ප්‍රාතිමොක්ෂාදි විනපොත් ගෙණ පරිජ් පචිති දෙපොත්න් තුන් තුන් තැන හා ඉතිරි පස් පොතින් එකි එකි තැන් පරීක්ෂා- ගෙණ ස්ථවිරාඞ්ග වන පොත් ගෙණ මෙසේ ගුණ නුවණ බලා ස්ථවිර සම්මුති දී ගණ පරිහරණයෙහි යොග්‍ය වුවහොත් ගණ පාවාදිය යුතු. මෙහි පරිජ් පචිති යනුවෙන් උභතො විභඞ්ගය ගැණේ. ඉතිරි පස් පොත නම් පස් මහ සඟිය හෝ යට කියන ලද බුද්ධසික්ඛා ආදී ග්‍රන්ථයෝ යි. ස්ථවිරාඞ්ග නම් “අපසමෙවන සීලක්ඛන්ධෙන සමන්නාගතො” යනාදීන් විනයෙහි දෙසූ ස්ථවිර භාවයට සුදුසු ධර්ම යි. භික්ෂුණීන්ට අවවාද දීමට සම්මත කළ යුතු භික්ෂුව “භික්ඛුනොවාදක” බහුශ්‍රැතයා ය. ඔහු නම් ත්‍රිපිටකධාරි විසිපස් හෝ එයට වැඩි මහලු වූ මහාස්ථවිර උතුමෙකි.

මෙසින් ශාසනික ග්‍රන්ථ ධුරය කුමක් දැයි මනාසේ පැහැදිළිය. පිරිස් හික්මවීමේ ස්ථවිර සම්මුතිය ලබන බහු- ශ්‍රැතයාත් භික්ඛුනොවාදක බහුශ්‍රැතයාත් ග්‍රන්ථධුරයෙහි වැඩිපුර යෙදුනද විවේකවත් සපයා භාවනාවෙහ යෙදීම

අවශ්‍යයෙන් කළ යුත්තකි. නියමිත ශාසනික උගත්කමින් තොර භික්ෂූන් ඉංගලීසි ආදී බාහිර භාෂා ඉගෙණීමෙන් සසුනට අවැඩක් විය හැකි වුව ද නියමිත ශාසනික ඉගෙණීම නිත්මීම ලැබූ භික්ෂූන් නිවැරදි භාෂා ශාස්ත්‍ර ඉගෙණීම සඳහා දියුණුවට හේතුවේම ය. එබඳු භික්ෂූන් අතින් සිදුවිය යුතු ධර්ම ඉගැන්-වීම, ධර්මප්‍රචාරය, සමාජසේවය, සසුනටත් රටටත් අතිශයින් හිතකරය. ග්‍රන්ථධුරයෙහි යෙදෙමුයි විනය නීති කැඩීමට කෙසේවත් අවසර දී නැත. ග්‍රන්ථ ධුරික හෝ විදර්ශනා ධුරික වේවා භික්ෂුව නම් එකසේම විය යුතුයි. තවද ශ්‍රද්ධාධුර, ශීලධුර, ප්‍රඥාධුර යැයි ධුරත්‍රයක් ජාතක දෙශනාහි එයි. ලෝකෝත්තර මාර්ග ඵල ලාභිහු ශ්‍රද්ධාව හෝ ප්‍රඥාව ධුරකොට ගන්නා බැවින් අභිධර්මයෙහි එන්නේ ශ්‍රද්ධාධුර ප්‍රඥාධුර පමණෙකි. බුද්ධ ධර්මයෙහි ශ්‍රෙෂ්ඨ ධුරයෝ නම් මේ දෙක ය. එහෙයින් උසස්ම මහණකම සමථ විපස්සනාවන්හි යෙදී ශ්‍රද්ධා ප්‍රඥා ධුර ධාරීවීම ය.

මෙසේත් මහණකම නම් වැඩකට නැති එකක් නොව වැඩක් ඇති එකක් මය. එසේ වුව මොන මොන හේතුන් නිසා හෝ මේවා ස්වාක්ඛාත ශාසනයෙහි දුරාජීව දුෂ්ප්‍රති-පත්තින්හි යෙදෙන ප්‍රව්‍රජිතයා මෙලොවත් පරලොවත් දුකසේම වසන්නෙකි.

**''සතවස්සාපි පබ්බජ්ජා – සික්ඛමානා පිටකත්තයං**
**බුද්ධං නානුවත්තෙන්තො – නිරයං සොපපජ්ජති''**

පැවිද්දෙත් සියක් හවුරුදු ගිය ද පිටකත්‍රය උගත්තේ ද බුද්ධාවවාදයට නො වැටේ නම් හෙවත් ශීලාදි ප්‍රතිපත්ති නො රකී නම් ඔහු අපායෙහි උපදියි.

**විනයානුකූල මහණකම.**

අද භික්ෂු සමාජය සමොහද බවට පත්ව සිටී. කලවම් වී තිබේ. ඉබේ සසුනට ඇතුළත්වූ රහතුන් ගේ වත් නො තිබුණු බාහිර සංවරයකින් අඩු පෘථග්ජන බෞද්ධයන් රවටන්නවුන් ගෙන් හා ශාසනික ශ්‍රමණ වූ මනා ගුරු ඇසුර නො ලද කිසිම සංවරයක් නැති පැවිද්දන් ගෙන් ද භික්ෂු සමාජය කිළුටු වී තිබේ. එහෙයින් නියම භික්ෂුව කවුදැයි

හඳුනා ගැණීමට ලූවහල් වන පරිදි මැදුම් පිළිවෙතින් විනයානුකූල මහණකම් පැහැදිලි කරමි.

**භික්ෂුවගේ හිස.**

**"න භික්ඛවෙ දීඝා කෙසා ධාරෙතබ්බා, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවෙ ද්විමාසිකං වා ද්වඞ්ගුලකං වා"**

මහණෙනි, දික්කෙස් නො දැරිය යුතු. යමෙක් දරා නම් දුකුළා ඇවැති. කාල වශයෙන් දෙමසක් ද ප්‍රමාණ වශයෙන් දෑඟුලක් ද අනුදනිමි.

මේ ශික්ෂාපදයෙන් දෙමසක් හිස නො බා සිටිය හැක. එහෙත් දෙමසට පෙර දෑඟුලක් දික් වී නම් වහාම බෑ යුතුය. දෙමසක් ගිය කල දෑඟුලක් දික් නො වූවද හිස බෑ යුතු. උඩත් පිරිසෙයින් මෙම සීමාවන් දක්වන ලදී. එහෙයින් දෙමසක් ඇතුළත දෑඟුලකට වැඩිවන්නට පෙර පළිබෝධයක් ලෙස හැඟෙන විට හිස බා පිරිසිදු විය යුතුය.

**"න භික්ඛවෙ කොච්ඡෙන කෙසා ඔසණ්හෙතබ්බා"** මහණෙනි, බුරුසුවෙන් හිස නො පීරිය යුතුය. පනාවලින් හිස නො පීරිය යුතු. සකස් නො කළ යුතු. අත ඇඟිලි පනා මෙන් කොට නො පිරිය යුතු. මී ඉටි ආදිය දමා සන කළ තෙල් වලින් – ක්‍රීම් වලින් හිස සකස් නො කළ යුතු. දුකුළා ඇවැති.

**"අනුජානාමි භික්ඛවෙ ඛුරං"** මහණෙනි, දැලිපිහිය – සියලු ක්ෂුරභාණ්ඩ අනුදනිමි.

**බෑම කැපීම**

හිසකෙසට ඉතා කිට්ටුව පිහිටි ඇති බෑම කැපිය යුතු හෝ නො කැපිය යුතුයයි විනයෙහි දක්වා නැත.

**"කෙස මස්සුං ඔහාරෙත්වා"** යනුවෙන් හිස රවුළු බා පැවිදිකළ යුතු බව නියමකර වදාළසේක. "මස්සු" නම් යටි රවුළයි. එයින්ම උඩු රවුළ හෙවත් "දාඨිකා" දැළි රැවුළ ද ගන්නා ලැබේ. එසේම

**"න භික්ඛවෙ දාඨිකා ඨපෙතබ්බා"** යනුවෙන් දැළි රවුළු නො තැබිය යුතු බවද නියම කළහ. **"න භික්ඛවෙ දීඝං නාසිකලොමං ධාරෙතබ්බං"** මහණෙනි, දික් නැහැ ලොම් නො දැරිය යුතු. **"න භික්ඛවෙ පලිතං ගාහාපෙතබ්බං"** මහණෙනි, නර හෙවත් පැසුණු කෙස් නො ගැලවිය යුතු.

විනය අටුවාවෙහි = **"එසථ යං හමුකාය වා නලාටෙ වා දාඨිකාය වා උග්ගන්ත්වා විභච්ඡං ඨිතං තාදිසං ලොමං පලිතං වා අපලිතං වා ගාහාපෙතුං වට්ටති"** බැමෙහි නළලෙහි හෝ දැළි රවුළෙහි පිළිකුල් කිහිසුණු අයුරින් පිහිටි පැසුණු නො පැසුණු ලොම් අස්කරණු වටී. මෙයින් රළු පරළු පිළිකුල් අයුරු පිහිටි බැම ද ගා දැමිය යුතු බව පෙණේ. එබඳු ඇහි බැම තබා ගැනීම දුකුළාය.

මෙබඳු තැන් විනයේ මහා ප්‍රදේශ අනුව සැලකිමේදී,

**"යං භික්ඛවෙ මයා ඉදං න කප්පතීති අප්පටික්ඛිත්තං තං චෙ කප්පියං අනුලොමෙති, අකප්පියං පටිබාහති, තං වො කප්පති."**

මහණෙනි, මවිසින් යමක් නො සැපයයි ප්‍රතික්‍ෂෙප නො කරණ ලදද ද, එය ඉදින් සැපයට අනුලොම් වේ ද අකැප දෙසින් දුරුවේ ද, එය නුඹලාට කැප ය. ආබාධයක් නො මැතිව ගලවළුයෙන් පහළ ලොම් හැරවීම ආපත්ති කරය. උඩ අනාපත්ති ය. මෙසේ කැප වූ නියමයන්ට අනුලොම් වැ පවතින හෙයින් හා අකැප නියමයට විරුද්ධ හෙයින් බැම කැපීම නිවරද බව පිළිගත යුතු ය.

යෝනකාදීහු බැම නොගාති. එය ගිහි ආකල්පයෙකි. මෙසේ බැම ගැම **"අඤ්ඤථ, මෙ ආකප්පො කරණීයො"** යන සූත්‍රාන්තයට ද එකඟ ය. බුදුරදුන් බැම තිබුණු බව සත්‍යයෙකි. බුදුරදුන් හිස හා රවුල් කිසිදිනෙක නො බෑ හෙයින් බුදුන් සම්කර සිකපද සෑම තන්හි ගැණීම නුසුදුසු ය.

## රැවුල බෑම

**"න භික්ඛවෙ මස්සු කප්පාපෙතබ්බං"** මෙයින් හිස තිබිය දී රැවුළ බෑමත් රැවුළ ඉතිරිකොට හිස පමණක් බෑමත්

නො කට යුතු බව නියම කළහ. ආබාධයක් නම් කතුරෙන් හිස බෑමට නියම ය.

හිස සල සලා ලග්නා අවසින් පිට නොයා යුතු ය. ආදී කාරුණු මතු විස්තර වේ. දත් මැද්ද යුතු ය. අගල් සතර-වත් අටවත් අතර දැහැටිවලින් ය. ආබාධයක් නො මැති ව මුහුණෙහි සුවඳ ආලේප නො කළ යුතු ය. මුහුණ නො පිරි-මැදිය යුතු ය. දික් නිය නො දැරිය යුතු ය. ඇඟිලි අග මස් ප්‍රමාණයෙන් දික් නිය කැපිය යුතු ය. නියපොතු ඔප මට්ටම් නො කළ යුතු ය. මේ සැම තන්හි දුකුළා ආපත්තිය.

**විනයො නාම සාසනස්ස ආයු.**

**විනය නම් ශාසනයාගේ ආයුෂය යි.**

**භික්ෂු චීවරය**

ශ්‍රමණ ලිඞ්ගය හෙවත් භික්ෂුව හඳුනා ගැනීමේ ප්‍රධාන ලක්ෂණය චීවරය යි. සිවුර යි. එනම් රෙදි කැබලි එක්-කොට විනයානුකූල ලෙස තනාගත්, පංචකර්මයකින් සම්පූර්ණ වූ, සසරින් මිදෙන්නට - ලෞකික දෙයෙහි නො බැඳෙන බව ප්‍රකට වන්නට, පිළිසෙල වූ භික්ෂුව ගේ ඇඳුම යි.

පංචකර්මය නම් -

1 **ධොවනං** – සේදීම ය,
2 **ඡෙදනං** – කඩ කැපීම ය,
3 **සිබ්බනං** – මැසීම ය,
4 **රජනං** – කැප පරිදි පඬු පෙවීම ය,
5 **කප්පකරණං** – කප් බිඳු තැබීම ය,

තවද **"පුබ්බකරණං පඤ්චහි ධම්මෙහි සඞ්ගහිතං ධොවනෙන - විචාරණෙන - ඡෙදනෙන - බන්ධනෙන - සිබ්බනෙන - රජනෙන - කප්පකරණෙන -"** යන මෙහි විචාරණය - ඡේදනයෙහි ද - බන්ධනය - සිබ්බනයෙහි ද වැටේ.

**කඩ කැපීම**

දිනක් දක්ෂිණාගිරි ජනපදය බලා චාරිකාවෙහි වඩනා බුදුරජාණන් වහන්සේ සිවුරක් දිගැස්කොට මියරවල් දමා මනාකොට ලියදු තනන ලද මගධ කෙත දැක **"උස්සහසි ත්වං**

**ආනන්ද භික්ඛූනං එවරූපානි චීවරානි සංවිදහිතුං",** ආනන්දය, භික්ෂූන්ට මේ මගධ වෙල්යාය වැනි සිවුරු සංවිධානය කරන්ට හැක්කේදැයි විචාළහ.

අනඳ හිමියෝ නුවා අතු දික් අතු ඇල අතු ආදී මනා කොට කඩ කපා මසා සිවුරු කර බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශංසා ලැබූහ.

**"අනුජානාමි භික්ඛවෙ ඡින්නකං, සඞ්ඝාටිං ඡින්නකං උත්තරාසංගං, ඡින්නකං අන්තරවාසකං"** මහණෙනි, කපා මසනලද දෙපට තනිපට හා අඳන සිවුරු අනුදැන වදරමි.

**තුන් සිවුර**

බුදුරජාණන් වහන්සේ, රජගහ නුවර සිට විශාලා මහනුවර බලා වඩිද්දී, භික්ෂූහු බොහෝ සිවුරු පොදි හිසෙන් කරෙන් හා පිටේත් ගෙනයති. **"අතිලහුං ඛො ඉමෙ මොඝ පුරිසා චීවර බාහුල්ලාය ආවත්තා"** මේ මෝඩයෝ ඉතා ඉක්මනින් සිවුරු බොහෝ රැස්කිරීමට පැමිණියාහුය යි භික්ෂූන්ට සිවුරු පිළිබඳ සීමාවක් තබන්නේ නම් මැනවැයි සිතා එම ශීත සෘතුවෙහි නවම් මැදින් දෙමස අතර හිම වැටෙන කාලයෙහි රාත්‍රියෙහි අභ්‍යවකාශයෙහි එක චීවරිකව සිටි සේක. බුදුරජාණන් වහන්සේට ශීතයක් නො විය. ප්‍රථම යාමය ඉක්මුණු කල්හි සීත විය. දෙවෙනි සිවුරක් පෙරවූ සේක. එවිට සීත දුරුවිය. මධ්‍යම යාමය ඉක්මුණු කල්හි සීත විය. එකල්හි තුන් සිවුරක් පෙරවිය. සීත දුරු විය. පැසුළුයම ගෙවුණු කල්හි අරුණ නැගී එන මද අඳුරු ඇතිවේලෙහි භාග්‍යවතුන් වහන්සේට සීත විය. සිවුවැනි සිවුරක් පෙරවිය. භාග්‍යවතුන් වහන්සේට සීත නො විය.

මේ ශාසනයෙහි මහණ වූ සීතල බොහෝ කොට ඇති ශීතභීරුක වූ කුලපුත්‍රයන්ට යැපීමට තුන් සිවුර ප්‍රමාණවත් යැයි **"අනුජානාමි භික්ඛවෙ තිචීවරං"** මහණෙනි, තුන් සිවුර අනුදනිමි. දිවිගුණ වූ සංඝාටියත්, එකපට වූ උත්තරාසඞ්ගය හා අන්තරවාසකයත් යන තුන් සිවුර අනුදැන වදාළසේක.

එකල සවග භික්ෂූහු එක තුන් සිවුරකින් අරමෙහි වසත්. අතික් තුන් සිවුරකින් පිඩුසිඟා යෙති, එ සඳ "න භික්ඛවෙ

**අතිරේකං චීවරං ධාරේතබ්බං"** මහණෙනි, වැඩිපුර සිවුරු නො දැරිය යුතුයයි නියම්කාර වදාළහ.

**රජනය**

කැප වූ පඬු පෙවීම යි. එකල භික්ෂූහු ගොම, තඹවන් මැටි ආදියෙන් සිවුරු රඳත්. සිවුරු දුර්වර්ණ වෙයි. බුදුරදුනට සැළකළහ. **"අනුජානාමි භික්ඛවේ ඡ රජනානි මූල රජනං ඛන්ධ රජනං, තච රජනං පත්ත රජනං, පුප්ඵ රජනං, ඵල රජනං"** (මහාවග්ග 342 පිට)

මහණෙනි, පඬු වර්ග සයක් අනුදැන වදාරමි. කහ හැර සියළුම මුල් වර්ග ද, මදටිය සහ පතඟි (ටිහොල්) හැර සියළු ලී වර්ග, ලොත් සහ කාබොල් පොතු හැර සියළු පොතු වර්ග, අළලි තිළලි-වැලිකසා කොරකසා හැර සියළු කොල වර්ග ද, කැලවතුක් හෙවත් හෙන්දිරික්කා හැර සියළු මල් වර්ග ද, සියළු ගෙඩි වර්ග ද, තම්බා ගත්, කසට පඬු පිණිස වටී. කොස්මුල් අරටු, නුග, කිරිනුග, ආදී කැප වූ පඬු වර්ගයකින් මනාව සිවුරු පඬු පෙවිය යුතුයි. යන්තමට පඬු පොවාගත් සිවුරු නුසුදුසු බව **"නාකම්බල මද්දන මතෙතන"** යනුවෙන් වදාළහ. මේ කැපවූ පඬු පෙවිය යුතු සිවුරු රෙදි වර්ග සයකි. **"අනුජානාමි භික්ඛවේ ඡ චීවරානි, ඛොමං, කප්පාසිකං, කොසෙය්‍යං, සාණං, භඞ්ගං, කම්බලං"** **අනුලෝමානි දුකූලං පට්ටුන්නං සොමාර පට්ටං චීන පට්ටං ඉද්ධිජං දේවදත්තියං** (මහවග 339 පිට) කොමුපිළි. කොසෙය්‍ය නම් පණුවන්ගෙන් ගත් නූල් වලින් වියන ලද පිළි, කපුපිළි, හණ වැහැරි පිළි, කොමු වැහැරි ආදිය එක්කොට සදාගත් පිළි, මිනිස් ලොම් සිහ වලස් ආදීන් ගේ ලොම් හැර ඉතිරි ලොම්වලින් තනාගත් පිළි ද අනුලොම් වශයෙන් දුහුල් වැහැරියෙන් වියාගත් සිවුරු ද, පට්ටුන්න සොමාර චීන යන දෙශවලින් ගෙණා සිවුරු ද, එහි භික්ෂු චීවරය වූ සෘද්ධිමය සිවුරු ද, කප්රුක් වලින් හෝ දෙවියන් විසින් දෙනලද සිවුරු ද, යන මේවා අනුලෝම සිවුරු රෙදියි.

**සිවුරෙහි වර්ණය**

**"න භික්ඛවේ සබ්බනීලකානි චීවරානි, ධාරේතබ්බානි, න සබ්බපීතකානි, න සබ්බලොහිතකානි,**

**න සබ්බමඤ්ජෙට්ඨකානි, න සබ්බකණ්හානි, න සබ්බමහා-රඞ්ගරත්තානි, න සබ්බමහානාමරත්තානි, චීවරානි ධාරෙතබ්බානි.**"

මහණෙනි, සියල්ල නිල් වූ හෙවත් ගිනිහිරි (උම්මාපුප්ඵ) වර්ණවූ ද සියල්ල රන්වන්වූ කිණිහිරි මල් වැනිවූ ද සියල්ල කළු වූ (අද්දාරිට්ඨක) අමුපෙනෙල ඇට වැනි පැහැ ඇත්තාවූ ද පත්හැයත් පිට වැනි වර්ණවූ ද සම්භින්න වර්ණ වූ හෙවත් ඉදුනු කොළයක වර්ණ වැනි වූ ද මේ සියළු පැහැති සිවුරු දැරීමෙන් දුකුළා ය. මේ පැහැයන්ගෙන් වෙනස් වූ පැහැයක් ඇති සිවුරු දැරිය යුතු ය. බොහෝ සෙයින් පීතවර්ණ වූ හෙවත් කහපාටින් යුක්ත වූ අනැප පඬු පෙවූ සිවුරු ද අලඞ්කාරය පිණිස දැරීම නුසුදුසු බව මෙයින් මනාව පැහැදිලි ය. කසාවත යනු කහපාට රෙද්දයැ යි ඇතැමෙක් සඳකති. කාෂවලට පාලියෙන් හලිද්දියැ යි කියති. හලිද්දිරාග යනු කහපාටින් පෙවූ යන තේරුම යි. හලිද්දිරාග වස්ත්‍රයැ යි සිවුරට නොතනතාවත් කීයා නැත. කසාවත යනු මූලින් කියනලද, හැප මූල් අරටු පොතු කොල මල් ගෙඩි ආදියක් තම්බා ලබාගත් කසට වර්ණ පෙවූ සිවුරු ය. පහසුවත් ලක්ෂණයත් සලකා මෙකල නියම භික්ෂුවර්ණයෙන් තුරන්වැ සිටිනු දැක්ම සාසන මාමක සැදැහැවතුන් ගේ සංවේගයට හේතු ය. දවසට දෙවරක් සිහිකරන්නට මහා-විහාර කතිකාවතේ ද බුදුරදුන් නිතර මෙනෙහි කිරීමට ද නියමකර වදාළ දසධම්ම සූත්‍රයෙහි "**වෙවණ්ණියම්හි අජ්ඣුපගතොති**" **පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං**" යන්න බාහිරාලංකාර ගරුක භික්ෂූහු කෙසේ සිතත් ද? අනැප සිවුරු දරන්නාහට චීවර පරිභොගයක් පාසා- පෙරවීමක් පාසා සවර්ගී මොක්ෂ ආවරණ කරන ආපත්ති ය. දුක්කට ය.

**සිවුරෙහි ප්‍රමාණය**

"**යො පන භික්ඛු සුගතචීවරප්පමාණං චීවරං කාරා-පෙය්‍ය අතිරෙකං වා, ඡෙදනකං පාචිත්තියං, තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ඡ විදත්ථියො ඉදං සුගතස්ස සුගත-චීවරප්පමාණං.**" (පාචිත්තිය පාළි) යම් සමණෙක් බුදුසිවුර පමණ වූ එයට වඩා විශාල වූ හෝ සිවුරක් කරයි හෝ

කරවා උ මි එය සිඳ දැමිය යුතු. සිඳ දමා දෙසිය යුතු. ඇවතකට පැමිණේ. "**කුසලචිත්තං පාතෙතීති පාචිත්තියං**" කුසල් සිත හෙළානුයි පාචිත්ති නම්. එයින් යුතු වීනම්, දෙව් සැප තිවන් සැප, වැළකේ. බුදුසිවුරෙහි දිග බුදුරදුන් වියතින් වියත් නවයකි. සරසින් එම සුගත් වියත් සයකි.

**සුගත් වියත**

**සුගත විදත්ථි නාම ඉදානි මජ්ඣිම පුරිසස්ස තිස්සො විදත්ථියො වඩ්ඪකී හත්ථෙන දියඩ්ඪො හත්ථො හොති**" (සමන්ත පාසාදිකා 3.9.) සුගත් වියත නම් දැන් මැදුම් පුරුෂයෙකුගේ තුන් වියතකි. එය වඩුරියන් එක හමාරක් වෙයි.

"**තං පන වඩ්ඪකී හත්ථෙන දීඝසො තෙරස හත්ථා, එකාව විදත්ථි, තිරියතො නවහත්ථා, හොන්ති.**" යන කුදුසික ටීකායි. සුගත් සිවුර වනාහි දිගින් වඩු රියනින් දහතුන් (13) රියනක් සහ වියතකි සරසින් නවරියනකි. මැදුම් පුරුෂයාගේ වියත් විසිහතක් රියන් (13) දහතුනකුත් වියතකි. මේ ගණන් දෙකම එක සමාණය. එහෙයින් උඩත් පිරිසෙයින් රියන් දහතුනකුත්, වියතක් දිග, නුවූ නව රියනක් පළල, නුවූ සිවුර කැපය. මේ දෙපට සිවුරත් තනිපට සිවුරත් පිළිබඳව ය. "**ලාමක පරිච්ඡෙදෙන සංඝාටියා උත්තරාසංගස්ස ච දීඝසො මුට්ඨි පංචකං තිරියං මුට්ඨිත්තිකං පමාණං වට්ටති. අන්තරවාසකො දීඝසො මුට්ඨි පඤ්චකො තිරියං ද්විහත්ථොපි වට්ටති**" (337 විනය අටුවාව) යටත් පිරිසෙයින් දෙපට තනිපට සිවුරු දිගින් මිටි පස් රියනක් ද සරසින් දෙ රියනක් ද වේ. මෙහි අඳනය ද උස මිටි තුන් රියන් ගතයුතු වුවද දෙ රියනෙනුත් එය පිරිමසා ගත හැකි බවය පෙනෙන්නේ. දෙ රියන මිටි තුන් රියනට අඩු අඟල් සතරක් පමණකි. එහෙයින් අඳනයද මිටි තුන් රියනක් ගත වරද නොවේ.

මේ පාඨයෙහි "ද්විහත්ථො," "පි" යන 'පි' ශබ්ද ග්‍රහණයෙන් "මුට්ඨිත්තිකං" යන්න සංග්‍රහ කළ බව පෙනේ. සුගත් සිවුරට වඩා විශාල වූ හෝ මේ තුන් සිවුරෙහි ලාමක පරිච්ඡේදයට වඩා කුඩා වූ හෝ නම් පරික්ඛාරචෝළ නාමයෙන් මිස චීවර වශයෙන් නො ඉටිය යුතු යනු ගම්‍යමානාර්ථ යි.

මේ විනය මග අටුවා නියමයෙන් තුන් සිවුරු වශයෙන් අධිෂ්ඨානයට සුදුසු ඉතාම කුඩා සිවුරයි. සුගත් සිවුරත් මේ ප්‍රමාණයත් අතර කැමැති පමණකට සිවුරු උස පළල වුව නිවැරදි බව මෙයින් තේරුම් ගතයුතු ය. මෙහි මිටි පස්රියන නම් සතර රියනක් ගෙණ පස්වැනිව මිටි රියනක් ගැනීමයි. එයට හේතුව නම් මිටිරියන මැණීමේ ක්‍රමයක් නොවන බවයි. කල්පනා කළයුතුව ඇත්තේ, එසේ ශබ්ද අනාපත්තිය. මිටිරියන (තම අතින්) ගත වරද නොවේ.

**සිවුරු පෙරවීම**

මේ වනාහි මහාපඬිවරුන් අතර මහාවාද පහළ කළ ප්‍රශ්නයෙකි. එහෙත් ලංකාවේ තවම දෙවිදියක පෙරවුම් දක්නා ලැබේ. අපට ඔනැකරන්නේ විවාදයට බැසීම නොව, සැදැහැයෙන් සසුන්ගත වූවෙකුට, බුදුරදුන් දෙසූ අයුරු සිවුරු හැඳීම පෙරවීම තේරුම් ගෙණ එම විනය නීතිය රැක මහණකම සඵලකරගන්නා අයුරු පැහැදිලි කරගැනීම යි. සිවුරු හැඳීම නම් **"පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා" පරිමණ්ඩලං නිවාසෙතබ්බං නාභිමණ්ඩලං ජානුමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන."** මේ බුදුවදනුයි. හාත්පසින් වටකොට පෙරපසින් හෝ පසුපසින් නො-එල්වෙන සේ නාභියත් දෙදනත් වසා හැන්ද යුතුයි. මෙසේ අඳනය නො අඳිතොත් දුකුළා ය. නන්පට දෙපට සිවුරු පොරෝනා සිවුරු ය. ඡබ්බග්ගිය භික්ෂූන් ඉස්සරහිනුත් පස්සෙනුත් එල්බෙන්නට සිවුරු පෙරවූ. වස්තුවෙහි **"පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා"** යන ශික්ෂාපදය නියම කර වදාළහ. හාත්පසින් වටකොට පෙරවම් යි හික්මිය යුතු යි. **"පරිමණ්ඩලං පාරුපිතබ්බං උභොකොණෙ සමං කත්වා පාරුපන්තෙන."** දෙකොන් සමකොට පෙරවන්නහු විසින් මනාව වටකොට පෙරවිය යුතු යි. මේ පරිමණ්ඩල ශබ්දය පෙළෙහි තේරූ අයුරු යි. මේ ශික්ෂාපදය වදාළේ විහාරයෙහිදී ත් යම්කිසි කරුණකට වාසුපගත වීමේ දී, ගමෙහිදී ත් පිළිපැදීමට යි ගමෙහි නැවතුන තැන ද ආරාම සංඛ්‍යාවට ය යි. **"න යිමං විහාරෙපි අන්තරඝරෙපි පරිමණ්ඩලමෙව නිවාසෙතබ්බඤ්ච පාරුපිතබ්බඤ්ච"**

යනුවෙන් විනය මහඅටුවාහි කියන ලදී. එහෙයින් මේ පරිමණ්ඩල පාරුපනය විහාරයට ආරාමයට නියමිත එකාංශ පාරුපනය යි. "උභෝ කොණෙ සමං කත්වා" දෙකොන් සම කිරීම නම් සිවුරෙහි කොන් සතරෙහි. එකාංශ කොට පොරවන විට දෙකොණෙක් ශරීරයේ වම් උරහිසට මතුයෙන් දැමිය යුතු ය දෙකොණක් පහත්ව එල්බ පිඩුමස (බත්-කොණ්ඩ) දක්වා වැටිය යුතු ය. මෙහි පරිමණ්ඩල ලක්ෂණය බිඳෙන්නේ උඩ දෙකොණ නො සම්වීමෙන් නොව, බත්-කොණ්ඩ දක්වා පහතට වැටෙන සිවුරු කොන් නො සමවීමෙනි. ඉස්සරහින් හෝ පස්සෙන් එක කොණක් වැඩිපුර පහත් වීමෙන් සිවුර බිම ඇතිල්ලීම් ආදියෙන් විනාශයට පැමිණීම ත් සංපුන් ආකල්පයට නො ගැලපීම ත් හෙයිනි. සකස් කොට පෙරවීමේදී උඩ දෙකොණ සම්ව ගැණීමෙන් යට දෙකොණ ද සමව සිටින හෙයින් උඩ දෙකොණ සම්ව ගෙණ හකුලා පෙරවිය යුතු යි සමංකත්වා යන පූර්වක්‍රියා පදයෙන් සිවුර පෙරවූ පසු පෙණෙන ලක්ෂණ-යක් නොව සිවුර පොරවන අයුරු දැක්වීම යි. "ඇතුපිට ලූ ගොටු සෙයින් දෙකෙලවරින් සම්කොට" යන සිඛවළඳ විනිස පාඨයෙනුදු පෙණියන්නේ නැමී සඳට උඩින් සිවුර දමා දෙකොන් එක්කොට ගෙණ වම් දසරුව මතුයෙන් දමා පහතට හෙළනලද දෙකෙලවර සමකොට පෙරවා ගතයුතු බව යි. මෙහි උඩ දෙකොණ සම්කොට ගෙණ පෙරවීමෙන් පහත දෙකොණ ඉදිරිපස පසු පසින් නො එල්වී සිටින්නේ යි. මේ විහාරයේදී සිවුරු පෙරවිය යුතු අයුරු යි. හෙවත් එකාංශ පාරුපනය යි. මේ පරිමණ්ඩල පාරුපනය ගම් වදින්නට නො වන බව තේරුම් ගන්විට ප්‍රබල දුර්මතයක් බිඳ හෙළන්නේ ය. "අවට නැත්තා කොට සිවුරු පෙරවී නම් දුකුළා වේ" ඇතුපිටැ ලූ ගොටු සෙයින් දෙකෙලවරින් සමකොට වම්දතින් පත් පිටු බහාලා එක්කෙළවරකින් නො එල්වා අවට ඇතිකොටැ පෙරවිය යුත්තේ යි. යනු සිඛවළඳ විනිස පාඨ යි. මෙයට අවුරුදු දහසකට පෙර සිට මේ පරිමණ්ඩල පාරුපනය කළ අයුරු මේ පාඨයෙන් පැහැදිලි ය. මෙහි පත් පිටු යන්න පිඩුසිහා යැමේදී පාත්‍රය වැසීමට යයි, එකාංස පාරුපනය පිළිගත් ඇතැම් පඬිවරු නොමග ගියහ.

මික්ඛිසාදයත්, මේ පරිමණ්ඩල පාරුපනය ගම්වැදීමට පිඬු-
සිඟා යෑමට තහනම් වෙයිති "පත්පිටු බහාලා" යනු **පිටුබහාලා** යැයි පද වෙන් කොට ගැණීමෙන් සුවිශද වෙයි. එ සමයෙහි වනාහී සවග මහණහු කාය විවෘත කොටගෙණ ගමෙහි යත්. "**සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමි ති සික්ඛා කරණීයා**" සුපිළිසන් වැ හොඳින් ඇඟ වසාගෙණ ඇතුළු ගම් යා යුතුය යි, හික්මිය යුතු යනු තේරුමයි. "**කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති ආපන්ති දුක්කටස්ස**" කය ඇරගෙණ ඇතුළුගමට යෙයි නම් දුකුළා වන බව එයින් කියැවේ. මේ පෙළට අනුව තේරුමයි. කාය නම් ශරීරයයි. කායං විවරිත්වාති කය ඇරගෙන යනු උරහිසත් පපුවත් ඇරගෙණ යැයි විනය මහ අටුවාහි දැක්වේ.

මෙහි උරහිසත් ඇරගෙණ යයි කී විට අනිත් උරහිස වසාගෙණ ගමේ ගිය බව නිතැතින්ම සිඬයි. එකාංශයක් වසා මිස පොරෝනා සිවුර නො දැරිය හැකි හෙයිනි. විහාරයේදී එකාංශයක් වසා සිටින නිසායෙන්ම එක උරයක් වසා ගත් හෙයින්ම පපුවේ වැසෙන්නේ කොටසකි. "**සදෙව-දත්තො දිවා න භුඤ්ජති ති වුත්තෙන රත්තියං භුඤ්ජති ති අත්ථතො ආපන්නමෙව හොති**"

දෙව්දත් දවල් නො වළඳයි. කීකල්හි ඔහු රාත්‍රි වළඳයි. යන්න අර්ථ වශයෙන් කියන ලද්දේ ම වෙයි. එපරිදිම මෙහි උරහිසත් ළයත් විවෘත කොට යනුවෙන් එක උරහිසක් වසාගෙණ ගිය බව සවයං සිඬ යි. එක උරයක් වත් නො වසා සිවුරු පෙරවීමක් නැති හෙයිනි. මෙසේ එකාංශකොට සිවුරු පෙරවා ගම්වැදීම තහනම්. විහාරයේදී හා නවාතැන් ගත් තැන්වලදී පෙරවීමට පරිමණ්ඩල පාරු-පනයත් ගමේදී සුපටිච්ඡන්න පාරුපනයත් නියමකර වදාළ බවත් සුපටිච්ඡන්න පාරුපනය නම් මනාව ශරීරය වැසුණු ලෙස දෙ උරයම වසා පෙරවුණු ලෙස බුදුරදුන් වදහළ පෙළින්ම ඔප්පුවෙයි. දැන් අටුවාව අනුව බලමු නම් '**සුපටිච්ඡන්නො ති න සීසං පාරුපිත්වා අථ ඛො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගීවං පටිච්ඡා-දෙත්වා උභො කණ්ණෙ සමං කත්වා පටිසංහරිත්වා යාව මණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තරඝරෙ ගන්තබ්බං**" (විනය මහ අටුවාව). සුපටිච්ඡන්නෙන යනු හිස සහිතව

පෙරවූයේ නො වෙයි මෙයින් නො වැසෙන සම්පූර්ණ අංගය හිස බව ගම්‍යමාන යි එහෙත් ගැටවටුගත්වා අනුමානානන යෙන්- නුවායෙන් බෙල්ලවසා දෙකොණ සම්කොට හකුලා වම්තෙහි මිණිබහණ දක්වා වසා ඇතුළු ගමෙහි යා යුතුය. සුපටිච්ඡන්නායෙන් ඇතුළු ගමෙහිදීම "**ගලවාටකතො පට්ඨාය පාදෙ විවරිත්වා සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩිකමංසතො පට්ඨාය පාදෙ විවරිත්වා නිසීදිතබ්බං**" (විනය මහඅටුවාව) ගලවළයෙහි පටන් හිසද මිණිබහණෙහි පටන් අත්ද පිඩුම්සෙහි (කෙණ්ඩ) පටන් පාද විවරකොට හින්ද යුතුය මෙයම සිඛවලඳ විනිසයෙහි "ගලවළුදු මිණි-බානුදු පිඩිම්සුදු වැසෙන සේ සිවුරු හැඳ පෙරවැ හුන්නේ සුපිළිසත් නම්" යනුවෙන් කියන ලදී පෙළට හා අටුවා පාඨයට අනුව මහා විහාර වංශික ථෙරපරම්පරාව ගෙණ ආ සුපටිච්ඡන්නය මෙයින් විවරණය වෙයි ඇතුළු ගම් හිඳගෙණ සිටි මහණහු ගේ බෙල්ලෙහි ගලවළවත් දෑතෙහි මිණිබහණුත් දෙපයෙහි පිඩුමසුත් (බත් කෙණ්ඩත්) වැසී ගලවළයෙන් මතු හිසත්, මැණික් ඇටයෙහි සිට දෑතත් දඟඇටයේ සිට දෙපයත් පෙණෙන්නට තිබිය යුතුය. උභයාංශ පාරුපන-යෙන් ගැර මේ අඞගයන් පෙණෙන්නට වෙන ක්‍රමයක් නැත. එහෙයින් පෙළටත් අටුවාවටත් ථෙරවංශික ඇදුරු පරපුර-ටත් අනුව සුපටිච්ඡන්න පාරුපනය නම් උභයාංස පාරුපනය බව මනාව ඔප්පුවෙයි.

**"ගලවාටකතො උද්ධං - සීසං ච මණිබන්ධතො**

**හත්ථෙ පිණ්ඩිකමංසම්හා - හෙට්ඨා පාදෙ උභොපිච**

යනුවෙන් අටුවා පාඨනම ගාථාවට නැගූ විනය විනිශ්චයෙ-හිදු මේ අර්ථයම ප්‍රකට කොට දක්වෙයි. ගලවළයෙන් උඩ හිසද මිණිබහණෙන් හා පිඩුමසින් යට අත් හා පාදයන් දෑසි දෙ වැදූරුම් අඞගයන් විවරකොට අවසෙස සියළු ශරීරය වසා සිටියේ සුපටිච්ඡන්න නම් වේ. මෙහි "**උභො**" යන පදය අතීත් ගාථාව හා සම්බන්ධ හෙයින් "**හෙට්ඨා**" යන්න මණිබන්ධතො යන්න හා සම්බන්ධකොට ගතයුතු බව එම ටීකාවෙහි කී, "**හත්ථෙ පාදෙ**" යනු කර්ම විභක්ති බහුවචන හෙයින් **හත්ථෙ** '**උභො** - **පාදෙ** "**උභො**" යයි කීමෙන්

පුනරුත්දෙස්හි එයි. එක මිනිසෙකුට අත් පා දෙක දෙක මිස වැඩියක් නො මැති හෙයිනි. තවද අටුවා පාඨයම ගාථාවට නැඟීමේදී ගාථායෙහි ඡන්දස රැකිමාදිය පිණිස බාහිර වචන ද යොදන්නට සිදුවෙයි එබඳු තැනෙක ඡන්දස් රැකිමාදී කාරුණු පිණිස එන වචනයක් දුක අටුවා පාඨයට වඩා ඉහළින් සැලකිමට කාරුණු නොවේ. සුප්පටිච්ඡන්නයට පිටින් පටියක් බැඳීම අටුවා නියමයක් කොට ඇතැම් පසිවරු සලකති. එසේ සලකණු ලබන්නේ,

**"ගාමෙ වා හොතු විහාරෙ වා මනුස්සානං පරිවෙස-නට්ඨානං ගච්ඡන්තෙන තිචීවරං පාරුපිත්වා කායබන්ධනං බද්ධමෙව වට්ටති'** යන මහවග හත්තගග වතට ලියූ විනය අටුවා පාඨය වරදවා තේරුම් ගැනීමෙනි. මෙහි තේරුම නම්:- ගම්හි වේවා වෙහෙරෙහි වේවා මිනිසුන් පිරිවිසින (දන් වළඳවන) තැනට යන භික්ෂුව විසින් තුන්සිවුරු පෙරවා කායබන්ධනය බැඳම වටී යනු යි. මේ වතාහි

**"තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණංකත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා"** යන දෙශනා පෙළ කොටියෙන් කීමෙකි. එහි තේරුම තෙමඬුළු (නාභිය දෙදණ) වසා පිරිමඬුළු කොට අඳනය ඇඳ කායබන්ධනය (පටිය) බැඳ තනිපට සඟ දෙපට සිවුරු එක්කොට පෙරවා ගැටවටුගන්වා යා යුතුයි

**"තිචීවරං පාරුපිත්වා කායබන්ධනං බද්ධමෙව වට්ටති"** යන පාඨයෙන් තුන්සිවුරට පිටින් කායබන්ධනය බඳින්ට කී නම් සුත්‍රයට නො ගැලපේ. මෙහි තුන්සිවුරු පෙරවා කී මෙන් එසේම ගතිහොත් අඳනයද හැඳීමක් නොව පෙරවීම විය යුතු ය. අඳනයේ හැඳීම විනා පෙරවීමක් නැත. එහෙයින් මෙහි අඳනය ඇඳ පටිය බැඳ සහළ සිවුරු පොරවන ලද්දේ තුන් සිවුරු පොරවා කායබන්ධනය බඳනා ලද්දේය සි කොටින් කී අයුරුයි "තිචීවරං" යන්නෙහි "ති" යනු අස්කොට දඟවල් සොරකම් කරන්නාක් මෙන් ඇතැමුන් මේ පාළිය යොදා තිබේ. අටුවාවෙහි එන පාඨයම සිඛවලඳ විනිස ජයතිලක සංසකරණයෙහි 60 පිටෙහි

තා මෙවා හොතු විහාරෙවා, මනුස්සානං පරිභෙ‍ාග-
නඞ්ගානං හවජ්ජෙනාන 'ති'චීවරං පාරුපිත්වා කායබන්ධනං
බන්ධමෙව වට්ටන්ති"ති අට්ඨකථායු වුත්තං" යි සඳහන්ව ඇත. "එබැවින් තුන් සිවුරු හැඳ පෙරවැ කාබාත් බැඳ සුපිළිසත්ව අතුරු ඝරෙහි හින්ද යුත්තේ යි." යනුවෙන් පෙළ පාඨයෙහි ත් එහි භාවයෙහි ත් දැක්වෙන "තිචීවරං" යන්න ඇතැමුන් දෙපලකම් "චීවරං" යනුවෙන් වෙනස් කිරීම ශාසනය නැසීමට කළ බරපතල අපරාධයකි. එසේම ඡන්ද-යෙන් අගතියට යාමකි.

මෙහි ලා වාදකිරීමට නොකැමැතියම් හ සත්‍යය සොයා ගැණීමම අපගේ පරමාර්ථය යි. මෙසේ සිඛවළඳ විතිසත් විනය විනිශ්චය ත් සමන්ත පාසාදිකා විනය මහ අටුවාව ත් විනය පාළියත් ගෙණ බලා බැසිය යුතු නිගමනය නම්, "සුත්ත සුත්තානුලොම ආචරියවාද අත්තනොමති" යන සතර අනුව විය යුතු යි. සියල්ලට දුර්වල අත්තනොමතිය ආචාර්‍ය වාදයෙහිත් ආචාර්‍යවාදය සුත්තානුලොමයෙහි ත් එය සූත්‍රයෙහි ත් බහා බැලීමේදී විහාරයේදී පරිමණ්ඩල පාරුපන වශයෙන් එකාංස පාරුපනයත් ගමේදී සුපටිච්ඡන්න පාරුපන වශයෙන් උභයාංසය ත් ආචාර්‍යවාද සූත්‍රානුලොම සූත්‍රයන්හි සමානාර්ථවැ එන්නේ ය. මෙසේ සැදූහැයෙන් සසුන්වත් මහණහු විසින් විහාරයේදී පරිමණ්ඩල පාරුපන වශයෙන් එකාංසයත් ගමෙහිදීත් සුපටිච්ඡන්න පාරුපන වශයෙන් උභයාංසයත් කිරීමෙන් ඇවැත් නොවන බව දතයුතු.

තවද ධර්මාශෝක කාලයේයැ යි පිළිගන්නා දඹදිව සාරානාත්හි ධම්මික ථූපයේ තිබී සොයා ගන්නා ලද ලෝකයේ ඉතා මහඟු පිළිමය දෙවුර වැසූ එකකි. දම්පියා අටුවායේ "එකාකසුනඛ" වැදි කථාවේ ගස උඩ සිටි භික්ෂුවගේ සිවුරු වැද්ද වැසියන පරිදි වැටීමට උභයාංස කොට තිබිය යුතු බව සක්සුදක් සේ පෙණේ. සුදින්න කලන්ද පුතුගේ වස්තුවෙහි විනය මහඅටුවාවෙහි,

"භන්තානන්ති භික්ඛා ගහණත්ථං පත්තං උපනාමය-
න්තො මණිබන්ධතොපභූති දට්ඨනම්පි භන්තානං.[1] යන

පාංශයෙන් පිඩු පිළිගැණීමට පාත්‍රය සිවුරෙන් එළියට ගනු ලබන්නහුගේ මිණිබඟණෙහි පවත් දුතම දසියට පෙණුනු බව කියැවේ. දුහෙහි මිණිබඟණෙහි පවත් පෙනෙන්නට උභයාංශ පාරුපනයක් නොතිබුණා නම් නොහැක්කේම ය. මෙසේ විනය පාළිය එම මහඅටුවාව එහි ටීකා හා ලංකාමහාවිහාර වංශික ඈදුරු පරපුරන් ගමෙහිදී උභයාංශ පාරුපනය සුපටිච්ඡන්න වශයෙන් ගත් බව මහ- දවල් හිරුසේ ප්‍රකට ය. අප්‍රකට ගුසාව මතුකොට බුඩධර්ම විපර්‍ය්‍යාස කිරීම- සාහසිකාව අටුවාපාඨ අකුරු අඩුකොට ලීම බරපතල ශාසනික අපරාධයකි. එකාංශ පාරුපනයට උදාහරණ වශයෙන් ශාසනය පිරිහුණු දෙවෙනි රාජසිංහ රජුකල ලංකාවේ සිටි ගණින්නාන්සේ කෙනෙකු ඇඳ එකල ලක්දිව හිරබාරයේ සිටි නොක්ස් නම් ඉංග්‍රිසි ජාතිකයා ලියූ "නොක්ස්ගේ ඉතිහාසයෙහි ඉතා හොඳ සාක්ෂියක් තිබේ. එම නොක්ස් ගේ ඉතිහාසයෙන් විනා වෙන යමකින් නිසි සාක්ෂියක් එකාංශ පාරුපනයට නො ලැබේ මැ යි. එම ගණින්නාන්සේලාගේ කාලයේ එකස්කොට පෙරවා පටිය ත් බැඳ රැවුලත් වඩා සිටිය බව එම රූපයෙන් පෙණේ. සියම් රටින් උපසමපදව ගෙණා හිමිවරුන් ගේ පෙරවීම එකාංශයට ත් උභයාංශයටත් මැදිව සිටී. එහෙත් දෙඋරය ම වැසෙන හෙයින් එය උභයාංශ පාරුපනයටම බරය. පණ්ඩිත සාමිහෙමම තික්කාඩුඬෙව ශ්‍රී සුමඩගල මාහිමි- යන් වහන්සේට සත්‍යය පිළිගැණීම පිළිබඳව මාගේ නමසකාරය වේවා !

ගමේදී එකාංශ කටයුතු නම් සුපටිච්ඡන්න සිකපදයෙන් වැඩක් ඇත්තේ ම නැත. පරිමණ්ඩල පාරුපනය ම සෑහේ මැයි.

**අනාපත්ති**= පෙරපසු දෙපසින් එල්වෙන බව නො දන හෝ සුපටිච්ඡන්න කරමි යි සිතා වැරදී පොරවන්නහුට ද නො සිහියෙන් සුපටිච්ඡන්න නොකරන්නාහට ද මනාව පාරුපන වත උගත ද සිවුරු පෙරවීමේදී අමතකව සුපටිච්ඡන්නය වැරදුණා හට ද ගිලනුන්ට ද ආපදවන්හිදී ද අනාපත්ති ය. මෙහි යමෙක් උභයාංශ හෝ එකාංශ පාරුපනය මේ නියම සුපටිච්ඡන්නය යි අවබකව තමන් ගේ

5

වැටහිමට අනුව පිළිගණී නම් "**ඵළකධා පරිමණ්ඩලංකෙව නිවාසෙතබ්බං තිචීවරං පරිමණ්ඩලං නිවාසෙතබ්බං අනාපත්ති.**" යන අටුවා පාඨයෙන් අනාපත්ති බව හැගේ. එහෙයින් සිංහල බෞධයා වෙසක් කලාපයෙහ තුන්සිවුරු පිළිබඳ පෙරවීම නො දැන සාපත්තික උභයාංශිකා භික්ෂූහු වනවාසයෙහි හිඳිති" යි අනුන් ගුණ නුරුස්නා ඇතැම් උගතුන් ගේ අභූත දෝෂාරෝපනය අතිශයින් අහෙතුක ය. වනවැසි භික්ෂූහු ආපත්‍යනාපත්ති දන්නා බව මෙයින් තේරුම් ගත යුතු ය.

"**ඉමෙ ද්වෙ භික්ඛවෙ, භික්ඛූ දුග්ගහිතෙහි සුත්තන්තෙහි බ්‍යඤ්ජනපතිරූපකෙහි අධම්මඤ්ච ධම්මඤ්ච පටිබාහන්ති, ඉමෙ භික්ඛවෙ භික්ඛූ බහුජනාහිතාය පටිපන්නා බහුජනා-සුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙව-මනුස්සානං, බහුඤ්ච ඉමෙ භික්ඛවෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති. ඉමෙ චිමං සද්ධම්මං අන්තරධාපෙන්ති.**" (අඞ්ගුත්තර දුකනිපාත.) මහණෙනි, යම් ඒ භික්ෂූහු වරදවා ගන්නා ලද සූත්‍රාන්තයන් කාරණකොට ගෙණ- අර්ථය නොවිමසා අකුරෙහි එල්ලීම කාරණකොට ගෙණ අර්ථයත් ධර්මයත් ප්‍රතිබාහණය (පහකිරිම) කරත්. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ දෙනාට නො සැප පිණිස බොහෝ දෙවි-මිනිසුනට අනර්ථ අහිත දුක් පිණිස පිළිපන්නාහු ය. සෙදූනාහු ය. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ අකුසල් රැස් කරත්. ඔව්හු ද මේ පර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ යන තුන්බුදුසසුන අන්තර්ධාන කරත්.

දැන් හිස බැම මූහුණ හා සිවුරු පෙරවීමෙන් ද අරමෙහි හා ගමෙහි ඉන්නාවිට බුඩපුත්‍ර ශ්‍රමණයන් වහන්සේ හැඳින්-වීම මෙතෙකින් නිමකොට බාහිර වශයෙන් ඔහු විසින් දැරිය යුතු පිරිකර පිළිබඳ වැ සොයා බලමු.

**පාත්‍රය**

"**අනුජානාමි භික්ඛවෙ ද්වෙ පත්තෙ, අයො පත්තං මත්තිකා පත්තන්ති.**" (සුළුවග) මහණෙනි, පාත්‍රා දෙකක් අනුදනිමි. අයස් (යකඩ) පාත්‍රය. මැටි පාත්‍රාය යි. ආහාර ගැණීමත්, ඇඟ වැසීමත්, මනුෂ්‍ය සමාජයට අත්‍යවශ්‍ය ය.

භික්ෂුවට නියමිත අටපිරිකරින් සිවුරු හා පාත්‍රය ප්‍රධාන ය. ගිහි සමාජය නොයෙක් ඇඳුම් අඳිත්. නොයෙක් බඳුන්වල බුදිත්. ඒ ගිහිසමාජයෙන් හාත්පසින් වෙනස් වූ බුද්ධශ්‍රාවක ශ්‍රමණ සමාජයට නියමිත ඇඳුමක් හා අහර වළඳීමට නියමිත භාජනයක් ද තිබිය යුතු ය යි කියන ලද බුදුවදනින් නියමව ඇත්තේ එම භාජනය යි. පාත්‍රා ශබ්දය භාජනාර්ථයෙහි ය. එසේම චීවර ශබ්දය වස්ත්‍රාර්ථයෙහි ය. පාත්‍රය නම් භාජනය යැයි කියා අකැප බඳුන්වල වළඳත් නම්, චීවරය නම් වස්ත්‍රය යි කියා කලිසම් කෝට් රෙදි බැනියන් හැන්ද ද වරද නොවේ. එහෙත් "චීවර" "පාත්‍ර" ශබ්දයන් ශ්‍රමණ වස්ත්‍ර භික්ෂාභාජනයන්හි රූඪිවූ එම වස්තූන්හි ම යෙදෙන ශබ්දය.

යට දක්වන ලද භික්ෂුචීවරය විනයානුකූලවූයේ, තමා විසින් අධිෂ්ඨාන කරණ ලද්දේ නියම ශ්‍රමණවේශය දරා ද, එපරිදිම භික්ෂුව වළඳන- පිඩු සිඟායන භාජනය විනයානුකූල වූයේ අධිෂ්ඨාන කරණ ලද්දේ පිඬුසිඟා යැමෙහිදී ත් ගව්වකින් ඔබ යම්කිසි කටයුත්තකට යැමෙහිදී ත්, පාත්‍රධාරී වූයේ, නියම ශ්‍රමණ වේශය පෙණෙන්නේ ය. අඩුගණනේ රථයකට රෝද දෙකක්වත් තිබිය යුතු ය. "**පත්තචීවර-මාදාය පබ්බජී අනගාරියං.**" පා සිවුරු ගෙණ සසුනෙහි පැවිදි විය. යනාදින් මහණකම නැමැති රියට ද පාසිවුරු නමැති රෝද දෙකක් අවශ්‍යම ය.

"**න භික්ඛවෙ අපත්තකො උපසම්පාදෙතබ්බො යො උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස**"

මහණෙනි, පාත්‍රයක් නැත්තහු උපසම්පදා නො කළ යුතුයි. යමෙක් උපසම්පදා කෙළේ නම්, දුක්කටාපත්තිය. එහෙයින් මෙකල ද උපසම්පදා කරණවිට නම්, තෙරණුන් ගේ පිටේ පාත්‍රයක් බඳිනු ලැබේ. වරදනම් බොහෝ භික්ෂූන්ගේ පිටෙහි නැවත එම පාත්‍රය කිසිදිනෙක නො බැඳෙන එක ය. පාත්‍රයක් නැති දිසිමාගියෙහි යන ශ්‍රමණවේශය අධිශ්‍රමණ වේශයකි.

"පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා-කරණීයා පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා-කරණීයා." තමා අදිටන් කළ පාත්‍රය යන හැඟීම ඇතිව එයින් පිණ්ඩපාතය ආහාරය පිළිගත යුතු ය. තමා ඉටු පාත්‍රය යන හැඟිම ඇතිව එයින් ආහාරය වැළඳිය යුතු ය. තමා අදිටන් කළ පාත්‍රය හැර අතික් පාත්‍රයක් දසදවසක් දැරිය හැකි. අතිරේක පාත්‍රයක් දසදිනකට වඩා දරයි නම් නිසගි පචිති ය. ඒ පාත්‍රය සඟමැදදී අස්කොට වරද සමා-කරවා ගත යුතු ය.

පිහන් ආදී අනිකුත් බඳුනකින් දන් පිළිගැණීමේදී තම පාත්‍රය යන හැඟීම ඇතිවිය නො හැකි. එහෙයින් පාත්‍ර පරිභොගයෙන් තොරව දන් පිළිගැණීමේදී දුක්කටාපත්ති ය. දන් වැළඳිමේදී ද පිහානෙහි වළඳනවිට තම පාත්‍රය යන හැඟීම් ඇති නො වේ. එහෙයින් එසේ නො මැතිව වළඳන පිඩක් පිඩක් පාසා දුකුළා ය.

දුක්කට

"දුට්ඨුකතං දුක්කතං" වරදවා නපුරුකොට කරණලද්දේ දුක්කට ය. පරිවාර පාළියෙහි

"දුක්කටන්ති යං වුත්තං – තං සුණොහි යථා තථං
අපරද්ධං විරද්ධං ච – ඛලිතං යඤ්ච දුක්කටං"

දුක්කටය යි, යමක් කියන ලදද එය මනාකොට අසා-ගන්න, වරදට ගියේ හෝ පාපසඟගත වූයේ, සුඩිය වූ සවගී-මොක්ෂ මාගීයන් වරදවනලද්දේ යම් වරදක් වෙයි ද එය දුක්කට ය.

"සඤ්චිච්ච විතික්කමන්තස්ස අනාදරියෙන දුක්කට දුබ්භාසිතම්පි සග්ගමොක්ඛානං අන්තරායං කරෙන්ති" යනු අටුවා වචනයි. දැන දැන කරණලද යටත්පිරිසෙයින් දුක්කට දුබ්භාසිත ආපත්තිය නමුදු සවගීයට ත් නිවනට ත් අන්තරාය කර ය. මෙයින් තමා දැන කරණලද ඇවැත්, දෙසීමෙන් පිරිසිදු නො වූ, ඉතා අඩුවශයෙන් දුක්කට දුබ්භාසිත ආපත්තියක් නමුදු මරණාසන්නයෙහි සිතට නැගීමෙන්

එකාන්තයෙන් අපායගාමී වන්නේ ය. එබඳු වරදකින් යෝ යුතු වූ මහණහට ධ්‍යාන මාර්ග ඵලාදිය කොහෙත්ම නැත.

**අකැප පාත්‍රා**

**“න භික්ඛවෙ දරුපත්තො ධාරෙතබ්බො.”** මහණෙනි, ලීයෙන් කළ, රනින් රිදියෙන් මැණික් වෛඩූර්‍ය්‍ය පස්ලොහො ඊයම් පළිඟු තඹවලින් කරණලද සියළු ම පාත්‍රා තහනම් ය. මිනී හිස්කබල් කළගෙඩි කටාරම් ආදියේ කැබලි ද, පාත්‍රා වශයෙන් පාවිච්චි කිරීම තහනම් ය. ඉදින් ගිහියෝ රන්තැටි ආදියේ අවුළුපත් දමා දන්වළඳන විට පිළිගන්වතොත් නො-ඇල්විය යුතු යි. කස්ලෝ තැටි පළිඟු තැටි මැටිපිහන් තැටි ආදියෙහි අවුළුපත් දමා දුන හොත් ගිහිත්සතු භාජන වශයෙන් ගෙණ හෝ පුද්ගලික අදහසින් තොරව ගෙණ හෝ වැළඳීම වරද නොවේ. මෙසේ තුන්සිවුර හා පාත්‍රය සැම-විට ම තමා සතුව පැවතිය යුතු අටපිරිකරින් ප්‍රධාන පිරිකර ය.

**කුඩය**

**“අනුජානාමි, භික්ඛවෙ,** ඡත්තං,” කුඩය හෙවත් ඡත්‍රය මහණෙනි, අනුදනිමි. සවග මහනුන් විචාරයක් නො මැතිව කුඩ ඉසලා උයනට ගිය වස්තුවෙහි

කුඩය තහනම්කොට නැවත ගිලන් භික්ෂූන් ගේ වස්තුවෙහි දී **“අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස ඡත්තං”**

“මහණෙනි, ගිලන්හට ඡත්‍රය අනුදනිමි”යි නියම කළ සේක. **“ගිලානස්ස ඡත්තන්ති” “එතථ යස්ස කායෙ දාහො වා පිත්ත කොපො වා හොති චක්ඛු වා දුබ්බලං අඤ්ඤො වා කොචි ආබාධො විනා ඡත්තෙන උප්පජ්ජති තස්ස ගාමෙ වා අරඤ්ඤෙ වා ඡත්තං වට්ටති” වසෙස පන චීවර ගුත්තත්ථං පාලම්බ චොර භයෙසුච අත්තගුත්තත්ථම්පි වට්ටති”** (විනය අටුවාව-)

ගිලන්හට ඡත්‍රය යන මෙහි අර්ථවෙන් යමෙකුගේ ශරීර දාහයක් හෝ පිත්කෝපයක් වෙයිද, ඇස් දුර්වල වීම හෝ

අතික් යම්කිසි ආබාධයක් කුඩය නො ඉසලීමෙන් වෙයි ද ඔහු විසින් ගමෙහි හෝ ආරණ්‍යයෙහි කුඩය පාවිච්චි කළ යුතුය.

වැසි ඇති කල්හි චතාහි සිවුරු ආරක්‍ෂා කර ගැණීමට ද චණ්ඩ වනසතුන් සොර සතුරු ආදි භයක් ඇති වූ කල්හි ආත්මාරක්‍ෂාවටද කුඩ දැරීම සුදුසුය.

**කැපකුඩ**

"ඡත්තං නාම තීණි ඡත්තානි, සෙතච්ඡත්තං කිලඤ්ජ-ච්ඡත්තං පණ්ණච්ඡත්තං මණ්ඩලබද්ධං සලාකාබද්ධං" කුඩ තුන්වගියකි. සුදු කුඩය, හුණබට ඇ පතුරු යෙදූ කුඩය, තල ආදි පත්කුඩය, යනුයි.

බුරුම කුඩය කිලඤ්ජ ඡත්‍ර වෙනුවෙන් ගැණේ. කළුකුඩය නියමකාරණ ලද කුඩවලින් පිටත් වූ කළුකුඩය අශ්‍රාමණික ය. තුදුරු අතීතයේ සිටි **සික්ඛාඩුමෙම සුමංගල** මාහිමියානන් වහන්සේ ආදි උතුමෝ එම කුඩයට පිටින් සුදු රෙද්දක් දම්මවා පාවිච්චි කළබව ප්‍රකට කාරණයකි. එවිට එය කැපබවට පැමිණෙයි.

ඡත්‍ර ධාරණය නම්, කුඩ ඉසලීමයි.

"අනුජානාමි භික්ඛවේ අගිලානෙනාපි ආරාමෙ ආරාමූපචාරෙ ඡත්තං ධාරෙතුං" මිගණෙති, නො ගිලන්හටද අරමෙහි හා අරම අසල කුඩ ඉසලන්ට අනුදනිමි. ගමන් යාමේදී කාලගුණ පිත්තකොප ආදී අවස්ථාවලදි පාවිච්චි කිරීම සඳහා කැපකුඩයක් ගෙනයෑම ශාසනික භික්‍ෂූන්ට සුදුසුය. කුඩ ඉසලාගත් හෝ අතින් ගත් නො ගිලන්හට දම් දෙසීමෙන් ද දුකුලාය.

**සෙරෙජ්ජු**

බිම්සර රජුගේ රටෙහි චම්පානුවර ප්‍රධාන සිටුපුතු සොණකොළිවිසය. කෝටි ගණන් ධනය ඇති ඔහු බොහෝ සැපෙන් වැඩුනේ, ඉතා එපිනා ලොම් පලස් අතුරන ලද බිම අඩිය තබයි. පතුලෙහි ලොමයන් හටගත් බව ප්‍රකට විය. ඉතා සුඛුමාලය. ඔහුගේ ආහාරය එදා දඹදිව තිබුණ උසස්ම

ආහාරය යි. පිරිවර අසූදහසක් සමග ඔහු ගෙන්වා ඔහුගේ පාදයන්හි රෝම දුටු බිම්සර රජ ඔවුනට අවවාද කොට, බුදුරජානන් වහන්සේ දැක බණ අසා යන මෙන් නියම කළේය. සෝණ සපිරිවරින් ගොස් බුදුරදුන් දැක බණ අසා පැහැණ වී, සීතවනයෙහි භාවනානුයෝගීවිය. දැඩි වීර්‍යයක් ගෙණ සක්මන් කෙළේ පතුල් පැලී ලේ ගැලුයේ ය. පසුව බුඩාව වාදයෙහි පිහිටා රහත් වූයෙය.

සිවුමැලි වූ සෝණ ස්වාමිපාදයන්ට "**අනුජානාමිතෙ සෝණ ඒකපලාසිකං උපාහනං**" සෝණ එකපට ඇති පාවහන් පාවිච්චියට අනුදනිමි,යි. බුදුරදුණෝ නියම කළහ.

ස්වාමිනි, ගැල් 160 ක් පුරාලන රත්රන් හා ඇත් අස් ආදී මහත් ධනයක් අත් හැර පැවිදිව එකපට පාවහන් දරණ විට මිනිසුන් මෙපමණ ධනය හැර දැන් සෝණහිමි එක පට වහණකට ආසා කරති යි, කියනු ඇත. එහෙයින් සියළු සංඝයාට වහන් දැරීමට අනුදැන වදාරතොත් මම ද පිළිගන්–නෙමැයි කිය. එකල්හි බුදුපියාණෝ "**අනුජානාමි භික්ඛවෙ ඒකපලාසිකං උපාහනං**"

"මහණෙනි, එක් පට ඇති වහන් අනුදනිමි යි" නියම කළසේක. "උපාහණ, පාදු යන ශබ්දයන් ගෙන් සෙරෙප්පු (වහන්) සහ පාදුකා ශබ්දයන් සපත්තු මරවැඩි ගැණේ. සංක්‍රමණීය පාදුකා සම්පූර්ණයෙන් තහනම් ය.

සියල්ල – නිල්වන් රත්වන් ලේවන් මදටවන් කලුවන් පත්තෑ පිටුවන් ඉදුනු කොළවන් සෙරෙප්පු ද ඒ වර්ණ වූ පටිපමණක් ඇති සෙරෙප්පු ද විළුඹ සහ පිටිපතුල් ද බත්–කොන්ඩේ සිට සියළු පාදය වැසෙන සෙරෙප්පු ද පුළුන් පිරවූ සෙරෙප්පු ද වටුවන් ගේ පියාපත් වැනි විසිතුරු සෙරෙප්පු ද එළු බැටළු අං මෙන් කාර්ණිකා බඳනා ලද ගෝනුසු වලිගා වැනි කාර්ණිකා බඳනා ලද මොණර පිහාටු යෙදූ විසිතුරු සියලු සෙරෙප්පු ද සිංහ ව්‍යාඝ්‍ර දිවි මුව දියබළ හිවල් ලේන් බකමූහුණු යන මොවුන් සම් ලක්ෂණ වීමට වටේට ඇල්ලූ සෙරෙප්පු ද තහනම් ය. ඒවා සිඳ දමා පාට වෙනස් කොට පාවිච්චියට ගත වරද නැත.

දෙපට තුන්පට ඊට වැඩි සම්පටවල් තබා මසනලද සෙරෙප්පු දඹදිව මධ්‍ය දේශයෙහි තහනම් ය.

එහිදු කවුරුවත් පාවිච්චි කළ (ගණඞගණ උපාහණ) කිප පටක් ඇති උපාහණ තහනම් නැත.

ආරාමය, ආරාම උපචාරය, ගිලන්හටත් නොගිලන්හටත් සෙරෙප්පු, කෙබදු සෙරෙප්පු උව වරද නැත.

**"න භික්ඛවෙ සඋපාහනෙන ගාමො පවිසිතබ්බො යො පවිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස."**

මහණෙනි, පාවහන් සහිත වැ ගම් නොවැදිය යුතුයි. ගම් වදිතොත් දුකුළා ය. ගිලන්හු විසින් සෙරෙප්පු දමා ගමෙහි යායුතු ය.

**"ගිලානෙන භික්ඛුනාති, එත්ථ ගිලානො නාමයො නසක්කොති අනුපාහනො ගාමං පවිසතුං"** (යනු අටුවාසි) මෙහි ගිලන් නම්, යමෙකුට පාවහණින් තොරවැ, ගමෙහි යෑම අපහසු ද ඔහු සි.

මෙසේ ගිලන් භික්ෂුවට සැමතැනදීමත් නොගිලන් භික්ෂුවට ආරාම ආරාම උපචාරයෙහිදීත් සෙරෙප්පු පාවිච්චිය නියමිත ය.

තවද මෙහි ගම්වැදීම නම් පිඩු සිඟා යෑම යි.

අද්ධාන මාර්ගයේ වඩින භික්ෂුවට ඉදින් ඉල්වන ලද්දේ නම් සෙරෙප්පු ජෝඩුවක් දිය යුතු බව "අප්පමත්තක විස්සජ්ජක" සම්මුතිය ලත් භික්ෂුවට නියමව ඇත. එසේම ආගන්තුක වතෙහි ආරාමයට ඇතුල්වන භික්ෂුව විසින් පාවහන් මුදා ඇතුල්විය යුතු බව දක්වා ඇත.

මෙසේ පිඬුසිඟා යෑම හැර අනිත් විටෙක දුර ගමන් අඩ යොදුන් (සැ: 3½ ක්) පමණවත් යන විටෙක වහන් පාවිච්චිය අනාපත්තිකර බව සැලකිය හැකිය. අනුන්ගෙන් යමක් ලබා ගැණීමේදී නිහතමානීව යා යුතු හෙයින් පිඬුසිඟා යෑම වහන්දරා කිරීම නුසුදුසු බව සිතිය හැක. විමසත්වා!

**තල්අත්ත**

**"අනුජානාමි භික්ඛවෙ, විධූපනඤ්ච තාලවණ්ටඤ්ච"** මහණෙනි, විජනියත් තල්වැටත් අනුදන වදරමි. විජනි තුන් වගයකි = වැහැරීමය, සැවැන්දරා ආදී මූල් වලින් කරණ ලද (උසිරමය), මොණර පිහාටු වලින් කරණලද විජනි හෙවත් අවාත් තියම්තය. සෙමෙර වල්ගවලින් කරනලද විජනිය තඟනම්ය. මෙකල පවන් අත්ත යනුවෙන් තාල වෘන්තය පාවිච්චි කරණු ලැබේ.

නියම බුඩපුත්‍ර ශ්‍රමණයන් වහන්සේ හඳුනා ගැනීමට බාහිර වශයෙන් මෙළමණකින් හැකිවන්නේය. එනම් යට දක්වන ලද අයුරු විනයානුකූල ලෙස කපා මසා පඬුපොවා ගන්නා ලද තුන්සිවුරු හැඳ පෙරවැ වම් උරයෙන් පාත්‍රය දරාගත් කැපකූඩයකින් හා ගිලන් නම් වහන් සහිත ගම් වැදුණු භික්ෂුවයි. •

නියම මහණුන් වහන්සේ ගේ දූන් අභ්‍යන්තර විනයානුකූල ගුණධර්ම සොයා බැලීමට මත්තෙන් කෙනෙකු හඳුනා ගැනීමට බාහිර වශයෙන් සතර ඉරියව්ව බෙහෙවින් උදව් හෙයින් ඉරියව් පැවැත්මේදී, භික්ෂුව කෙසේ විය යුතු දැයි පැහැදිලි කරමු. ඉරියවු නම් **"ඉරියනා වත්තනා"** යනාදින් දේශනා කර වදාළ, මේ ශරීරය පවත්වා ගන්නා අයුරුයි. ගමනින් හෝ සිටගෙන සිටීමෙන් හෝ ඉඳ ගැනීමෙන් හෝ නිදාගැනීමෙන් කියන මේ සතරා කාරයෙන් ශරීරය පැවැත් විය යුත්ය. එහෙයින් මේ සතරට ඉරියවු යැයි කියනු ලැබේ.

ආරාමයේ දී හා ආරණ්‍යයෙහිදීත් භික්ෂුවට පහසු අයුරු ඉරියව් පැවැත්විය හැක. එහෙත් ගමේ දී **"අප්පසන්නානංවා පසාදාය පසන්නානංවා භිය්‍යොභාවාය"** යනු වදාළ අයුරින් නො පැහැදුණවුන් ගේ පැහැදීමත් පැහැදුණවුන් ගේ ප්‍රසාදය දියුණු වීමත් ඇතිවන අයුරු හැසිරිය යුතුය.

**ගමන**

සුපිළිසන්ව, හෙවත් මනාව ඇඟවසා යට දක්වන ලද උභයාංශ පාරුපනයෙන් යුතුව ගමෙහි යා යුතු. එසේ නො යතොත් දුකුළාය.

අත් පා ක්‍රීඩා කරවමින්, හෙවත් අත් වන වනා පා නටව නටවා නො ගොස් ඉතා සංවරව යා යුතු. ඒ ඒ තැන් බලමින් නො යා යුතු. යට බලා හෙලන ලද ඇස් ඇතිව වියදඬු පමණක් හෙවත් සතර රියන් පමණ දිවෙන දෘෂ්ටියෙන් යුතුව යා යුතු.

අතතුරු උවදුරු ආදී අවස්ථාවක දුර තැන් බලන්ට වටී. එක් පසකින් හෝ දෙ පසකින් හෝ සිවුරු ඔසවා නො යා යුතුය.

මෙහිදී ද

"අතුරු ඝරෙහි එක් දත එව් දෙදත එව් සිවුරු නගාලා යත් හිදුත් නොවටි"

යන සිඛවලඳ විනිස පාඨය ද

**උක්ඛිත්තචීවරො හුත්වාති. කටිතො උද්ධං කාය බන්ධනාදි දස්සනවසෙන උක්ඛිපිතං සඞ්ඝාය ඩුත්තං, පිණ්ඩාය චරතො පත්ත ගහණාදි මත්තස්ස අනුඤ්ඤාත්තත්තා."** සිඛවලඳ විනිසෙන් කියැවෙන්නේ එක් උරහිසකට හෝ දෙවුරහිසට සිවුරු නගා නොයා යුතු බවයි.

**"එකතො වා උභතො වා උක්ඛිත්ත චීවරො හුත්වා"**

එක පැත්තකින් හෝ දෙපැත්තෙන් ඔසවනලද සිවුරු ඇත්තේ යන විනය මහ අටුවා පාඨය විස්තර කළ විමති-විනොදනී ටීකා පාඨයෙන්

"**උක්ඛිත්ත චීවරො හුත්වා**" යනු කටියෙන් උඩ කාය බන්ධනාදිය පෙනෙන්නට සිවුර එසවීම යි. පිණ්ඩපාත යනවිට පාත්‍රය ගැණීමාදි කරුණු නිසා කටිය තෙක් සිවුරු එසවුව වරද නොවේ. යනු යෝරුමයි.

මෙසේ සිවුරු එසවීමට එකස්කොට පොරවා නම් කෙසේ වත් නො හැකි ය. එසේම පිඬු සිඟා යන භික්ෂුව එකාංශ-කොට කෙසේ නම් සිවුරට යටින් පාත්‍රය තබාගන්ට දැයි, නුවණැත්තෝ විමසත්වා!

මෙසේ දෙ අංශයෙන් සිවුරු උරහිස මතට නැඟිය හැක්කේ උභයාංශයෙන් පමණකි. එහෙයින් දෙපසින් සිවුරු නො නගා යායුතු ය. මහත්කොට සිනාසෙමින් ද උස්හඬ මහ හඬ නො නගා දෙලොස් රියනකින් ඈත ඇසෙන සේ කථා නො කොට ශබ්ද නො කොට යා යුතු ය. කය සොල්ව සොල්වා බාහුව සොල්ව සොල්වා නොයා යුතු ය. කය දෑඹිව ගෙණ නිශ්චලවූ ඍජුවූ සම්වූ ඉරියව්වෙන් යායුතු ය.

එක් උකුලක උකුල් දෙකෙහි ම හෝ අත් ගසා ගෙණ නොයා යුතු ය. හිස වසා පොරවා නොයා යුතු ය. විළුම් ඔසවා- ඇඟිලිවරින් හෝ ඇඟිලිවර ඔසවා විළුඹින් හෝ නොයා යුතු. මේ එක එකක් පාසා ඕනෑකමින් දූත දූත කඩ කිරීමෙන් දුකුළා ඇවත් වේ.

**රථවාහන ගමන.**

එකල්හි සවග භික්ෂූහු දෙනුන් යෙදූ පිරිමි දක්කන, ගෝණුන් යෙදූ ස්ත්‍රීන් දක්කන, යාන වාහන වලින් යත්. මිනිස්සු දෙස් කිවාහු ය. ගංගා පූජාව සඳහා එකල යාන වාහන වලින් පෙළහරින් යෑම සිරිති. මේ භික්ෂූන් ද එසේ ගංගා පූජාවට යන්නාවුන් යැයි මිනිස්සු නොසතුට පළකළහ බුදුරජාණන් වහන්සේ මේ කාරණයෙහි දී,

"න භික්ඛවෙ යානෙන යායිතබ්බං"

මහණෙනි, යානාවලින් නො යායුතු යැයි සික්ෂා පදයක් පණවා වදාළ සේක.

එකල එක් භික්ෂුවක් කොසොල්දනව්වක සිට සැවැත් නුවරට එන්නේ අතර මඟදී ගිලන්විය. මඟ අසල ගසක් යට වාඩිවී සිටියේ ය. මිනිස්සුන් දූක යානාවකින් යන්ට කැඳවා භික්ෂුව බුදුරදුන් තහනම් කළ බව කියා වාහනයෙන් නො ගියේ ය. මේ කථාව පසුව එහි ගිය භික්ෂුව, භික්ෂූන් සමග ප්‍රකාශ කළෙන් බුදුරජාණන් වහන්සේ,

"අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස යානං"

මහණෙනි, ගිලන් භික්ෂුවට යානය අනුදනිමි.

(**"යානානීති රථ සකටාදීනි"** බුද්ධ සික්ඛා ටීකා.) එනම් අස් ගොන් ඈ පිරිමි සතුන් යෙදූ පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් පදවන යානයත් අතින් ඇදගෙණ යන යානය දෙලා පල්ලැක්කිත් අනුදනිම් යනු යි.

යානා නම්- රිය ගැල් ආදියයි. මෙයින් සතුන් බඳනා ලද්දවුත් මිනිසුන් ඇදගෙණ යන්නාවූත් වාහනයන්හි ගිලන් කමක් නොමැතිව නො යා යුතු ය. දුක්කටාං පත්තිය.

සතුන් බැඳ හෝ මිනිසුන් විසින් ඇදගෙණ හෝ යන වාහනය, එකල තිබුණේ.

දුම්රිය මොටෝරිය ආදී වාහනයන් එකල නො විය. ඒවා යන්ත්‍ර බලයෙන් දුවවන හෙයින් වාහන ඇදීම් විෂයෙහි කෙනෙකුට එතරම් ආයාසයක් නැත. හුදෙක් යන්ත්‍රය ක්‍රියාකරවීමේ මද වෙහෙසකි

බුදුරජාණන් වහන්සේ, යන්ත්‍ර බලයෙන් දුවන රථ තහනම් කර නැත. මෙතැනදී ද විනය සතර මහා ප්‍රදේශ අනුව බේරා ගත යුතු ය.

**"යං භික්ඛවෙ මයා ඉදං නකප්පතීති අප්පටික්ඛිත්තං. තං චෙ කප්පියං අනුලොමෙති, අකප්පියං පටිබාහති තං වො කප්පතීති."**

"මහණෙනි, මෙය අකැපය යි යමක් මා විසින් ප්‍රතික්ෂෙප-කර නොමැති ද එය ඉදින් කැප දෙයට අනුලොම් වෙයි ද අකැප දෙය දුරුකරයි ද එය නුඹලාට කැප ය.

ඇත් අස් ගව ආදී සතුන් පිට යෑම හෝ ඔවුන් බැඳ රියවල ද මිනිසුන් අදිනා රියවල ද යෑම ගිලන් කමක් නො මැතිව නුසුදුසු බව.

**"න හත්ථියානං සමණස්ස කප්පති, න අස්සයානං න රථෙන යාතුං."** යනුවෙන් සූත්‍රාන්තයෙහි ද දක්නා ලැබේ. එබඳු පරහිංසාව පිණිස පවත්නා වාහණ මහා කාරුණික වූ බුදුරජාණන් වහන්සේ තහනම් කළසේක.

එසේම **"සංඝ සුට්ඨුතාය සංඝ ඵාසුතාය"** යනාදීන් සංඝයාගේ යහපත පිණිස සංඝයාගේ පහසුව පිණිස ආදී දස-

කාරණයක් අරහයා බුදුරජාණන් වහන්සේ සික්ඛාපද පණවා වදාළ හෙයින් පරහිංසාව පිණිස නො පවත්නා වාහන ගමන සිල්වත් භික්ෂූන්ට කැපවිය යුතු ය.

යම්හෙයකින් වේගයෙන් යන නිසා අකැප වේතොත් නැවින් යන ගමන ද හෙවත් ජලයානා ද විනයෙන් තහනම් විය යුතු ය.

නැවින් යන ගමන තහනම් නැති නිසාත් කැප වූ එම ගමන හා පරහිංසා පිණිස නොපවත්නා දුම්රිය- මොටෝර්රිය ආදී ථලයානා ගමන ද කැපදෙයට අනුලොම් ය. කැප ය.

සුනාපරන්ත ජනපදයට අහස පිළිවෙල වූ සෘඩිමය යානාවන් ගෙන් බුදුරදුන් හා පන්සියයක් රහතුන් වැඩි බව ධර්මයෙහි පැහැදිලි ය.

එසේම බුරුම ලංකා සියම් ආදි කිසිම රටක කිසිම විනය ධරයකු පරහිංසා පිණිස නො පවතිනා වාහන ගමන අකැප යයි ප්‍රකාශ කොට නැත. එහෙයින් නොගිලන් භික්ෂුවට පරහිංසා පිණිස නො පවත්නා වූ වාහනයන්හි ගමන් කිරීමෙන් කිසිම වරදක් සිදුනොවන බව මෙයින් ධර්මානුකූලව සැක හැර දත යුතුයි.

සතර ඉරියව්වෙන් මෙහි දැක්වුණු ගමන් කිරීම හෙවත්- සක්මන් කිරීමෙහි ම සිටගෙණ සිටීමේ ඉරියව්වත් ඇතුළත් වේ.

**හිඳිම**

ගමේදී සුපිළිසන්ව ඉතා සංවරව වටපිට නොයෙක් දික් නො බලා සිවුරු නො ඔසවා මහත් සිනා නො කොට මහත් හඬින් කථා නොකොට කය හිස අත් නො සලමින් අත් දෙඋකුලෙහි නො තබා හිස වසා නො පොරවා හින්ද යුතු ය

**උසසුන් මහසුන්හි හිඳිම**

**"න භික්ඛවෙ, උච්චාසයන මහාසයනානි ධාරෙතබ්බානි"** මහණෙනි, උසසුන් මහසුන් නො දැරිය යුතු ය. මෙහි උසසුන් නම් ප්‍රමාණය ඉක්ම වූ අසුන යි.

"එතං උච්චාසයනානි පමාණාතික්කන්ත මඤ්චං" (යනු අටුවායි ) මෙහි උසසුන් නම් ප්‍රමාණය ඉක්ම වූ ඇඳයි.

**ප්‍රමාණය නම්**

**"නවං පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානේන අට්ඨඞ්ගුලපාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලේන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා. තං අතික්කාමයතො ඡේදනකං පාචිත්තියං"** (පාචිත්තියපාළි)

අළුත් ඇඳක් හෝ පුටුවක් කරවන භික්ෂුව විසින් යට වියල දක්වා පාදයන් සුගත් අඟලෙන් අටඟුලක් කොට කරවිය යුතු යි. එයට වැඩි උස්කොට කරවන ලද්දේ නම් එය සිඳ දමා පචිති ඇවැත් දෙසිය යුතු ය.

මෙසින් ඇඳක හෝ පුටුවක සකුලේ ප්‍රමාණය සුගත් අඟල් අටක් විය යුතු බව දෙසූසේක.

**සුගත් අඟල**

**"සුගතවිදත්ථි නාම ඉදානි මජ්ඣිම පුරිසස්ස තිස්සො විදත්ථියො වඩ්ඪකී හත්ථෙන දියඩ්ඪො හත්ථො වා හොති"** (යනු විනය අටුවායි.)

සුගත් වියත නම් දැන් මැදුම් පුරුෂයෙකු ගේ තුන් වියතකි. වඩු රියන් එකහමාරකි. මේ සුගත් වියතය. එවිට සුගත් අඟල මැදුම් පුරුෂයා ගේ අඟල් තුනකි. මෙකල ව්‍යවහාර ප්‍රාප්ත අඟල මැදුම් පුරුෂයා ගේ අඟලයි. එවිට සුගත් අඟල් අට නම් මෙකල අඟල් විසිහතරකි. අඩි දෙකකි.

මනොරථ පූරණී අටුවාවෙහි,

**"උච්චාසයනං වුච්චති පමාණාතික්කන්තං, තත්ථ පමාණං පන යස්ස පාදතො යාව අටනියා හෙට්ඨිමන්තා සුගතඞ්ගුලෙන අට්ඨඞ්ගුලප්පමාණො. මජ්ඣිම පුරිසස්ස හත්ථෙන මුට්ඨිරතනප්පමාණො පාදකො හොති. තං පමාණිකං නාම වට්ටති. තතො අධිකං පමාණාතික්කන්තං නාම."**

උසසුන නම් පමණ ඉක්ම වූ අසුනයි. වියළෙහි යට භාගය දක්වා පාදය සුගත් අඟලෙන් අටඟුලක් වූ යේ එහි උස ප්‍රමාණය යි. මැදුම් පුරුෂයෙකු ගේ අතින් මිටක් සහිත රියනක් පමණ වූ පාද ඇත්තේ ප්‍රමාණ නම් වෙ.

ඒයට වඩා උස් වූ යේ ප්‍රමාණය ඉක්ම වූ යේ නම් වේ. මෙහි සුගත් අඟලෙන් අටඟුලක් බවද එය මැදුම් පුරුෂයාගේ මුට්ඨිරත්නයක් බවද කියන ලදී.

“**මුට්ඨියා සහිතං** රතනං” මිටක් සමග රියනක් මෙයින් කියැ වේ. මිට නම් තාල ප්‍රමාණය යි. එනම් මහපට ඇඟිල්ල දිගහැර අතින් ඇඟිලි සතර මිට මොලවා ගත් කල ලැබෙන ප්‍රමාණය යි. එය අඟල් සයකි. රියන අඟල් දස අටකි. එවිට අඟල් 24 කි.

මෙහි මිටි රියණ නම් අත මිටමොලවා මැනීම යයි වරදවා ගත්තහු නො මග ගොස් මෙය අවුල් කළහ. මිටිරියන් යයි මාණ ප්‍රමාණයක් කිසිම මාණ ක්‍රමයක දක් වී නැත. මුෂ්ටියක් සහිත වූ රියන අඟල් විසිහතර හෙයින් එය බුදුරජාතන් වහන්සේ දෙසූ ශික්ෂාපදය හා සම වේ. මේ බුධ වචනය හා ආචාර්‍ය්‍ය වාදය වූ අටුවා මතය යි. මේ ආචාර්‍ය්‍ය මත පෙළට ගැලපේ.

දැන් මහා විහාර පරම්පරාගත අප භික්ෂු පරපුර මේ සිකා පදය කෙසේ පිළිපදනා ලද්දේ දැයි බලමු.

“මෙහි උසසුන් නම් වඩු රියනින් ඉකුත් වලින් යට පා ඇති හැඳ පුටුයි.” මේ සිඛවළඳ විනිස පාඨ යි.

මෙයින් අදහස් කරනුයේ, පාදයන් වඩුරියනක් වියල දක්වා උස ඇති බවයි. වඩුරියන අඟල් විසිඅට, තිස්දෙක, යන ප්‍රමාණවලින් පවතියි. මෙහි අඟල් විසිහතර වඩුරියනටද අඩුය.

ඉතා මිටි ඇඳෙක නිදන භික්ෂුවක් සර්පයකු විසින් දෂ්ට කරණ ලද්දේ, බුදුරජාතන් වහන්සේට දැනුම්දුන්විට “**අනුජානාමි භික්ඛවෙ අට්ඨඞ්ගුල පරමං මඤ්චපටිපාදකං**” මහණෙනි, ප්‍රකෘති අඟලෙන් අඟල් අටක් ඇති බොරුප

හෙවත් "පා අලු" අනුදතිම් නියම කළ සේක. මෙහි මඬුව පටිපාද යනු පා අළුවයි. ඇඳ උස්විමට තබන අඩිය යි.

මෙහි පා අළුව හෙවත් මඬුවපටිපාදය ත් මඬුවපාදය හෙවත් ඇඳ කකුලත් තෝරුම් ගන්ට බැරිවූ විනයවඩින කාරයෝ උසසුන් නම් අඟල් අටෙන් උස් ආසනය යි තොමග ගියහ. ඔවුන්ගේ විනය දැනීම මෙසේ නම් වඩිනය කරණ විනය කෙසේ දැයි තෝරුම් ගත ගැක. මෙය විනය වැරදීමකි. මහජනයා මුළා කිරීමකි.

එවිට මෙහි බුඩ දෙශනාව ත්, අටුවා නියමය ත් ඇදුරු පරපුරෙහි ගෙණා ක්‍රමය ත් සාමාන්‍ය අඟල් විසිහතරෙන් වැඩි ඇඳ පුටු පාවිච්චි නො කිරීමයි. මේ ප්‍රමාණය කිසිසේත් වෙනස් කිරීම බුඩාගම නොවේ.

මහා ආසන නම් පුළුන් ගුදිරි මෙට්ට දැමූ අගනා කොඳු පලස් ඇතුරූ රතු කොට්ට දෙපස දැමූ ආසන යි. උසසුන් මහසුන් ධර්‍මශන වශයෙන් හා ගිහින් සතු ආසන වසයෙන් ගිහිගෙවලදී පාවිච්චි කිරීම වරද නොවේ.

නිග්‍රොධ සාමණේරයන් වහන්සේ ධර්‍මාශෝක මහරජ තුමාගේ සිහසුනට නැග වාඩි වූ බව පෙළෙහි සඳහන් ය. එය උච්චාසනයක් මෙන් ම මහාසනයකි. සප්තාඞගයක් ඇති ඇඳ පුටු ප්‍රමාණය ඉක්මවා උසවූයේ නැපයි. පා සතරක් වියල් තුණක් විමත් සප්තාඞගය යි.

**දන් වැළඳීම**

දන් වැළඳීම හිඳගණ කළ යුතු ය. එහෙත් එය විනය නියමයක් නොවේ. හිඳගන්ට බැරි තැනක හෝ අවස්ථාවෙක හිඳ නොගතද වරද නොවේ.

අරම්ණිය ගොනා වාඩිවී පාත්‍රය අරම්ණිය මත තබා වමතින් පාත්‍රය අල්වා ගෙණ දන් වැළඳීම විනය විරොධි නොවේ.

එකල්හි භික්ෂූහු ඇකයෙහි පාත්‍රය තබත් සිහියෙන් තොරවැ නැගිටින විට පාත්‍රය වැටී බිඳේ. මෙ කාරුණෙහිදී බුදුරජානන් වහන්සේ

**"න භික්ඛවෙ අඞ්කෙ පත්තො නික්ඛිපිතබ්බො"** මහණෙනි, ඇකයෙහි පාත්‍රය නො තැබිය යුතුයයි නියම කළ සේක.

අඞ්කය නම් උකුලයි. **"උච්ඡඞ්ග ක්බාබෙ‍ාච්චඞ්කා"** යනු අභිධානප්පදීපිකා යි. අඞ්ක ශබ්දය උකුලෙහිත් සලකුණු කිරීමෙහිත් ය. **'අඞ්කෙන වහති අඞ්කෙන පරිහරති අඞ්ක නිසීදාපෙති''** යනාදී පෙළෙහි මේ අඞ්ක ශබ්දය යෙදී තිබෙන්නේ උකුලට යි

රයිස් ඩේවිඩ් මහතුන්ගේ පාළි අකාරාදියෙහි

(The lap, The bent position or the hollow above the hips where infants are carried by the Hindo's mothers.)

අඞ්කය නම් උකුලයි. නැමෙන ප්‍රදේශය යි. නොහොත් කටියෙන් උඩ සිහින් වූ - පෙරදිග මැණිවරු (හින්දු මව්වරු) දරුවන් වඩන ප්‍රදේශය යි, අදුත්වා තිබේ.

එහෙත් **''අථ ඛො භික්ඛවෙ බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුකුමාරස්ස උච්ඡඞ්ග සීසං කත්වා සෙය්‍යං කප්පෙසි."**

මහණෙනි, එකල බඹදත් කසිරජ දීඝාවු කුමාරයාගේ උකුලෙහි හිස තබා නිදාගත්තේ ය. යන පාඨයෙහි පයඞ්කයෙන් හුන් කුමරහුගේ උකුලෙහි හිස තබා නිදාගත් බව මිස පයඞ්කය මත හිසතබා නිදාගත් බව මෙයින් නො හැඟේ.

**"පල්ලංකං ආභුජති, සමන්තතො ඌරුබද්ධාසනං බන්ධති."** යන පෙළ අටුවා පාඨයන්ගෙන් පෙණෙන ඌරුබද්ධාසනය මත නොව, උකුලෙහි හෙවත් දෙකකුල් නැමීම මුල පාත්‍රය තබා ගැණීම විය යුතු ය. උච්ඡඞ්ග යනු සාමාන්‍ය ව්‍යවහාරයෙහි ඔඩොක්කුව යයි ද කියති. ඔඩොක්කුව නම් රෙද්ද ඇඳ රෙදිපොටෙහි යම් යම් දේ ඔතා ඉනේ තියා ගැණීම යි. ඔඩොක්කුව ඉක්මණින් ලිහා වැටෙන එකකි.

පාත්‍රය වනාහි ඉනේ තැබිය නො හැකි ය. තවද මෙහි විමසිය යුත්තකි. **"අංසවද්ධකෙන අංසකූටෙ ලග්ගෙත්වා අඞ්ක ඨපෙතුං වට්ටති."** යන විනය නියමය අනුව පාත්‍රය (පසුම්බියෙහි) අංසවද්ධකයෙහි දම්ා දකුරුවෙහි එල්වා ඇකයෙහි තබන්නට වරද නැත. එවිට පාත්‍රය උරහිසෙහි එල්වා

උකුලෙහි තම් පහසුවෙන් තබාගත හැකි ය. එහෙත් අරම්නිය හෙවත් උෘරුබඩාසනය මත තබන්නට ඉතා දිග පාත්‍ර පසුම්බියක් අවශ්‍ය ය.

එබඳු පාත්‍රා පසුම්බියකින් පාත්‍රා පරිහරණයක් කළ නො හැකි ය. දැන් ආචාර්‍ය්‍ය පරම්පරාව විමසා බලමු.

"ඔර තබත් නො වටී, අතින් ගෙණ එව්, පත්තී අල්වඳු දත ලා එව්, කඳට ලා එව්, ඔර තුබුව වරජ නැති" යනු සිබ-වළඳ විනිස සි. මෙහි ඔර යනු ඇකයයි. එහෙත් ඔර ශබ්දය "මහොර" "ලඹෝරා" ආදී ශබ්දයන්හි උර සහ උදර වාචී ය.

මෙහිදු "ඔර" යනු උදර ශබ්දයාගේ තත්භවයක් නම්, කටියෙහි උඩ කොටස උදරය හෙයින් උකුලම ගැණේ අතින් ගෙණ හෝ පාත්‍රය අංසවට්ටකයෙහි (පසුම්බියෙහි) දමා උරයෙහි එල්ලා හෝ බෙල්ලේ එල්ලා හෝ "ඔරතුබුව වරද නැති බව එම සිබවළඳ විනිස පාඨයෙන් කියැවේ.

"පාරිහටවකතා යනු, කිරිදූසෙක සෙයින් කිරිදරුවන් ඔර ලත විසින් ඇබැරිම්." යනුදු සිබවළඳ විනිස පාඨයි. සිබවළඳ විනිස ගණිඨි පදයෙහි ඔරලත උරයෙහි තබාගන්නා යැ යි පෙණේ. මෙහි "ඔර" නම් ඇකයයි. කිරිදූස නම් කිරමව යි. කිරිමව දරුවා ඇකයෙන් වඩාගන්නා මෙන් යනු තේරුම යි. අප ඇතැම් සිල්වතුන් වහන්සේලා ඇකය යනු පයඞ්ඛ යැයි ගණන් ගත්තා හෝ වේවා, පාත්‍රය එක අතකින් අල්ලාගෙණ දත් වැළඳීමෙන් අනාපත්ති බව පෙණෙන හෙයින් මේ කරුණෙහි සැක නොකට යුතු යි. බුරුමරට විනයධාරීහු ද එසේ වළඳති. එසේම ප්‍රත්‍යවෙක්‍ෂා සිහියෙන් යුතුව දනය- පිණ්ඩාහාරය පිළිගත යුතු ය. ප්‍රත්‍ය-වෙක්‍ෂා සිහියෙන් තොරවැ අහක දමන්නා මෙන් පිළිගැණී-මෙන් දුකුළා ය.

"සක්කච්චං පත්තං සඤ්ඤී පිණ්ඩපාතං," යන අටුවා පාඨයෙන් ප්‍රත්‍යවෙක්‍ෂා සිහියෙන් යුතුව යැයි කියනලදී. පාත්‍රයෙහි පාත්‍රා සංඥ ඇතිව දන් පිළිගත යුතු.

උඩු මූං ආදී අතින් ගතහැකි සේ සතවැ පිසන ලද ව්‍යංජනය බතින් සතර කොටසකට වඩා නොපිළිගත යුතුයි.

අධිෂ්ඨාන කරණ ලද හෝ සුදුසු පාත්‍රයෙහි මුවවිටේ යට ඉර ඉක්මවා වැඩිපුර පිණ්ඩාහාර නොපිළිගත යුතු ය. ප්‍රත්‍ය-වෙක්ෂා සිහියෙන් තොරව අහර නොවැළඳිය යුතු ය. අනු-පිළිවෙළින් හෙවත් තමාගේ පැත්තේ සිට දන්වැළඳිය යුතු යයි. පාත්‍රයෙහි ඒ ඒ තැනින් ටික ටික ගෙණ දන් නො-වැළඳිය යුතු යි. ව්‍යඤ්ජන වැඩිපුරම නො ගෙණ සමව වැළඳිය යුතු ය.

බත් පාත්‍රය මැද්දෙන් අතා නොවැළඳිය යුතු ය. වඩා ලබානැණීමට ව්‍යඤ්ජන හෝ සූප බතින් නොවැසිය යුතු ය. ගොංගිලන්ව බත් හෝ සූප ඉල්වා නො වැළඳිය යුතු ය. නෑ නො නෑ පැවරූවන්, පස සහ ධැණියන්ගෙන් ඉල්ලුව වරද නැති.

දෙස් කියනු කැමැතිව අනුන්ගේ පාත්‍රය නො බැලිය යුතු ය. බත් පිඩු මොණර බිජුවට වඩා මහත්කොට නො-වැළඳිය යුතු ය. බත්පිඩු වටකොට ගුලිකළ යුතු ය. බත්පිඩු මුඛයට ළඟාවන්නට පෙර කට නො ඇරිය යුතු ය තොලට පැමිණිකල කට ඇරිය යුතු ය. ඇඟිලි කටේ දම දමා නො-වැළඳිය යුතු ය. කටේ අහර ඇතිව කථා නො කළ යුතු ය. පිඩු කටට විසිකරමින් නො වැළඳිය යුතු ය. බත් පිඩ කඩ කඩා නො වැළඳිය යුතු ය. හකුවල පුරවාගෙණ නො වැළඳිය යුතු ය. අත් සල සලා නො වැළඳිය යුතු ය. සාසල කැටු අස්කරණ විට වරද නැති. බත් ඇට විසුරුවමින් නො වැළඳිය යුතු ය. රොඩු අස්කරණ විට බත් ඇට විසිරුණ ද වරද නැති. දිව නෙර නෙරා තලු ගස ගසා සුරු සුරු හඬ ඇතිව උරඋරා නො වැළඳිය යුතු ය. අත, පාත්‍රය, තොල්, ලෙව ලෙවා නො-වැළඳිය යුතු ය. කිරිබත්, සකුරු, ගිතෙල්, තලතෙල් ආදිය වළඳනවිට ඇඟිල්ලෙන් ගෙණ ලෙව වැළඳුව වටී. ඉඳුල් අතින් පැන් බඳුන නො පිළිගත යුතු ය. පාත්‍රය සෝදනලද වතුර ගෙවල් අතර නොදැමිය යුතු.

**ධර්ම දෙසීම.**

බුද්ධ පුත්‍ර ශ්‍රමණයන් වහන්සේ විසින් කළ යුතු ශ්‍රේෂ්ඨ මෙහෙයක් නම්, ධර්මදෙශනා කිරීම යි.

**"විහරථ විවිත්තෙසු - පබ්බතෙසු වනෙසු වා**
**පකාසයන්තා සද්ධම්මං - ලොකස්ස සතතං මම"**

නිරතුරු මාගේ සද්ධර්මය ලෝකයාට ප්‍රකාශ කරමින් විවේක ඇති පර්වත වන සෙනසුන්හි වාසය කරවු යැයි බුද්ධරජාණන් වහන්සේ මුලින්ම අවවාද කළහ. එසේ ධර්මදේශනා කිරීමේදී ද භික්ෂුව විසින් පිළිපැදිය යුතු විනය නීති රැසෙකි.

1 කුඩයක් ගත් අත් ඇති නොගිලන් හට ධර්මදේශනා නොකළ යුතු කරේ, කිසිල්ලේ, කුඩය තබා (අතින් මුද) සිටිය හට වරද නැති. "ධර්මය" නම්, බුද්ධ, ශ්‍රාවක, ඍෂි, දෙවභාෂිත වූ අර්ථධර්මූපසංහිතවූ අවවාද යයි.

2 සැරයටි අතින් ගත්තහුට දම් නොදෙසිය යුතු. මෙහි වඩුරියනින් සිවු රියන් දඬුයි.

3 කඩු තෝමර ආදී ශස්ත්‍ර ගත්තහුට ද
4 දුනු ආදි ආවුධ ගත්තහුට ද
5 මරවැඩි-සපත්තු දමූ නොගිලන් හට ද
6 සෙරෙප්පු දමූ නො ගිලන්හට ද
7 යානාවක රථයක යන්නහුට ද
8 නිදහුන් නො ගිලන්හට ද
9 අතින් හෝ රෙද්දකින් අකවටු අවුලුවා හුන්නහුට ද
10 කෙස් නො පෙනෙන සේ හිස වෙළුවහට ද
11 කෙස් නො පෙනෙන සේ හිස වැසූ නො ගිලන්හට ද
12 බිම හිඳ ඇතිරිලි ආදී අස්නෙක හුන්නහුට ද
13 පහත් අසුනක හිඳ බිමවුව උස්තැනෙක උන් නොගිලන්හට ද
14 සිටගෙණ වාඩිවූ නො ගිලන්හට ද
15 පස්සෙන් යමින් ඉදිරියෙහි යන නො ගිලන්හට ද
(පෙළට යමින් කියත් වටී.)

16 පාරමැද යන්නහුට අයිනකින් යමින් ද දම් නොදෙසිය යුතු මේ සොළොස් කරුණු කඩකොට ධර්මදෙශනා කරන්නහුට අකුරක් පදයක් පාසා දුක්කට ය.

දානසීලාදී අනුපිළිවෙල කථාව ද හේතු උදාහරණ සහිතව ද අනුකම්පා පෙරදැරිව ද ආත්මොත්කර්ෂණ පරවම්භනාදියෙන් තොරව ද ධර්මදෙශනා කළයුතු යි.

"සම්මතයක් ලද හැනක් මුත් ඒ ඒ තැන අසම්මතවූ බණ නො කිය යුතුයි." යනු මහාවිහාර කතිකාවතෙහිද නියමිත ධර්මය මනාව දැන උගත් නිඃසංශය මූකතා දී සම්මත ලද ධර්මධරයන් විසින්, කල් දැන පිරිස දැන, ව්‍යඤ්ජන නො නසා, විකාර නො කොට, ශ්‍රමණ සාරුප්‍ය වූ අයුරින්, නො පටලවා, මනාව වැටහෙන අයුරු කණට මිහිරි වූ වියත් වචනයෙන් සම්පූර්ණ වචනයෙන් ඉතා මඳ නො කොට, ඉතා වේගවත් නො කොට, සමව පවත්නා වූ සවරයෙන් පිරිස නො කළඹා අහස් ගඟ ගලා බස්නා අයුරු උපමා හේතූදාහරණයෙන් යුතුව, කය හිස අත් නො සොලවමින් බුඩ ලීලාවෙන් මෙන් විමුක්ත්‍යායතන ශීඝ්‍රයෙහි හෙවත් නිවන් ලබාදීමේ අදහසින් යුතුව ධර්ම දේශනා කටයුතු යි.

සමාජයේ දී බුඩපුත්‍ර ශ්‍රමණයන් වහන්සේ හඳුනා ගැණීමට ඉවහල්වන විනයානුකූල මහණකම මෙයින් බොහෝ දුරට තේරුම් ගත හැකි.

තවද චාරිත්‍ර ශීලයට අයිති වත් පිළිවෙත් පිරීම ද මහණුන් වහන්සේ කෙනෙකුන් හඳුනා ගැණීමට කරුණුය. එසේ පිරිය යුතු හික්මිය යුතු වත් තුදුසක් චූලවග්ග විනය පෙළෙහි නියම කළ සේක.
එනම් =

| | | | |
|---|---|---|---|
| 1. උපජ්ඣාය | වත | 8. අනුමොදනික | වත |
| 2. ආචාරිය | ,, | 9. භත්තග්ග | ,, |
| 3. සඞිවිහාරික | ,, | 10. පිණ්ඩපාතික | ,, |
| 4. අන්තෙවාසික | ,, | 11. ආරඤ්ඤක | ,, |
| 5. ආගන්තුක | ,, | 12. සේනාසන | ,, |
| 6. ආවාසික | , | 13. ජන්තාඝර | ,, |
| 7. ගමික | ,, | 14. වච්චකුටි | ,, |

යනු ඒ තුදුසයි

**උපජ්ඣාය වත**

**"වජ්ජා වජ්ජං උපනිජ්ඣායතීති උපජ්ඣායො"** යනුවෙන් මහවිනය අටුවාවෙහි උපාධ්‍යායයන් හඳුන්වා තිබේ.

වරද නිවරද බලා සලකා අවවාද දෙන ගුරුවරයා යි 'වජ්ජා වජ්ජං උපනිජ්ඣායති භුසං විජානාති ති උපජ්ඣා" මේ තා විසින් කරණ ලද දුක්කටය, දුබ්භාෂිතය යනාදීන් චොදනා කොට සිහි උපදවා මනා ප්‍රතිපත්තියෙහි යොදවන්නේ උපාධ්‍යාය වරයා යි.

**"ආචාර සික්ඛාපනෙ ආචරති පවත්තතීති ආචරියො"** මෙසේ බුදුවදන් උගත යුතු, මෙසේ යා යුතු, මෙසේ ඉඳිය යුතු, යනාදීන් ආචාර ශික්ෂාවෙහි යොදවන්නේ ආචාර්‍ය්‍යවරයා යි.

**"සො ච නිස්සය පබ්බජ්ජා උපසම්පදා ධම්මාචරිය වසෙන චතුබ්බිධො"** එම ආචාර්‍ය්‍යවරයා නිස්සයාචරිය පබ්බජ්ජාචරිය උපසම්පදාචරිය ධම්මාචරිය යැයි සතර වැදෑරුම් ය. උපාධ්‍යායයන්ගෙන් හෝ ආචාර්‍ය්‍යයන්ගෙන් හෝ නිස සමාදන්වැ හැම සාමණේර නවක භික්ෂු නමක් ම විසිය යුතු.

නවක භික්ෂුව උපසම්පත්තියෙන් පස් අවුරුදු ඉක්මවූ-කල උවමනා උගත්කමින් යුතු නම් නිසමුක්තව විය හැක. නියමිත උගත්කම් අසම්පූර්ණ නම් වස් කොතෙක් ගතවුව ද තමහට වැඩි මහළු ආචාර්‍ය්‍යවරයකු නොවැති නම් බාල ආචාර්‍ය්‍යවරයකුගෙන් හෝ නිස සමාදන් විය යුතු. එසේ නිස ගත් ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් කෙරෙහි පවත්නා අසූරු උපජ්ඣාය වත - ආචරිය වත නම් වේ.

**උපජ්ඣාය වත**

**"අනුජානාමි භික්ඛවෙ සද්ධිවිහාරිකානං උපජ්ඣායෙසු වත්තං පඤ්ඤපෙස්සාමි."** මහණෙනි, එහෙයින් උපාධ්‍යාය-යන් කෙරෙහි පවතින විධි සද්ධිවිහාරිකයන්ට හෙවත් සමග හැසිරෙන ශිෂ්‍යයන්ට පණවමි.

1 අරුණට පළමුව නැගී දැහැටි පිළිගැන්විය යුතු.
2 මුවදෙනා කැමැති, සිහිල් උණුදිය දිය යුතු.
3 අසුන් පැණවිය යුතු.
4 කැඳ ඇතිනම් පිළිගැන්විය යුතු.
5 කැඳ වැළඳූ බඳුන පිළිගෙණ සෝද තැබිය යුතු.
6 අසුන නගා තැබිය යුතු.

7 කසල ඇත හැමදිය යුතු.

8 උපාධ්‍යායයන් පිඬුසිඟා යනු කැමති නම් අඳනය දිය යුතු.

9 ඇඳි අඳනය පිළිගත යුතු.

10 කායබන්ධනය දිය යුතු.

11 දෙ සිවුරු එක්කොට දිය යුතු.

12 පාත්‍රය සෝදා දිය නො පිස දිය යුතු.

13 උපාධ්‍යයන් කැමති නම් සුපිළිසන්ව සිවුරු පෙරව සේදූ පාත්‍රය ගෙණ උපාධ්‍යායයන්ට පසුව යා යුතු.

14 ඉතා දුරින් නො යා යුතු.

15 ඉතා ලඟින් නො යා යුතු.

16 උපාධ්‍යායයන් ගේ පාත්‍රය උනු හෝ බර නම් තම පාත්‍රය දී එය පිළිගත යුතු.

17 උපාධ්‍යායයන් කථාකරණ කල අතුරු කථා (මැදට පැන) නො කළ යුතු.

18 ඇවැත් ආසන්නව කථා කෙරේ නම් වැළැක්විය යුතු.

19 පිඬුසිඟා හැරී එන කොට පළමුව විත් අසුන් පැණවිය යුතු.

20 පා ධෝනා දිය පා පුටු පා ලෑලිකඩ එළවිය යුතු.

21 පෙර ගමන්කොට පා සිවුරු පිළිගත යුතු.

22 පළමු හැඳි අඳනය දිය යුතු.

23 අඳනය පිළිගත යුතු.

24 සිවුරු තෙත්නම් උණුයෙන් රත්කල යුතු.

25 සිවුරු අව්වෙන් නො දැවිය යුතු

26 සතරඟුල් කොන් ඔසවා සිවුරු නැමිය යුතු.

27 නැම්මෙහි කාබන්ධන තැබිය යුතු.

28 දිය දී පිඬු පිළිගැන්විය යුතු.

29 පැනින් විචාල යුතු.

30 වැළඳුපසු පාත්‍රය පිළිගෙණ පහත්කොට නො ඝප්පා මොනවට සෝදා දිය පිස මොහොතක් රත්කල යුතු.

31 උෂ්ණයෙන් පාත්‍රය නො දැවිය යුතු.

32 ඇඳක් හෝ පුටුවක් යට පිස පාත්‍රය තැබිය යුතු.

33 පැදුරු සම්කඩ ආදී යමක් නො ඇතුරු බිම පාත්‍රය නො තැබිය යුතු.

34 සිවුරු ලනුව හෝ වංශය අතින් පිස නැමිම නමන් පසට සිටින සේ සිවුරු දැමිය යුතු.

35 වැළඳු තැන අසුන් තගා තැබිය යුතු

36 පා දෙවූ දිය පුටුව ලෑලිකඩ තැන්පත් කළ යුතු

37 හැඩිවි නම් ඇමදිය යුතු.

38 උපාධ්‍යායයන් සනගනු කැමැති නම් උණු හෝ සිහිල් දිය පිළියෙල කළ යුතු.

39 ඉදින් උපාධ්‍යායයන් ගිනිහල්ගෙට යනු කැමැති නම් ඇඟ උලන සුණු දියෙන් තෙමා පිඩු කටයුතුයි.

40 මැටි තෙම්ය යුතු.

41 ගිනිහල්ගෙයි පුටුව ගෙණ පසුපසින් ගොස් එය දී සිවුරු පිළිගෙණ එක්පසෙක තැබිය යුතු.

42 මැටි මුහුණේ ගා පෙරපසු දෙපස වසා ගිනිහල්ගෙට පිවිසිය යුතු.

43 සථවිර භික්ෂූන්ට ගැටී නො සිටිය යුතු.

44 නවක භික්ෂූන් අසුනින් නො නැගිය යුතු .

45 ගිනිහල්ගෙහි උපාධ්‍යායයන් වහන්සේගේ අත් පා මිරිකිම් ආදී පිරියම් කටයුතු.

46 ගිනිහල්ගෙයින් නික්මෙන්නහු පුටුව ගෙණ දෙපසින් වසා නික්මිය යුතු.

47 දියෙහිදු උපාධ්‍යායයන් ඇඟ ඉලීම් ආදී පරිකම් කටයුතු.

48 නා පළමුව ගොඩවී ඇඟදිය සිඳුවා අඳනය හැඳ උපාධ්‍යායයන් සිරුර දිය සිඳවිය යුතු

49 අඳනය දිය යුතු.

50 සිවුරු දිය යුතු.

51 ගිනිහල් පුටුව ගෙණ පළමුව විත් අසුන් පැණවිය යුතු.

52 පාදිය පාපුටු පාලෑලිකඩ එළවිය යුතු.

53 පැනින් විචාල යුතු.

54 අසනු පිළිවිසිනු කැමැති නම් කටයුතු.

55 උපාධ්‍යායයන්ගේ ලැගුම් ගෙය කසල නම් සුඩ-කටයුතු.

56 පිරිසිදු කරන්නහු පාසිවුරු නිසදුන් පසතුරුණු කොට්ට මෙට්ට පිටත එක්පසෙක තැබිය යුතු.

57 ඇඳ මිනාකොට දොර උළුවස්සෙහි නො උලා නො ගටා (නො හප්පා) එක් පසෙක තැබිය යුතු.

58 පුටු පහත්කොට දොර උළුවස්සෙහි නො උලා නො ගටා එක් පසෙක තැබිය යුතු.

59 ඇඳෙහි පා උස්වීමට තබන බොරු පා හෙවත් පා අළු එක් පසෙක තැබිය යුතු. (මඤ්චපටිපාදක)

60 පඩික්කම, හේත්තුවෙන පුවරුව එක් පසෙක තැබිය යුතු.

61 බුමුතුරුණු පැන වූ සැටි බලා ගෙණ ගොස් එක් පසෙක තැබිය යුතු.

62 පණුකැදලි මකුළුදැල් වෙයි නම් බිත්තිය මුදුනෙහි සිට පහතට පිසදැමිය යුතු.

63 ඇතුළුනා පිටිනා වා කවුළුද ගැබ සිවුකොණද පිසදැමිය යුතු.

64 ඉදින් කහ හිරියල් හෝ රතු ආදී පාට ගාතලද පිරියම් කළ බිත්ති හෝ බිම දූවිලි බැඳ පුස් සෑදී තිබේනම් රෙද්දක් තෙමා පෙළා පිස දැමිය යුතු.

65 බිම ගෛරුක පරිකම් (සිංමත්ති දැමීම් ආදිය) කරණලද්දේ නොවේ නම් දිය ඉස දූලි නො නැගෙණ ලෙස හැමදිය යුතු.

66 කසල එක්කොට ගෙණ ගොස් දැමිය යුතු.

67 බුමුතුරුණු අවුගස්වා සුඹ කොට අපොළා (ගසාදමා) පළමු තිබුණු අයුරින් පැනවිය යුතු. බුමුතුරුණු බිත්තියට අඟල් දෙකක් හෝ තුනක් ඉඩ හැර පැනවිය යුතු.

68 ඇඳ පා අළු ද ඇඳන් ද පුටු ද අවුගස්වා සුඹකොට පොළා දොර උළුවහුවල නො ගටා නො අතුල්ලා තිබුණ සැටියෙන් පැනවිය යුතු

69 කොට්ට මෙට්ට තිසීදන පසතුරුණු අවුගස්වා සුඹ කොට අපොළා ගෙණවුත් තිබුණු සැටියෙන් පැණවිය යුතු.

70 කෙළමළු (පඩික්කම්) සෝදා අව්හස්වා මැද ගෙණ වුත් තැබිය යුතු.

හේත්තුවෙන පුවරුද අවුගස්වා මැද ගෙණවුත් තැබිය යුතු.

71 පා සිවුරු පළමු පරිදි තැන්පත් කටයුතු.

72 පෙරදිගින් උතුරු මැදුම් දකුණු දිගින් දූලි සහිත වාතය එයි නම් ඒ ඒ පැතිවල ජනෙල් වැසිය යුතු.

73 සීත කාලය නම් දවල් වා කවුළු ඇරිය යුතු. රාත්‍රියට වැසිය යුතු

74 පිරිවෙණ ආලින්දය උපස්ථානසාලාව වැසිකිළිය ඇමදිය යුතු.

75 බොන පැන් ශෞච පැන් එලවා තැබිය යුතු.

76 ඉදින් උපාධ්‍යායයන් වහන්සේට (සසුනෙහි) නො ඇල්මෙක් ඇති වූයේ නම් ශිෂ්‍යයා විසින් වෙන තැනකට හෝ පැමිණවිය යුතු

77 අනික් භික්ෂුවක් ලවා හෝ තොරුන් වෙන අරමකට කැඳවා යා යුතු.

78 කුකුසක් හෝ මිසදිටුවක් උපනිනම් එද දුරුකළ යුතු

79 බණ කිව යුතු අනිකෙක් ලවා හෝ අවවාද කරවිය යුතු.

80 ඉදින් උපාධ්‍යායයන් ගරු ඇවතකට පැමිණියේ නම් වත් පිරිය යුතුනම් භික්ෂු සංඝයාගෙන් ආයාචනා කොට විනයකම් කරවා ගත යුතු.

81 ඉදින් උපාධ්‍යායයන්ට සංඝයා දඬුවම් කරනු කැමති නම් කෙසේ නම් ඒ කම් නොකෙරෙද්ද යි හෝ ධාර්මිකව කරණ ලද කම් කෙසේ නම් සම්පූර්ණ වේ දැයි උත්සාහ කටයුතු.

82 ඉදින් උපාධ්‍යායයන් ගේ සිවුරු දෙවිය යුතු නම් තමන්ම දෙවිය යුතු අනිකෙකු ලවා හෝ දෙවිය යුතු.

83 සිවුරු කළයුතු නම් රදන් (රඹු) පිසිය යුතු නම් සිවුරු පඬු පෙවිය යුතු නම් තමන් හෝ කටයුතු. උත්සාහ කොට අනිකෙකු ලවා හෝ කරවිය යුතු.

84 සිවුරු පඬු පොවා වනා දියසිරි අවසන් වනතුරු නො යා යුතු.

85 නො අසා අනිකෙකුට පාත්‍රය නො දිය යුතු.

86 අනුන් ගේ පාත්‍රය නො පිළිගත යුතු.

87 සිවුරු නො දිය යුතු.

88 පිරිකර නො දිය යුතු.

89 අනිකෙකු ගේ හිස නො බෑ යුතු.

90 අනිකෙකු ලවා හිස බා නොගත යුතු.

91 අනිකෙකුට අත්පා මැඩීමාදිය නො කටයුතු.

92 අනිකෙකු ලවා අත් පා මැඩීම් නො කරවාගතයුතු.

93 අනිකෙකුට වතාවත් නො කළයුතු.

94 අනිකෙකු ලවා වතාවත් නො කරවා ගතයුතු.

95 අනිකෙකුට පිඩු නො ගෙණගිය යුතු.

96 අනිකෙකු ලවා නො ගෙන්වා ගතයුතු.

97 ගම් නො වැදිය යුතු.

98 උපාධ්‍යායයන් නො පිළිවිස වාසයට හෝ අසුභදශීන-යට සොහොනට නො යායුතු.

99 වෙන දේශයකට හෝ නො යායුතු. තුන්වනවර හෝ පිළිවිස අවසර නො දේද ඉදින් එම උපාධ්‍යායයන් ඇසුරු-කොට වසන්නහුට ඉගෙණීම් පිළිවිසීම් කම්සථාන භාවනා හෝ සම්පූණ් නො වෙද්ද උපාධ්‍යායතෙම බාල අව්‍යක්තයෙක් හෝ හුදෙක් තමන් ළඟ නවතා ගැණීම ප්‍රශ්ස යනු නො දේද එබඳු උපාධ්‍යායයන් වැළැක්වුව ද යනු විටී.

100 ඉදින් උපාධ්‍යායයන් ගිලන්වේ ද දිවි ඇතිතෙක් උවටැන් කළයුතු. සනීපවීම බලා පාරොත්තු වියයුතු කොහිවත් නොයායුතු. අන්‍ය උපසථායක භික්ෂුවක් වෙයි නම් බෙහෙත් සොයා ඔහු අතටදී උපසථාන කළමැනවැයි කියා යායුතු. මේ උපාධ්‍යාය වතයි.

ආචායීයන් වහන්සේට ද මෙසේ ම වත් කළ යුතුයි. මෙහි සිවුරු රැදීම් අවසන්කොට ඇති වත් නො කරණ කල්හි ආචායී උපාධ්‍යායයන්ගේ පිරිහිම වන හෙයින් තිස මිදුනහට ද නොමිදුනහට ද ආපත්තිය. උපාධ්‍යාචායීයන් නො විමසා අනිකෙකුට පාත්‍රය දීම ආදියෙන් තිස නො මිදුන-හට ම ආපත්තිය. ඉදින් උපාධ්‍යාචායීයන් බලාපොරොත්තු නම් මේ වත් සියල්ල කටයුතු ය. නො කරණ සියළුම ශිෂ්‍ය-යන්ට ආපත්තිය ඉදින් උපාධ්‍යාචායීවරයා මට උපසථායකයෝ ඇත. නොප තමන්ගේ ඉගැණීම් භාවනා ආදිය කරවයි, කියා නම් ඇවැත් නැත. ඉදින් ශිෂ්‍යයන්-ගෙන් වත් සපන් භික්ෂුවක් මම ඇදුරු වත් තෙරුන්ගේ

කටයුතු කරමි' යි භාරගණියි නම් එතැන් පටන් අනිත් අයට අනාපත්තිය. මෙහි නිස්සයන්තෙවාසිකයා විසින් ආචාර්‍ය්‍ය-වරයා නිසා වසනාතුරු සියළු වත් කටයුතු යි.

"පබ්බජ්ජා, උපසම්පදා, ධම්ම, අන්තෙවාසිකයා විසින් නිස මිදුනේ නමුදු මූල පටන් චීවරරජනය දක්වා සියළු වත් කටයුතු. නොවිමසා සිවුරු දීමාදියෙන් ඔවුනට ඇවැත් නොවේ. පැවිදි උපසපන් අනවැසියන් ආචාර්‍ය්‍යවරයාට දිවි ඇතිතෙක් භාරය.

## සද්ධිවිහාරික වත.

උපාධ්‍යායවරයා විසින් තමා සමග හැසිරෙණ ශිෂ්‍යාදීන් කෙරෙහි **"උපජ්ඣායෙන භික්ඛවෙ, සද්ධිවිහාරිකො සංගහෙතබ්බො"** මහණෙනි, උපාධ්‍යායයා විසින් සද්ධි-විහාරිකයාට සංග්‍රහ කටයුතු, අනුග්‍රහ කටයුතු, උදෙසීම්, පිරිවිසීම්, (පෙළ කියාදීමෙන් හා අර්ථ කියාදීමෙන් අවවාදානු-ශාසනාදියෙන්, සංග්‍රහ- අනුග්‍රහ කටයුතු. සද්ධිවිහාරිකයාට පාසිවුරු පිරිකර තමා සතුව ඇති නම් දියයුතු. ලබාදීමට උත්සාහ කළයුතු. ඔහු ගිලන්වූ කල තමහට කරණලද සියළු වත් සද්ධිවිහාරිකයාට කළයුතු ය. ඔහුගේ සිවුරු සේදීමාදිය අනිකෙකු ලවා හෝ කරවිය යුතු යි.

## අන්තෙවාසික වත්.

ආචාර්‍ය්‍යවරයා විසිනුත් ශිෂ්‍යයාට උදෙසීම් පිරිවිසීම් අවවාද අනුශාසනාවන්ගෙන් අනුග්‍රහ කළයුතු ය. පාසිවුරු පිරිකර සොයා හෝ දීමට උත්සාහවත් වියයුතු ය. ගිලන්වූ කල සියළු උපස්ථාන කළ යුතු ය.

## ආගන්තුක වත්.

**"තෙන හි භික්ඛවෙ, ආගන්තුකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි."** ආගන්තුක භික්ෂුව විසින් දැන් අරමට පිවිසෙමි' යි උපචාර සීමාවේදී, පාවහන් ලිහා, ඡත්‍රය හකුලා හිසවසා අර සිවුරු කරේදමා නො ඉක්මත්කොට අරමට පිවිසිය යුතු. භික්ෂූහු යම් තැනක සිට යෙත් ද උවටැන්හල

හෝ මණ්ඩපයක් හෝ රුක්ඛමූලයක් වේද්ද, එහි ගොස් සිවුරු එක්පසෙක තිබිය යුතු.

සුදුසු අසුනක වාඩිවිය යුතු.

බොන පැන් ඡේන පැන් විචාරා කැමැති නම් පියයුතු. මුහුණ දෙවිය යුතු. එක් අතකින් දිය වත්කරමින් අනිත් අතින් පා දෙවිය යුතු ය.

වියලි රෙද්දකින් පාවහන් පිස පසුව තෙත රෙද්දකින් පිසිය යුතු ය. එම රෙදිකඩ සෝද වැනිය යුතු.

ආවාසික භික්ෂුව වැඩිමහලු නම් වැන්ද යුතු. බාලනම් වැන්දවිය යුතු.

තමහට පැමිණෙන සෙනසුන කිසිවෙකු සිටින එකක් ද නැති එකක්ද යි විමසිය යුතු.

ගොදුරු ගම ළඟ ද දුරද යි උදයම යායුතු ද දවල්වී යා යුතුද යි භික්ෂාචාරය විමසිය යුතු.

මිසදිටු ගම් හෝ සවල්ප වූ භික්ෂාව ඇති ගම් යන අගොචරය විමසිය යුතු. සෙඛසම්මතකුලයන් විමසිය යුතු. වැසිකිළිය කැසිකිළිය විමසිය යුතු. මේ පොකුණෙහි පැන් බීමට ද නැමටද යි පාණීය පරිභොජනීයයන් විමසිය යුතු. සාතරයට (සැරමිට) විමසිය යුතු. කිනම් කාලයෙහි පිවිසිය යුතු ද කිනම් කාලයෙහි නික්මිය යුතුද යි සංඝයාගේ කතිකා විමසිය යුතු.

ඉදින් සෙනසුනෙහි කිසිවකු නො සිටියේ නම් දොරට තට්ටුකර සවල්ප වේලාවක් ගතකොට අගුල ඔසවා දොර හැර පිටත සිට ඇතුළත පරීක්ෂාකර බැලිය යුතු ය. ඉදින් ඒ විහාරය රොඩු කුණු තිබේනම් සුඩකළ යුතු. සෙනසුන් වතෙහි කියනලද අයුරුයි.

## ආවාසික වත

"එතන හි සිකඛවෙ ආවාසිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි." වැනි මහලු ආගන්තුක භික්ෂුව, දැක අසුන් පැනවිය යුතු. පාදෝදක දිය පාපුටුව පාදේනා ලැලි-කඩ ගෙනවුත් තැබිය යුතු. පෙරගමන් කොට පාසිවුරු

පිළිගත යුතු. පිය යුතු දෑයකින් විචාළ යුතු. පවන් සැලිය යුතු ඉදින් හැකි නම් වහන් පිසිය යුතු. ආගන්තුකයා වැඩිමහලු නම් වැන්ද යුතු. සෙනසුන් පැණවිය යුතු කලින් සිටි හෝ නැතිබව කියයුතු. ගොචර අගොචර කියයුතු. සෙඛසම්මතකුලයන් කියයුතු. වැසිකිළි කැසිකිළි කියයුතු. පානීය පරිභොජනීය පැන් කිය යුතු. සංඝයාගේ කතිකා නියමයන් කියයුතු ඡොයා යුතු කල් කිය යුතු. ඉදින් නවකයෙකුට නම් හිඳගෙණම මෙහි පාත්‍රය තබව මෙහි සිවුරු තබව යි මේ අසුනෙහි හිඳුවයි කිව යුතු.

## ගමික වත.

**"එතන හි භික්ඛවෙ ගමිකානං භික්ඛූනං වත්තං පඤ්ඤාපෙස්සාමි."** ගමික භික්ෂුව විසින් ලී බඩු මැටිබඩු තැන්පත් කොට දොර වාකවුළු වසා භික්ෂුවකට හෝ සාමණේරයකුට හෝ ආරාමිකයෙකුට සෙනසුන භාරදී යායුතු. එසේ කිසිවකු නැති නම් ගල්කැට සතරක් මත ඇඳ තබා ඒ මතුයෙහි ඇඳන් ලීබඩු මැටිබඩු රැස්කොට තබා, දොර කවුළු වසා යා යුතු ය. ඉදින් සෙනසුන තෙමේ නම් හැකි නම් වැසිය යුතු. උත්සාහ හෝ කටයුතු. කෙසේ නම් සෙනසුන සොයන්නේද යි. ඉදින් එසේ නො වේ නම් යම් පෙදෙසක නො තෙමේ නම් එහි ගල් සතරක් මත ඇඳ තබා ඇඳමත ඇඳන් හා පුටුමත පුටු තබා මතුයෙහි ලීබඩු මැටිබඩු රැස්කොට තබා දොරකවුළු වසා යා යුතු. ඉදින් වෙහෙරට අයිති සියලු ගෙවල් තෙමේ නම් භාණ්ඩයන් ගමෙහි හෝ තැන්පත් කරවිය යුතු. එසේ නො ලැබේ නම් අභ්‍යවකාශයෙහි ගල් සතරක් මත ඇඳ පුටු තැන්පත් කොට ඒ මත ලීබඩු මැටිබඩු තබා තෘණපර්ණාදියකින් වසා යා යුතු.

## අනුමෝදනික වත

එකල භක්තාග්‍රයෙහි අනුමෝදනා නො විය. **"අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ අනුමොදිතුං."** මහණෙනි දන් වළඳා අවසන්හි අනුමෝදනා කරන්ට අනුදනිමි. එකල එක්තරා සමූහයක දනෙක් විය. ආයුෂ්මත් සැරියුත් හිමි සංඝස්ථවිර විය. බුදුරදුන් තෙරුන්ට අනුමෝදනා නියම්කල හෙයින්

අතික් භික්‍ෂූහු සැරියුත් රහතන්වහන්සේ තනිකර දමා ගියහ. සැරියුත් හිමියන් තනිව වසිනු දුටු බුදුරදුණෝ කිම දනය සම්බන්ධ යි විචාල සේක. එසේය ස්වාමීනි! එහෙත් භික්‍ෂූන් මා තනිකර දමා ආවාහුයැ යි සැලකළහ එකල "අනුජානාමි භික්ඛවෙ වතුගි පඤ්චගි ථෙරානුථෙරගි භික්ඛුගි ආගමෙතුං" යනු වින් හකතාග්‍රයෙහි තෙරුන් අනුතෙරුන් පිළිවෙළින් සතර පස්නමක් විසිය යුතුය යි නියම කළසේක.

එකල එක් භික්‍ෂුවක් වැසිකිළි යනු කැමැතිව ඉවසා සිටියේ මූර්ඡාවිය. මහණෙනි, කාටයුත්තක් ඇතිකල්හි ළඟ භික්‍ෂුවට දන්වා යායුතුය යි නියම කළසේක. අනුමෝදනා භික්‍ෂුව කිකල හෝ අසා හෝ ගියාට ද වරද නැති.

## භත්තග්ග වත

"තෙන හි භික්ඛවෙ භික්ඛූනං භත්තග්ග වත්තං පඤ්ඤපෙස්සාමි." ආරාමයෙහි ගෙඩිය ගැසූකල නිම්ඩුළු වසා හඳනය ගැඳ කාබන්ධනය බැඳ එකතුකොට දෙපොට පොරවා ගැටබැඳ ගන්වා සේදූ පාත්‍රය ගෙණ මතාකොට නොඉක්මන්ව ගමට වැඩිය යුතුය. සුපටිච්ඡන්නාදී සියළු නීති පිරිය යුතු.

දන් වළඳන තැනට ගොස් ස්ථවිර භික්‍ෂූන්ට ඉතා ළං නොව සිටිය යුතු දෙපටසිවුර අතුරා නොහිඳිය යුතු. දිය දෙන කල්හි දෙඅතින් පාත්‍රය අල්වා දිය ගෙණ පාත්‍රය සෝදා දිය දමන බඳුනකට දැමිය යුතු.

බත් බෙදනකොට දෑතින් පාත්‍රය අල්වා බත් පිළිගත යුතු. ගිතෙල් ආදිය වේත් නම් හැමට සමව බෙදන ලෙස කිවයුතු. හැමට බත් බෙදනතුරු තෙරුන් නොවළඳිය යුතු. වළඳනවිට සියළු නීති රැකිය යුතු. සියලු දෙන වළඳනතුරු තෙරුන් පාත්‍රේ දිය නොපිළිගත යුතු

## පිණ්ඩපාතික වත

"තෙන හි භික්ඛවෙ පිණ්ඩපාතිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි." පිඬු සිඟා යන භික්‍ෂුව විසින්

දූත් ගමට පැමිණෙමැ යි තෙමඩුළු වසා හඳනය හැඳ කාබහණ බැඳ දෙසිවුරු එක්කොට පෙරව ගැටවටුගත්වා සෝදා පාත්‍රය ගෙණ මොනවට නො තරමිත් ගමට පිවිසිය යුතු ය.

සුපටිච්ඡන්නාවැ යෙමි යි ආදී ගමනෙහි සිකපද මනාව රැකිය යුතු. ගෙයකට පිවිසෙන්නහු ඇතුල් වියයුතු පිටවිය යුතු තැන් සැලකිය යුතු. වහා නො පිවිසිය යුතු. වහා නො නික්මිය යුතු. ගෙට ඉතා දුරින් හෝ ලංව නොසිටිය යුතු. බොහෝ වේලා හෝ සවල්ප වේලා හෝ නො සිටිය යුතු. දෙනු කැමැති බව හෝ නො දෙනු කැමැති බව සැලකිය යුතු. කරමින් සිටිත කටයුතු නවතා සැන්ද හෝ අල්ලයි ද සැන්ද තබන හඬ හෝ ඇසේ ද දෙනු කැමතිය යි සිටිය යුතු. පිඬු බෙදනාවිට වමතින් සහළ සිවුර ඔසවා දකුණතින් පාත්‍රය එළවා දෙ අතින් පිළිගත යුතු.

භික්ෂාදයිකාවගේ මුහුණ නො බැලිය යුතු සූපව්‍යඤ්ජන දෙනු කැමැතිද යි සැලකිය යුතු. පිඬු දුන්කල සඟළ සිවුරෙන් පාත්‍රය වසා මොනවට නො තරමිත් සිකපද ලෙස හැරී ආ යුතු. යමෙක් පළමුව අරමට එයි ද ඔහු පා ධෝනා දිය පා පුටු පා සෝදන ලෑල්ල එළවා තැබිය යුතු. (අවක්කාර පාත්‍රය) වැඩිදේ දමන භාජනය- පියයුතු දෙවියයුතු දිය ගෙණවුත් තැබිය යුතු.

යමෙක් සියල්ලට පසුව එයිද ඔහු වළඳ ඉතිරිය කැමැති නම් වැළඳිය යුතු. නැතහොත් අමු තෘණ ආදිය නැති තැනක හෝ දූමිමෙන් සතුන් නො මැරෙන ජලය බොහෝ ඇති තැනක හෝ දූමිය යුතු. ආසන ආදී සියල්ල තැන්පත් කටයුතු. වැළඳු තැන හැමදිය යුතු. වතුර කළ හිස්වී තිබේ නම් දිය ගෙණවුත් තැබිය යුතු. දිය පිරවූවිට තමන්ට නො ගෙණිය හැකි නම්, අතින් අනික් භික්ෂුවකට කථා කළ යුතු. එබඳු සුළු කරුණකට වාක්භෙද නො කටයුතු. මේ පිණ්ඩචාරිකා වතයි.

## ආරඤ්ඤික වත.

"තෙන හි භික්ඛවෙ ආරඤ්ඤිකානං භික්ඛූනං වත්තං පඤ්ඤපෙස්සාමි." අරණ්‍යවාසී භික්ෂුව විසින් කල් ඇතිව

තැගී පාත්‍රය පසුම්බියෙහි ලා අංශයෙහි එල්වා සිවුර කරේ දමා වහන් තැගී ලිබඩු මැටිබඩු තැන්පත් කොට දෙරජනෙල් වසා සෙනසුනෙන් පිටවිය යුතු.

දැන් ගමට පිවිසෙමැ යි පාවහන් ගලවා පහත්කොට ගසා දමා වහන් පයෙහි ලා අංශයෙහි එල්වා තිමඩුළු කොට හැඳ කාබහණ බැඳ දෙසිවුරු එක්කොට පෙරවැ ගැටිවටුගන්වා සෝදා පාත්‍රය ගෙණ මනාකොට නොතරමින් ගම්වැදිය යුතු. ගමනෙහි රැකිය යුතු නීතීන් නො කැඩිය යුතු. පිණ්ඩපාතික වතෙහි නියම කළ නීතීන්ද රැකිය යුතු.

ආරණ්‍යක භික්ෂුව විසින් බොන දෙවතාදිය එළවා තැබිය යුතු. ගිනිගානා දඬු එළවා තැබිය යුතු. සැරමිටිය එළවා තැබිය යුතු., නැකත් උගත යුතු. සියල්ල හෝ එක් කොටසක් නැකත් දතයුතු. දිසාවන් දැනගත යුතු.

## සේනාසන වත.

"සෙනා සි ගික්ඛවෙ භික්ඛූනං සෙනාසන වත්තං පඤ්ඤාපෙස්සාමි." යම්කිසි විහාරයක වෙසෙයි නම් එය කසල වී තිබේ නම් සුඩ කටයුතු. (විහරති එත්‍ථාති විහාරො) මෙහි වෙසේනු යි විහාර නම්. මෙය වතාහි භික්ෂුව වසන සෙනසුන සඳහා දෙසන ලදී. උපාධ්‍යාය වතෙහි කියනලද අයුරු සෙනසුන් වත කටයුතු භික්ෂූන් වැඩකටයුතුවල යෙදී ඉන්නා තැන අතික් විහාරයක් අසල ලිං පැන් පොකුණු අසල උඩුසුළඟෙහි සෙනසුන් ගසා නො දැමිය යුතු. යටිසුළඟෙහි මනා ය.

ඉදින් වැඩිමහල්ලෙකු හා එක වෙහෙර වසන්නේ නම් වැඩිමහලු භික්ෂුව ගෙන් නො අසා නො ඉගැන්විය යුතු. සජ්ඣායනා නො කළ යුතු. බණ නො කිය යුතු. පහන් නො දැල්විය යුතු වාකවුළු නො ඇරිය යුතු. නො වැසිය යුතු ඉදින් වැඩිමහල්ලකු සමග එක සක්මන්හි සක්මන් කරණ කල වැඩිමහල්ලහු ළඟදී ආපසු හැරිය යුතු. වැඩි-මහල්ලහු සිවුරු කොණින් නො ගැටිය යුතු.

## ජන්තාඝර වත.

ජන්තාඝරය නම් ගිනිහල් ගෙය යි මෙය වතාහි සීත-

කාලයේදී භික්ෂූන්ගේ සිරුරු උණුසුම් කිරීම සඳහා සුළං ඇතුළට නො එන සේ පිළිවෙල කළ ගිනි දමා ඇතුළ රත්කරණු ලබන ගෘහයකි.

එකල සවග භික්ෂූහු ස්ථවිර භික්ෂූන් වළක්වද්දී ජන්තාඝරයෙහි බොහෝ දර දමා ගිනි රස්නය වැඩිකොට දොරවසා එළියට වී සිටියාහු ය. ස්ථවිර භික්ෂූහු සිහිනැත්ව වැටුනාහු ය. මතු එසේ කළොත් දුෂ්කටාපත්ති නියමකොට,

**"තෙන හි භික්ඛවෙ භික්ඛූනං ජන්තාඝරෙ වත්තං පඤ්ඤාපෙස්සාමි" ති** යමෙක් පළමුව ජන්තාඝරයට යේ ද එහි අළු බොහෝ නම් අළු අස්කළ යුතු. හැඩිවී තිබේ නම් අතුගාදැමිය යුතු. ජන්තාඝර ශාලාව හැමදිය යුතු. පිල පිරිවෙණ උපස්ථානශාලාදිය අතුගා දැමිය යුතු ඇගේ ගාන (කොකුම්) සුණුවගී තෙමිය යුතු මුහුණේ ගාන මැටි තෙමිය යුතු. ඔරුවේ දිය දැමිය යුතු. මැටි මුහුණෙහි ගා ඉදිරිපසු-දෙපසින් වසා පුටුව ගෙණ ජන්තාඝරයට පිවිසිය යුතු. ස්ථවිර භික්ෂූන් හා ගැටී නො සිටිය යුතු. නවක භික්ෂූන් අසුනෙන් නො නෙරපිය යුතු. ඉදින් උත්සාහවත් නම් ස්ථවිර භික්ෂූන්ගේ අත්පා මැඩීමාදිය කළයුතු. ජන්තාඝර-යෙන් නික්මෙන්නේ පෙරපසු දෙපස වසා ජන්තාඝර පුටුව ගෙණ නික්මිය යුතු. ඉදින් උත්සාහවත් නම් දියෙහි ද ස්ථවිර භික්ෂූන්ගේ ඇඟ ඉලීමාදිය කළ යුතු. ස්ථවිර භික්ෂූනට පෙරටුව නො නෑ යුතු. උඩු සැඩපහරෙහි නො නෑ යුතු. නහා ගොඩවනුයේ බස්නවුන්ට ඉඩදිය යුතු. යමෙක් පසුව ජන්තාඝරයෙන් නික්මෙයි ද ඉදින් ජන්තාඝරය මඩවී නම් සේදිය යුතු. මැටිදෙණිය සෝදා ජන්තාඝර පුටුව තැන්පත් කොට ගිනිනිවා දොර වසා යා යුතු.

## වච්චකුටි වත.

එකල එක් බ්‍රාහ්මණ ජාතික භික්ෂුවක් වච්ස්කොට සෝදන්ට මැලිවිය. මේ දුර්ගන්ධය කවුරු අතගාත්ද යි පිළිකුල් කෙළේ ය. වසවග පණුවෝ හටගත්හ. භික්ෂූහු මෙය අසා දෙස් කීහ. බුදුරජානන්වහන්සේ

**"න භික්ඛවෙ වච්චං කත්වා සති උදකෙ න ආචමෙතබ්බං. යො න ආචමෙය්‍ය ආපත්ති දුක්කටස්ස."**

මහණෙනි, වැසිකිළි කිස කොට දිය ඇතිකල නො සෝදා නො සිටිය යුතු. යමෙක් නොසෝදතොත් දුක්කටාපත්ති ය. එසේම ආ ආ පිළිවෙළට වැසිකිළි කිස කටයුතු. කැසිකිළිය ද නානතොටද මෙසේ යි.

**"තෙන හි භික්ඛවෙ භික්ඛූනං වච්චකුටිවත්තං පඤ්ඤපෙස්සාමි"**

යමෙක් වැසිකිළියට යේ ද, පිටත සිට උක්කාසනා (කැසි කැරීම) උගුර පෑදීම කළයුතු. ඇතුළත සිටියහු විසිනුදු උක්කාසනා කළයුතු.

සිවුරුලීයෙහි හෝ වැලෙහි සිවුරු දමා සෙමින් වැසිකිළියට පිවිසිය යුතු. වහා නො පිවිසිය යුතු. වච්චස්පාදුකායෙහි සිටියේ සිවුරු එසවිය යුතු.

චපු චපු යන හඬින් නො සේදිය යුතු. දිය ගන්නා සොණ්ණස්සෙහි දිය ඉතුරු නො කළ යුතු. තතන තතනා වැසිකිළිකිස නො කළ යුතු. දැහැටි කමින් වැසිකිළිකිස නො කට යුතු. පාදුකායෙන් පිටත වච්ස් නො කට යුතු. පාදුකායෙන් පිට මූත්‍ර නො කළ යුතු මූත්‍ර පාදුකායෙහි කෙළ නො ගැසිය යුතු. රළු වූ පුසන් කූරු පාවිච්චි නො කළයුතු. පුසන්කූරු වච්ස් කූපයේ නො දැමිය යුතු. වච්ස් පාදුකායෙහි සිටියේ අඳනය පාත දැමිය යුතු. වහා නො නික්මිය යුතු. ඉදින් පිටත වච්ස් වැටී තිබේ නම් සේදිය යුතු. ඉදින් පුසන් බඳුන පිරීනම් අස්කළයුතු. ඉදින් හැඩි වී තිබේ නම් වැසිකිළිය පිළ ඇතුලු සියල්ල හැමදිය යුතු. වැසිකිළි දිය බඳුනෙහි දිය නැත්නම් දිය දැමිය යුතුයි.

මෙතෙක් විනයානුකූල මහණකමෙහි බාහිර පැත්ත හෙවත් චාරිත්‍ර සීලය සැකෙවින් විස්තර කරණ ලදී. ඉතා ගරුවන්නේ අභ්‍යන්තර පැත්ත යි. එනම් = පරිජි සඟ වෙසෙස් ථූලසි. පචිති ආදී වැළකිය යුතු වාරිත්‍ර ශීලයයි. ඒ වනාහි ඉතා දීර්ඝ වූ යේ විස්තර සහිත ද වෙයි. එය බෙහෙවින්

පොතපතින් ප්‍රකට වූයේ ද වෙයි. එසේම විනයධර ශික්‍ෂාකාමීන්ගෙන් අසා දත හැක්කේ ද වෙයි. එහෙයින් පොත මහත්වන බැවිනුදු අවකාශ ලදෙත් වෙනම පොතක් ලියන අදහසිනුදු ඒ මෙහි නො යෙදීමු.

**වත්තං අපරිපූරෙන්තො – න සීලං පරිපූරති**
**අසුද්ධසීලො දුප්පඤ්ඤො – චිත්තෙකග්ගං න වින්දති**

වත් නො පුරන්නේ සිල් නො පුරයි. අපිරිසිදු සිල්ඇති අඥානයා සිතෙහි එකඟ බවක්- සමාධියක් නො ලබයි.

**"වික්ඛිත්තචිත්තො නෙකග්ගො – සම්මා ධම්මං න පස්සති**
**අපස්සමානො සද්ධම්මං – දුක්ඛා න පරිමුච්චති"**

වික්ෂිප්ත වූ (විසුරුණු) සිත් ඇති සමාධියක් නැත්තේ මනාකොට ධර්මය නො දකී. (අනිත්‍යා දී) ධර්මය නො දක්නේ දුකින් නො මිදෙයි

**"යො වත්තං පරිපූරෙන්තො – සීලම්පි පරිපූරති**
**විසුද්ධසීලො සප්පඤ්ඤො – චිත්තෙකග්ගම්පි වින්දති"**

වත් පුරන තැනැත්තේ සිල් ද පුරයි පිරිසිදු සිල්ඇති නුවණැත්තේ චිත්තෛකාග්‍රතාවය - සමාධිය ලබයි.

**"අවික්ඛිත්තචිත්තො එකග්ගො - සම්මා ධම්මං විපස්සති**
**සම්පස්සමානො සද්ධම්මං – දුක්ඛා සො පරිමුච්චති"**

නො විසිරුණු එකඟ වූ සිත් ඇත්තේ මනාකොට අනිත්‍යාදී ධර්මය දකියි සද්ධර්මය දක්නා වූ හෙතෙමේ දුකින් මිදෙයි.

**'තස්මාහි වත්තං පූරෙය්‍ය – ජිනපුත්තො විචක්ඛණො**
**ඔවාදං බුද්ධසෙට්ඨස්ස – තතො නිබ්බාණමෙහිසි"**

එහෙයින් විචක්ෂණ වූ බුද්ධපුත්‍ර තෙමේ වත් පුරන්නේය. බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ ගේ අවවාදය වූ වත් පිරීමෙන් නිවණට පැමිණෙන්නෙහි ය.

## සූත්‍රානුකූල මහණකම

බුද්ධත්වයෙන් මුල් විසිවන්නිය ශාසනයෙහි කිසිදු කිළුටක් ඇති නොවීය. ප්‍රථම බෝධිය තම්ලද ඒ කාලයේ සූත්‍රානුකූල ධර්මයෙහි පිහිටා පශ්චිමභවික වූ බොහෝ දෙන මාර්ගඵලාවබෝධකොට ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යාව ලැබූහ.

ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යාව ද සරණාගමන ප්‍රව්‍රජ්‍යාව ද ලැබ මාර්ගඵලාවබෝධ කළහ. අල්පරජස්ක වූ (කෙලෙස් අඩු) ප්‍රථම බෝධියෙහි ශාසනගත වූ උතුමෝ බුදුන් රහතුන් ගේ සිරිත් ගරුකොට ගනිමින් සූත්‍රානුකූල ධර්මයන්හි පිහිටමින් මහවනා කෙලෙසුන් නැසූහ.

**"සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති"**

ඔහු මෙසේ පැවිද්දෙක් වූයේ භික්ෂූන්ගේ ශීල ජීවිතයට බැස්සේ ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළකුනේ වෙයි. යනාදීන් නොයෙක් සූත්‍රාන්තයන්හි මේ ප්‍රකාශවනුයේ සූත්‍රානුකූල මහණකමයි.

එසේම සතිපට්ඨානාදී සූත්‍රාන්තධර්මයන්හි සමථවිපස්සනා භාවනාවන්ට ම ප්‍රධාන ස්ථානය දෙමින් උසස් ප්‍රතිපත්තීන්හි ශ්‍රාවකයන් මෙහෙයැ වීය.

මහා ආර්යවංශප්‍රතිපදා තුවටකප්‍රතිපදා මොණෙය්‍යප්‍රතිපදා රථවිනීතප්‍රතිපදා යනුවෙන් ඒ උත්කෘෂ්ට සූත්‍රානුකූල මහණකම දෙශනාකර වදාරණ ලද්දේය. ආර්යවංශ තුවටක මොණෙය්‍ය රථවිනීත යන සූත්‍රයන්ගෙන් එම ප්‍රතිපදාවන් විස්තරවන්නේය. මෙහිදී ආර්යවංශ ප්‍රතිපදාව අනුව සූත්‍රානුකූල මහණකම විස්තර කරමු.

**"චත්තාරොමෙ භික්ඛවෙ අරියවංසා අග්ගඤ්ඤා රත්තඤ්ඤා වංසඤ්ඤා පොරාණා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා න සංකියන්ති න සංකියිස්සන්ති අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි"**

මහණෙනි, • අග්‍රය උත්තමය ප්‍රසිද්ධය යි දතයුතු වූ ද බොහෝ කලක සිට පැවතෑ එන්නේය යි ද දතයුතු වූ බුදු පසේබුදු මහරහත් පරපුරෙහි හටගත්තේය යි දතයුතු වූ

නාවීත නොවූ බුද්ධාදී උතුමන් විසින් නො විසුරුවා රකින, නො අත්හරින ලද්දා වූ දැනුදු ප්‍රතික්ෂේප නො කරණ අනාගත බුදුවරයන් විසිනුදු ප්‍රතික්ෂේප නො කරණු ලබන ලෝකයෙහි යම් නුවණැති ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් පිළිකුල් නො කරණ නිසා නො කරණ බුදු පසේබුදු මහරහත් පරපුරෙහි හටගත් ධර්මයෝ සතර දෙනෙකි. හෙවත් ඒ බුදු පසේබුදු රහත් උතුමන්ගේ ප්‍රවේණිධර්මපරම්පරාගත සිරිත් සතරකි. එනම්-

**“ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන.”** මහණෙනි, මේ ශාසනයෙහි මහණෙක් යම් ඒ ඕනෑම සිවුරකින් සතුටු වූයේ වේද, දළ සියුම් රළු මෘදු අළුත් දිරූ යම් ඒ ලද සිවුරකින් සතුටුවූයේ වේද යථාලාභ= ලදදෙයින් සතුටුවීම, යථාබල= සියුම් සිවුරක් ලැබ දුබල තමහට දී තමන් බර සිවුරක් ලබා ගැනීම ආදී ශක්ති පරිදි සතුටුවීම, යථාසාරුප්ප= ප්‍රණීත සිවුරු ධර්මධර ආදී වැඩිහිටියන්ට දී තමා රූක්ෂ සිවුරු දැරීමාදී සුදුසු අයුරු සතුටුවීම ය යි, කියනලද ත්‍රිවිධ සන්තොෂයෙන් යුක්ත වීමයි මෙසේ ත්‍රිවිධ සන්තොෂය මනාව ඇතිකර ගැනීමට සිවුරු පිළිබඳ ධුතාඞ්ග සමාදන් විය යුතු ය. සිවුරු පිළිබඳව ධුතාඞ්ග දෙකකි.

එනම්= පාංශුකූලිකාඞ්ගය, හා තෙචීවරිකාඞ්ගය යි. ධුතාඞ්ග නම්= **තෙන තෙන සමාදානෙන ධුතකිලෙසත්තා ධුතස්ස භික්ඛුනො අඞ්ගානි ධුතඞ්ගානි”** ඒ ඒ අඞ්ග සමාදන්වීමෙන් කම්පාකරණලද කෙලෙස් ඇති- කෙලෙස් කම්පාකරණ භික්ෂුවගේ අඞ්ගනුයි ධුතාඞ්ග නම් වෙත්. **“ධුතන්ති ලද්ධවොහාරං ඤාණං අඞ්ගං එතෙසන්ති ධුතඞ්ගානි.”** කෙලෙසුන් කම්පාකරණ හෙයින් ධුත යයි කියනු ලබන නුවණ හේතුවූනට අඞ්ගකොට ඇත්තේනුයි ධුතාඞ්ග නම් වෙත්.

**“ධුතානි ච පටික්ඛානිධුනනතො අඞ්ගානි ච, පටිපත්තියාපි ධුතඞ්ගානි.”** ප්‍රතිපක්ෂ හෙවත් විරුද්ධ කෙලශ ධර්මයන් කම්පාකර හරිණ හෙයින් ධුත වූවාහුත් ඔහු ම ය. ප්‍රතිපත්තියෙහි අඞ්ග වූවාහු ත් ඔහුම ය යි

ධුතාඞ්ගයෝ නම් වෙත්. මේ සියළු ධුතාඞ්ගයෝ සමාදන්
වීමේ චේතනාව ලකුණු කොට ඇත්තාහ. සිවුපසයෙහි
ලොල් බව නිසා ඇතිවන මහත් කෙලෙස් රැසක් දුරුකරමින්
සිවුපසයෙහි ලොල්බවෙන් වැළකීම් සංඛ්‍යාත විරතිචේතනාව
හා යෙදුන කුසල චිත්තචෛතසිකයෝ ධුතධර්ම නම් වෙත්.

සිව්පසයෙහි ගිජු නො වීම වූ අල්පෙච්ඡතාවය, ලද
දෙයින් සතුටුවීම වූ සන්තුට්ඨිතාවය, කෙලෙසුන් ලියාදැමීම වූ
සල්ලේඛතාවය, සමූහයා කෙරෙන් වෙන්වීම වූ පවිවේක-
තාවය, යම් නුවණකින්, ධුතාඞ්ග රැකීම වෙයි ද, එම නුවණ
මෙහි ඇතැයි (ඉදංඅත්ථි) කියන ලද ඉදම්ඨිතාවය, යන
කාරුණු ධුතධර්මයෝ ය.

මෙහි නො ලද ලාභ කෙරෙහි නො ඇලීම් වශයෙන්
පැවැති අල්පෙච්ඡතා සන්තුට්ඨිතාවන් අලෝභයෙහි වැටේ.
ප්‍රත්‍යගෙධය ආදී හේතූන් ද ලොලතා ආදී කෙලෙසුන් ද
මනාකොට කපාදමන හෙයින් හා සමූහ සංසර්ගයෙන් සිත
වෙන්කරණ හෙයින් ද සල්ලේඛතා පවිවේකතා දෙක අලෝභ
අමෝහ දෙක්හි ම වැටේ ආනිසංස සැලකීම අත්තුක්කංසන
පරවම්භනයෙන් වැළකීම ඇති ඉදම්ඨිතාවය ඥාණයෙහි වැටේ.

ධුතධර්ම සමාදානයෙන් ප්‍රතික්ෂේප කරණු ලබන ගෘහපති-
යන් දෙන සිවුරු ආදියෙහි ලෝභය දුරු කිරීමෙන් කාම-
සුඛල්ලිකානුයෝගයත්, නුවණින් සලකා එම පරිත්‍යාගයත්
හේතුකොට කෙලෙසුන් සිඳදැමීමෙන් අත්තකිලමථානුයෝග-
යත් දුරුවේ.

මෙසේ වූම අල්පෙච්ඡ, සන්තුට්ඨ, සල්ලේඛ, පවිවේක,
ප්‍රඥා, යන ධුතධර්ම අලෝභ අද්වේෂ අමෝහ වශයෙන් ධුතාඞ්ග
සමාදාන චේතනාව ත් සමග සමාදාන චිත්ත වීථියෙහි ජවන්-
සිත්හි යෙදීමෙන් කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහා කුසල්
සතරින් එකකින් ධුතාඞ්ග සමාදානය සිද්ධවෙයි. එය ත්‍රිහේතුක
මහාකුසලයෙකි. මේ ජවන් සිතෙක සෝභන චෛතසික
සමග අටතිස් චෛතසික කොතෙක් උත්කෘෂ්ට වශයෙන්
යෙදෙත්.

## පාංශුකූලිකාඞ්ගය

**"ගහපතිදානචීවරං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමි."** යනුවෙන් සමාදන් වූ භික්ෂුව විසින් හීන මධ්‍යම උත්කෘෂ්ට වශයෙන් කැමැති අයුරකින් රක්ෂා හැක. සොහොන් ආදියෙහි දමන ලද රෙදි රැගෙණ මෙම පාංශුකූලිකාඞ්ගය රකින මහණහට සිවුරු පිළිබඳ විසිවැදෑරුම් සතුටක් උපදී. (අංගුත්තර චතුක්කනිපාත අටුවාව බලනු.)

## තෙචීවරිකාඞ්ගය

**"චතුත්ථචීවරං පටික්ඛිපාමි. තෙචීවරිකඞ්ගං සමාදියාමි."** යනුවෙන් තෙචීවරිකාඞ්ගය සමාදන් වියයුතු. අඳනය තනිපට සිවුර හා දෙපට සිවුරත් පමණය, ඔහුට අසිනි වියතක් පළල වූ තුත්රියනක් දිග ඇති අංශකඩයක් පමණක් වැඩිපුර ඇදීමට පාවිච්චි කළ හැක. උත්කෘෂ්ටාදී සියළු භේදයන් විශුද්ධිමාර්ගයෙහි ඇති. මේ ධූතාඞ්ගයත් රැකිම චීවරමහාඅරියවංශය රැකීම යි.

**"ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන."** යනුවෙන් පිණ්ඩපාත මහා ආර්යවංශය දෙසූසේක. ලද යම් පිණ්ඩපාතයකින් සතුටුවන මහණ විසින් **"අතිරෙක ලාභං පටික්ඛිපාමි. පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි."** යනුවෙන් සමාදන් විය යුතු යි. මෙහි අතිරේක ලාභ නම් සංඝිකදානාදී තුදුසක් දන් අත්හැරීම යි. මෙයද උත්කෘෂ්ටාදී සියළු විස්තර විසුද්ධිමාර්ගයෙන් දතයුතු. මතු සියලු ධූතාඞ්ග ගැණත් එසේම ය.

## සපදානචාරිකාඞ්ගය

**"ලොලුප්පචාරං පටික්ඛිපාමි. සපදානචාරිකඞ්ගං සමාදියාමි."** ලොල් වශයෙන් ගෙවල් හැර පිඬුසිඟායෑම ප්‍රතික්ෂෙප කරමි. ගෙපිළිවෙළින් පිඬුසිඟායෑම සමාදන් වෙමි. යනුවෙන් මෙම සපදානචාරිකාඞ්ගය සමාදන්විය යුතු.

## ඒකාසනිකාඞ්ගය

**"නානා භොජනං පටික්ඛිපාමි. ඒකාසනිකඞ්ගං සමාදියාමි"** නොයෙක් වර අහර ගැණීම ප්‍රතික්ෂෙප කරමි.

එක් වරක් අහර ගැණීම සමාදන් වෙමි. යනුවෙන් එකාසනිකඞ්ගය සමාදන් වියයුතු. මෙහි වාඩිවීම ආසන නම්. නොයෙක්වර අහර ගැණීමට වාඩිවීම නානාසන නම්.

**"එකාසනිකස්ස එව අභුඤ්ජිත්වා විසුං විසුං නිසජ්ජාසු ආහාරපරිභොගාභාවතො."** යනුවෙන් එක්වරක් වාඩිවීමේ ඉරියව්වෙන් අහර නො ගෙණ එම ඉරියව්ව බිඳ නැවත නැවතත් අහර ගැණීම නානාසන නම්. මෙයින් එය ප්‍රතික්ෂෙප කොට එක් වරක් එක ඉරියව්වකින් ම අහර ගැණීම සමාදන්වීම යි අදහස.

මෙහි "නානා + අසන" කියාද පද බිදගත හැකියි. "අසන" නම් අහර ගැණීම යි. එවිට ද නොයෙක් නොයෙක් වර අහර ගැණීම ප්‍රතික්ෂෙප කිරිම යි. "එක අසන" එකවරක් අහර ගැණීම යි. අහර ගැණීමේදී වාඩිවී අහර ගත්ට ම ය යි නියමයක් නැත. කෙසේ හෝ එකවරක් අහර ගැණීම මෙහි නියම තේරුම යි.

### පත්තපිණ්ඩිකාඞ්ගය

**"දුතියක භාජනං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි."** දෙවෙනි භාජනයක් ප්‍රතික්ෂෙප කරමි. පත්තපිණ්ඩිකාඞ්ගය සමාදන් වෙමි. එක භාජනයකම තමන් වළඳන සියලු ආහාර ගෙණ වැළදීම මෙයින් අදහස් කරණු ලැබේ. කැඳ පිළිගනිතොත් කැඳ පළමුව පිළිගෙණ වළඳා අනිත් අහර වැළදීම නියම යි.

**"පත්තපිණ්ඩමස්ස අත්ථීති."** එක පාත්‍රයෙහි භොජනපිඩු මොහුට ඇත යනු පත්තපිණ්ඩික යන්නෙහි තේරුම යි. එහෙයින් දෙවෙනි භාජනයක් වශයෙන් කොළයක්වත් ලබාගැණීම නුසුදුසු ය නොයෙක් නොයෙක් භාජනයන්හි ඇති ආහාරයෙහි රස තෘෂ්ණාව දුරුකිරීම මෙයින් ඇති ආනිසංසය යි.

### ඛලුපච්ඡාභත්තිකඞ්ගය

**"අතිරිත්ත භොජනං පටික්ඛිපාමි. ඛලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමි."** අතිරිත්ත භොජනය ප්‍රතික්ෂෙප කරමි.

පවාරණය නොවී තැවත කැපකරවා වැළඳීම ප්‍රතික්ෂෙප කරමි. බත්, බැදපු පිටිවලින් සෑළ අග්ගලා ආදිය, පිට්ටු ආදිය, මස්, මාළු, යන පස් ආහාරයෙන් යමක් වළඳමින් සිටින විට එම පස් ආහාරයෙන් යමක් පිළිගන්වන්ට දෙරියන් හමාර කින් ගෙණ ආවිට පාත්‍රයෙහිත් එම ආහාර ඇත්නම් කයින් හෝ වචනයෙන් බෙදන්නට එළඹූ ආහාරය ප්‍රතික්ෂෙප කිරීමෙන් පාත්‍රයෙහි වූ භොජනය ද ප්‍රතික්ෂෙප වූයේ වෙයි. එය නවම වළඳන භික්ෂුවක් ලවා කැපකරවා වැළඳීම විනය නියමය යි. එසේ කැපකර වැළඳීමක් නැති බව **ඛලුපච්ඡාභත්තිකාඞ්ගය** යි.

මෙහි එකාසනිකාඞ්ගය හා පත්තපිණ්ඩිකාඞ්ගය උපාසක උපාසිකාදීන්ටද නියමිත ය තෙළෙස් ධුතාඞ්ගයෙන් ම මෙම අඞ්ග දෙක පමණක් ගිහිපිරිස උදෙසා බව දතයුතු.

මේ පිණ්ඩපාත- ආහාරය පිළිබඳ ධුතාඞ්ග පහ රැකීමෙන් පිණ්ඩපාත මහා ආර්යවංශය සම්පූර්ණ කෙළේ වෙයි.

## සේනාසන මහා ආර්යවංශය

**“ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන.”** මහණෙනි, මේ සස්නැ භික්ෂුව යම් ඒ සෙනසුනකින් සතුටු වූයේ වෙයි ද යනුවෙන් සේනාසන මහා ආර්යවංශය දෙසූසේක. සේනාසන පිළිබඳ ධුතාඞ්ග පස රැකීමෙන් එය සම්පූර්ණ වෙයි.

## ආරඤ්ඤිකාඞ්ගය

**“ගාමන්ත සෙනාසනං පටික්ඛිපාමි. ආරඤ්ඤිකඞ්ගං සමාදියාමි.”** ග්‍රාමාන්ත සෙනසුන ප්‍රතික්ෂෙප කරමි. ආරණ්‍යකාඞ්ගය සමාදන් වෙමි මෙසේ සමාදන්ව උපචාර සීමාවත් සමග ගම් අත්හැර වනයෙහි විසිය යුතු. ගමේ කෙළවර ගෙයි සිට මධ්‍යම ශක්තිමත් පුරුෂයෙකු විසින් ගසනලද ගලක් වැටුණු තැන සිට බඹ පන්සියයක් හෙවත් සැතපුම් බාගය කුත් බඹ හැටක් දුර වූයේ අරණ්‍ය නම් වේ. එයින් මිහවනයෙහි කුටි සක්මන් ආදී සෙනසුන් පිළියෙළ වූ තැනක හෝ ගල්ගුහා ආදියෙහි වාසය කිරීම සමාදන්වීම යි

### රුක්ඛමූලිකඞ්ගය

"ඡන්නා පටික්ඛිපාමි. රුක්ඛමූලිකඞ්ගං සමාදියාමි." ඡදනය හෙවත් පියස්ස ප්‍රතික්ෂෙප කරමි. රුක්මූල විසීම සමාදන් වෙමි.

### අබ්භොකාසිකඞ්ගය

"ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි. අබ්භොකාසිකඞ්ගං සමාදියාමි." ඡදනයත් රුක්මූලත් ප්‍රතික්ෂෙප කරමි. අභ්‍යවකාශයෙහි සිවුරු හෝ රෙදිවලින් කුටියක් කරගෙණ වාසයකළ හැක. බණ ඇසීම් දත්වැළඳීමාදිය සඳහා ගෙයක් තුළට යා හැක. වාසය සඳහා ගියවිට ධුතඞ්ගය බිඳේ.

### සොසානිකඞ්ගය

"න සුසානං පටික්ඛිපාමි. සොසානිකඞ්ගං සමාදියාමි." සොහොන් ප්‍රතික්ෂෙප නො කරමි. සෝසානිකඞ්ගය සමාදන් වෙමි. මල සිරුරු දවන ලද තැන දෙළොස් හවුරුදු යනතුරු සොහොන් නම් වේ.

### යථාසන්ථතිකඞ්ගය

"සෙනාසන ලොලුප්පං පටික්ඛිපාමි. යථාසන්ථතිකඞ්ගං සමාදියාමි." සෙනසුන්හි ලොල්බව ප්‍රතික්ෂෙප කරමි. යථාසන්ථතිකඞ්ගය සමාදන් වෙමි. මෙහි යථාසන්ථත නම් යම් යම් ඒ ආකාරයකින් පිළියෙල කොට තිබුණේ හෝ වේවා එය තමන්ට ලැබුණොත් භාරගැණීම යි.

මේ ආවාස පිළිබඳ ධුතඞ්ග පස මනාව රැකීමෙන් සේනාසන මහාආයතීවංශය සම්පූර්ණ වේ.

### නෙසජ්ජිකාඞ්ගය

"සෙය්‍යං පටික්ඛිපාමි. නෙසජ්ජිකඞ්ගං සමාදියාමි" නිදීම ප්‍රතික්ෂෙප කරමි. නෙසජ්ජිකඞ්ගය සමාදන් වෙමි. නිසජ්ජ නම් පිට දිගහැර නිදීම යි

මේ වනාහි නො නිද භාවනා කිරීම පිළිබඳ නියම කරණලද ධුතඞ්ගයකි. "අට්ඨ මාසෙ ඛො අහං දෙවදත්ත, රුක්ඛමූලසෙනාසනං අනුඤ්ඤාතං," (චුල්ලවග්ග) දෙවදත්ත, වස් සාරමාසය හැර ඉතිරි අටමස මම රුක්ඛමූල සේනාසනය

අනුදනිති. අබ්භොකාසිකඞ්ගය ද මෙයට අනුගත ය. එහෙත් විසුද්ධිමග්ගයේ උත්කෘෂ්ට ධුතධරයාට වස් සාරමාසයක් නියමිත ය. සූත්‍රානුකූල මහණකම කරණ භික්‍ෂුව මේ තෙළෙස් ධුතාඞ්ගයෙන් හැකි පමණක් රැක භාවනාවක යෙදිය යුතු. මේ ධුතඞ්ග පිළිබඳ විසුද්ධිමග්ගයේ සම්පූර්ණ විස්තර පැණේ. පොත මහත්වන හෙයින් මෙහි නො ලියනලදී.

“තමා යෙහෙන පමණක් ධුතාඞ්ග සමාදන් විය යුතු.” (මහාවිහාර හෙවත් දඹදෙනි කතිකාවත)

## භාවනාරාමතා ආයසීවංශය.

**“පුන ච පරං භික්ඛවෙ, භික්ඛු භාවනා රාමො හොති භාවනා රතො, පහාණාරාමො හොති පහාණ රතො.”**

මහණෙනි, නැවත ද භික්‍ෂුව භාවනායෙහි රමණය කරන්නේ ඇලුණේ වේ ද, කෙලෙසුන් දුරුකිරීමෙහි- ප්‍රහාණයෙහි රමණය කරන්නේ ඇලුණේ වේද යන සූත්‍ර ප්‍රදේශයෙන් භාවනාරාමිතා මහා ආයසීවංශය විස්තර කර වදාළසේක.

**‘භාවෙතීති භාවනා’** සිත දියුණු කෙරේනුයි- වඩානුයි භාවනා නම් වේ. එනම් සමථ සහ විදර්ශනා භාවනා යැ යි දෙකොටසෙකි.

සූත්‍රානුකූල මහණකමෙහි සතර වැනිවූ භාවනාරාමතා ආයසීවංශය, සමථ විදර්ශනා දෙපරිද්දෙන් ම දක්විය හැක. විදර්ශනා භාවනාව මතු අභිධර්මානුකූල මහණකමෙහි විස්තර වන හෙයින් මෙහිදී සමථ භාවනාවක් විස්තර කරණු ලැබේ.

## භාවනාවට නුසුදුසු කල්

1 **ජිණ්ණො හොති** = බොහෝ වයස්ගතවැ දිරූයේවේද,

2 **ව්‍යාධිතො හොති** = බලවත් රෝදුකින් පෙළුණේවේද,

3 **දුබ්භික්ඛං හොති** = දුර්භික්‍ෂ කාලයක් වේද,

4 **භයං හොති අටවිසඞ්කොපො** = සොරුන් නිසා කොල්ලකෑම් වනය කැලැඹීම් ආදී භය පැමිණියේද,

5 **සඞ්ඝො භින්නො හොති** = සංඝයා බිඳුණේ වේද, යන කරුණු පස ඇති කල්හි භාවනා කිරීමෙන් උසස් ඵල ලැබීම දුෂ්කර ය.

## භාවනා කරන්නහුගේ අඞ්ග පසකි

1 **සද්ධෝ හොති** = බුදු ගුණ දැන පැහැදුණු ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වේද, 2 **අප්පාබාධො හොති** = ස්වල්ප වූ ආබාධ ඇත්තේ වේද, 3 **අසඨෝ හොති අමායාවී** = කෛරාටික නොවූයේ බොරු පෙන්වීමෙන් තොරවූයේ වේද, 4 **ආරද්ධ-විරියො හොති** = පටන්ගන්නා ලද වීයර්‍ය ඇත්තේ වේද, 5 **පඤ්ඤවා හොති** = ප්‍රඥ ඇත්තේ වේද, යන කරුණු පසින් භාවනානුයෝගියා යුක්ත විය යුතු ය.

තවද මේඝිය සූත්‍රයෙහි

"**තෙනච පන මෙඝිය භික්ඛුනා ඉමෙසු පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය, චත්තාරො ධම්මා උත්තරිං භාවෙතබ්බා අසුභා භාවෙතබ්බා රාගස්ස පහාණාය මෙත්තා භාවෙතබ්බා ව්‍යාපාදස්ස පහාණාය, ආනාපාන සති භාවෙතබ්බා විතක්කුපච්ඡෙදාය, අනිච්ච සඤ්ඤා භාවෙතබ්බා අස්මිමාන සමුග්ඝාතාය.**"

මේඝිය, එම භික්ෂුව විසින් මේ පඤ්චධර්මයන්හි පිහිටා මතුයෙහි සතර "ධර්ම"යක් වැඩිය යුත්තාහ. රාගය දුරු කිරීම පිණිස අසුභ භාවනාවද, ව්‍යාපාදය දුරුකිරීම පිණිස මෛත්‍රී භාවනාවද, විතර්කයන් නැසීම සඳහා ආනාපානසති භාවනාවද, "මම වෙමි" යන මානය නැසීම පිණිස අනිත්‍ය සංඥාවද, වැඩිය යුතු. මේ සූත්‍රයේ දී කරුණු පසකින් මතු භාවනා වඩන්නට නියම කරණ ලදි.

එම කරුණු නම් = කල්‍යාණ මිත්තතා, සීලසම්පදා, ධම්මසවණං, විරියං, පඤ්ඤා, යනුයි "**අපරිපක්කාය මෙඝිය චෙතොවිමුත්තියා පඤ්ච ධම්මා පරිපක්කාය සංවත්තන්ති.**',

(මේඝිය නො මේරූ - දියුණු නො වූ සමාධිය දියුණු කරගැණීම පිණිස කරුණු පසක් වෙති.)

1 කල්‍යාණ මිත්තතා = උසස් ශීලයක පිහිටි ධර්මය දන්න උගත් භාවනානුයෝගී කල්‍යාණ මිත්‍රයකු ඇසුරුකිරීම,

2. සීල සම්පදා = පිරිසුදු ගිහි හෝ පැවිදි ශීලයක පිහිටීම (සතර සංවර ශීලය)

3. ධම්මසවණං = සප්පාය ධර්ම කථාවන් දශකථාවස්තූන් ඇසීම,

4. විරියං = දුක් කෙලෙස් තවන වීර්‍යය,

5. පඤ්ඤා = වැඩීමට පැමිණි නුවණ, සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් සැලකීමට හැකි නුවණ යන මේ කරුණු පසෙහි භාවනානු යෝගියෙකු පිහිටිය යුතුය. ඉක්බිති කල්‍යාණමිත්‍ර ආචාර්ය භික්ෂූන් වහන්සේ කරා පැමිණ තමන්ගේ චරිත්‍රානුකූල භාවනාවක් මනාව ඉගෙණ භාවනා කළ යුතුයි.

මේ සූත්‍රයෙහි සඳහන් ආනාපානසති භාවනාව කාම, ව්‍යාපාද, විහිංසා, සහ සියලු අකුශල විතර්කයන් දුරුකිරීම සඳහා නියමකර වදාළ හෙයින් එය මෙහි දක්වනු ලැබේ. සියලු බුද්ධවරයන් වහන්සේලාම මේ ආනාපානසති කර්මස්ථානය වඩා ලොව්තුරා බුදුබව ලබන හෙයින් මෙය "සර්වඥගත මූලකර්මස්ථාන" යයි. එසේම ප්‍රණීත වූ ද සතර සතිපට්ඨාන යම වැඩෙන්නා වූ ද බුද්ධ ධර්මයෙහි මූලික භාවනාව වූ ද මෙම "ආනාපානසති" භාවනාව නුවණැතියන් විසින් පුහුණු කටයුතු.

"නාහං භික්ඛවෙ මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ආනාපානසති කම්මට්ඨානං වදාමි" මහණෙනි, මම මුළා වූ සිහි ඇති මනා නුවණක් නැත්තහුට ආනාපානසති භාවනාව නො කියමියි නියම කළ හෙයින් සිහි නුවණ ඇතිවම මෙය වැඩිය යුතු.

තවද භාවනා කරන්නහු විසින් සිහියේ තබාගතයුතු කරුණක් නම් තමන්ගේ සිත පිළිබඳව දැනගැනීම යි. සිතෙහි වැඩකරණ ඉන්ද්‍රිය ධර්මයන් සමතත්වයකට පත්කර ගැණීම යි එනම් = සද්ධා - පඤ්ඤා, සමාධි - වීර්‍ය, යන සතර ඉන්ද්‍රිය ධර්මයන් සමතත්වයට නගා ගැණීමත් ඒ සඳහා සති හෙවත් සිහිය ඒ අතර කෙරෙහිම හෙවත් "තෙරුවන් ගුණ මෙනෙහි කිරීමාදියෙන් ශ්‍රද්ධාව ඇති වූ විට ප්‍රඥුවත් ඒ සමඟ තිබේ ද වීර්‍ය සිතෙහි වැඩකරණ කල්හි එකඟකම තිබේදැයි සොයා බැලිය යුත්තේ සිහිය යෙදවීමෙනි. බොහෝ සෙයින් ශ්‍රද්ධාව සමඟ මෝඩකමත් වීර්‍ය සමඟ ඖද්ධත්‍යය හෙවත් නො සන්සුන් කමත්, එක්වනු සිරිති. එසේම ප්‍රඥුව සමඟ කෛරාටික කමත් එකඟකම හෙවත් සමාධිය සමඟ

ථීනමිද්ධය (චිත්ත චෛතසිකයන් ගේ කම්මැලිකම) ත් මිතුරු ය. එසේ හෙයින් ශ්‍රද්ධා- ප්‍රඥා- වීර්‍ය්‍ය- සමාධි යන සතර එක සමතත්වයකට තබාගැනීම සඳහා සිහියෙන් සොයා බලා සෑම ක්‍රියාවක් පාසාම සිහිය යෙදවිය යුතු.

නියමිත භාවනාව පටන් ගැනීමට මත්තෙන් දන්නා පමණින් බුදුරජාණන් වහන්සේ ගේ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය, තිඤක දමන, රූපකාය සම්පත්තිය, සම්‍යක්සම්බෝධි ඥානය ආදී උසස් බුදුගුණ ද ඒ බුද්ධ උත්තමයන් වහන්සේ පවා අනිත්‍යතාවයට ගිය බව මෙනෙහි කිරීමෙන් ද මෙසේ ශ්‍රද්ධා ප්‍රඥාවන් ඇතිකරගත යුතු. එසේ වේගයෙන් ශ්‍රද්ධා ප්‍රඥාවන් වැඩෙන විට සිරුර ලොමුදැහැ ගන්වමින් සිත ප්‍රීතියෙන් පිනායන්නේය.

එසේම සියලු පණ ඇති නැති දේවල් අභාවයට යන බවත් ඒ අනුසාරයෙන් තමන්ගේ ශරීරය ද අභාවයට යන බව, තමනුත් අනුනුත් මරණයට යන බව, මෙනෙහි කොට සංවේගය ඇතිකරගත යුතු. **'සංවිග්ගො යොනිසො පදහති'** "සංවේගවත් තැනැත්තේ නුවණින් වීර්‍ය්‍යය කෙරේ" යැයි වදාළ හෙයින් සංවේගය මුල්කොට බලවත් වීර්‍ය්‍යයක් ඇතිකර ගත යුතු. තමනුත් සියලු සත්වයනුත් කෙරෙහි මෙත් සිත පැතිරවීමෙන් සිත මෘදු වී වහා එකඟ බවට සමාධියට පැමිණෙන්නේ ය. මෙසේ බුද්ධානුස්සති- මෛත්‍රී භාවනාවන් මරණසති නියමිත භාවනාවට පෙර සිත කෙලෙසුන්ගෙන් ආරක්‍ෂාකර දෙමින් බාහිර උපද්‍රව ද මැඩලන හෙයින් ආරක්‍ෂා භාවනායැයි කියනලදී. අසුභ කම්සටහන ද මරණානුස්සතිය ළඟට ඇද ගැනීම රාගචරිතයාට සප්පාය වේ. මෙසේ බුද්ධානුස්සතියෙන් ශ්‍රද්ධා ප්‍රඥාත්, මරණානුස්සතියෙන් වීර්‍ය්‍යයත් මෛත්‍රියෙන් සමාහිත තාවයත් ඒ සැමතැනම සමෘතියත් දියුණු කරගෙණ, මෛත්‍රී සිත් පරම්පරාවෙන් නියමිත භාවනා අරමුණට සිත යෙදවිය යුතු.

## පූර්වකෘත්‍යය

1 සැලබලං නැති විවේකස්ථානයක් සොයාගතයුතු. 2 බීමට පැන් හෝ යම් දෙයකුත් මල් සුවඳ දුම් හා රාත්‍රියෙහි නම් පොල්තෙල් පහණකුත් පිළියෙල කරගත යුතු. 3 මුහුණ

අත් පා දෙවා පිරිසිදු ඇඳුමෙන් යුතුව උස් අසුනක- ප්‍රතිමා- වක් ඉදිරියේ හෝ මල් පහන් සුවඳ දුම් පුද, වැන්ද යුතු. 4 ඉක්බිති සුදුසු අසුනක බද්ධ පර්‍යඞ්කයෙන් වාඩිවිය යුතු. ආනාපානසති භාවනාවට ශරීරය ඍජුව තිබිය යුතු ය. (ශරීරය කෙළින් සිටින සේ ලෑල්ලකට හෝ යමකට හේත්තු වුව වරද නොවේ ) 5 සිල් බැලිය යුතු. තමා රක්නා ශීලය ඉතා පිරිසිදුව නිසැකව අචංචලව පිහිටියේ නම් වහා සිත එකඟ වන්නේ ය. එපරිදි ශීලයෙහි පිහිටිය යුතු. 6 දෙහොත් මුදුන් කොට වැඳ නමස්කාරය තුන් වරක් කියා "**ඉතිපි සො භගවා පෙ- ති, ස්වාක්ඛාතො පෙ- ති, සුපටිපන්නො පෙ- ති**' යන සූවිසි මහා ගුණය පැහැදිලිව සෙමෙන් කියනු. 7 වැඳගෙණම "**ඔකාස, අහං පටිපත්ති පූජාය ඕවාදං සබ්බඤ්ඤු ගොතමස්ස පතිකරොමි**" (තුන්වරක්) (අවසර, මම ප්‍රතිපත්ති පූජාවෙන් ගෞතම සර්‍වඥයන් වහන්සේ පුදන්නට යැයි කළ අවවාදයට අනුව පිළිපදිමි. භාවනා කරමි.) මේ පොරොන්දුවෙන් කර්මස්ථානය සමාදන් වූයේ වෙයි. 8 දුන් සිහි ඇතිව වම් අත්ල පිට දකුණු අත්ල සිටින සේ අරම්ණිය මත තබා දූනට මඳක් වෙරදී ඇස් දෙක මඳක් අඩවල් කොට තැවත මඳ වේලාවක් බුදුරදුන් තමන් ඉදිරියේ වැඩ ඉන්නා බව සිතා බුදුගුණ මෙනෙහි කොට තමන්ගේ ජීවිතය බුදුරජාණන් වහන්සේට පරිත්‍යාග කරණු, පූජා කරණු "මාගේ ජීවිතය බුදුපියාණන් වහන්සේට පූජා කරමි. පූජාවේවා! ධර්මරත්නයට මාගේ ජීවිතය පූජා කරමි, පූජාවේවා! සඞ්ඝරත්නයට මාගේ ජීවිතය පූජා කරමි, පූජාවේවා! කල්‍යාණ මිත්‍ර ආචාර්‍යරත්නයට පූජාකරමි, පූජාවේවා!" මෙසේ ජීවිත පරිත්‍යාගයෙන් ශ්‍රද්ධා ප්‍රඥවන් ඇතිකරගත යුතු. 9 මරණානුස්මෘතිය මුලින් සඳහන් කළ අයුරු මෙනෙහි කිරීමෙන් වීර්‍යය වඩා ගත යුතු. 10 තමන් වෙත එක්වරක් හා සියලු සතුන් වෙතද ආරක්ෂක දෙවියන් ඇතුලු සියලු දෙවිබඹුන් වෙත ද මාර දෙවියන් වෙත ද මෙත්කොට මෛත්‍රී චිත්තපරම්පරාවන් ම භාවනා අරමුණට හිත යොදවනු.

(මතු සතිපට්ඨාන භාවනාවේ පූර්වකෘත්‍යයද බලනු.)

**ආන—අපාන = ආනාපාන**

ආශ්වාස කරමි. ප්‍රශ්වාස කරමි. (නාසිකාවෙහි හෝ උඩු

නාසලෙහි හුස්ම ගැවෙන තැන සිහිය තබනු- මෙනෙහි කරණු ) ආශ්වාස කරමි - ප්‍රශ්වාස කරමි. (නාසයෙන් ඇතුල්ව ගිය හුස්ම හෝ පිටව ගිය හුස්ම මෙනෙහි නොකරණු. හුස්ම ගැවීම පමණක් මෙනෙහි කරණු.)

(ආශ්වාස කරමි - වෙනුවට හුස්ම ගනිමි කියාද ප්‍රශ්වාස කරමි වෙනුවට හුස්ම හෙලමි කියාද භාවනා කළ වරද නොවේ.)

හුස්ම ගනිමි - හෙලමි ගනිමි - හෙලමි
(හුස්ම ගැ වෙන තැනම සිහිය පිහිටුවා ගතයුතු.)

මෙසේ = "**සො සතොව අස්සසති - සතො පස්සසති**"

ඔහු සිහි ඇතිව ආශ්වාස කෙරේ. සිහි ඇතිව ප්‍රශ්වාස කෙරේ.

"**දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති
දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති**"

ආශ්වාස කිරීම දීඝී වශයෙන් පවතී නම් හුස්ම බොහෝ වේලාවක් නාසිකාවෙහි හෝ උඩුතොලෙහි ගැටෙමින් ඇතුළට ඇදේනම් දීඝීව ආශ්වාස කරමියි වැටහෙයි. එසේම දීඝී වශයෙන් හුස්ම පිටවේ නම්, දීඝී වැ හුස්ම පිටකරමි යි ප්‍රශ්වාස කරමියි වැටහෙයි.

**රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති
රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති**"

හ්‍රස්ව (කෙටි) වශයෙන් හෙවත් ඉක්මණින් ඉක්මණින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නේ හ්‍රස්ව වශයෙන් ආශ්වාස ප්‍රශ්වාස කරමියි වැටහෙයි. හුස්ම ගැණීම කෙරෙන්නේ එක්කෝ දීඝී වශයෙනි, නැතහොත් හ්‍රස්ව වශයෙනි. තමන් ආශ්වාස ප්‍රශ්වාසයන් ගැටීම වශයෙන් අරමුණු කරණ වේලෙහි ආශ්වාස ප්‍රශ්වාසයන් පවතින්නේ දීඝී වශයෙන් ඇදෙමින් ද නැත්නම් හ්‍රස්ව වශයෙන් ඉක්මනින් දූයි අරමුණු කරනවා විනා ඕනෑකමින් දීඝී හ්‍රස්ව වශයෙන් හුස්ම ගැනීම් හෙලීම නො කටයුතු. මෙහි දීඝී හ්‍රස්ව යන කාල පරිච්ඡේදයන් අනුව අවලොස් අයුරකින් "ආනාපාන" කම්ස්ථානය වැටහෙයි.

1. දීඝී වේලාවක් **ආශ්වාස** පැවතීමේ දී දීඝී වේලාවක් ආශ්වාස කෙරෙමියි වැටහිම

2. දීඝී වේලාවක් **ප්‍රශ්වාස** පැවතීමේදී දීඝී වේලාවක් ප්‍රශ්වාස කෙරෙමියි වැටහෙයි.

3. දීඝී වේලාවක් **ආශ්වාස ප්‍රශ්වාස** පැවතීමේ දී දීඝී වේලාවක් ආශ්වාස ප්‍රශ්වාස කෙරෙමියි වැටහෙයි.

4. ඡන්ද (භාවනා කරණු කැමැත්ත) වශයෙන් වඩා සියුම් වූ දීඝී **ආශ්වාසය** වැටහෙයි.

5 ඡන්ද වශයෙන් වඩා සියුම් වූ දීඝී **ප්‍රශ්වාසය** වැටහෙයි.

6 ඡන්ද වශයෙන් වඩා සියුම් වූ දීඝී **ආශ්වාස ප්‍රශ්වාස**යන් වැටහෙයි.

7 ප්‍රමොද්‍ය (ප්‍රීතියෙහි මූල් අවස්ථාව) වශයෙන් වඩා සියුම් වූ දීඝී **ආශ්වාසය** වැටහෙයි

8. ප්‍රමොද්‍යය වශයෙන් වඩා සියුම් වූ දීඝී **ප්‍රශ්වාස** වැටහෙයි

9. ප්‍රමොද්‍යය වශයෙන් වඩා සියුම් වූ දීඝී **ආශ්වාස ප්‍රශ්වාසයන්** වැටහෙයි

මෙසේම හ්‍රස්ව වශයෙනුදු නව අයුරකින් වැටහේ. ඇතැමෙකුට ආශ්වාසය හොඳින් වැටහෙයි. ඇතැමෙකුට ප්‍රශ්වාසය වැටහෙයි. ඇතැමෙකුට දෙකම හොඳින් වැටහෙයි. පළමුව එයක් වැටහුණ ද ක්‍රමානුකූලව භාවනා කිරීමේ දී දෙකම වැටහෙයි. මේ පුද්ගල භෙදය නිසා දීඝී හ්‍රස්ව ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කොට අටක්ලෙසක් ආනාපාන සති ප්‍රභේද ප්‍රතිසම්භිදායෙහි දක්වන ලද අයුරු යි.

මෙසේ දීඝී ආශ්වාස දීඝී ප්‍රශ්වාස හ්‍රස්ව ආශ්වාස හ්‍රස්ව ප්‍රශ්වාස යන සතර අයුරකින් භික්ෂුවගේ නාසිකාග්‍රයෙහි හෝ උඩුතොලෙහි නිමිත්ත පවතී.

**"සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති,**
**සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති."**

සියලු ආශ්වාස ප්‍රශ්වාස (කය) සමූහය නැවත නැවත සකසා මුල මැද අග වශයෙන් දැන ආශ්වාස කෙරෙමියි ප්‍රශ්වාස

කෙරෙමියි හික්මෙයි. ආශ්වාසයාගේ මූල නාසිකාග්‍රය ය. මැද- හෘදය ය. අග නාභිය ය. ප්‍රශ්වාසයා ගේ මූල- නාභිය ය, මැද- හෘදය ය. අග- නාසිකාව ය. මෙසේ ආශ්වාස ප්‍රශ්වාසයන් මනාව වටහා ගැණීමේදී යෝගියා ඥාණසම්ප්‍රයුක්ත කාමාවචර කුශල ජවන් සිතකින් ම ආශ්වාස ප්‍රශ්වාස කරයි. "සික්ඛති" යනු යොදන ලද්දේ එහෙයිනි.

මෙසේ උත්සාහ කිරීමේ දී, "අතීතභවඞ්ග, භවඞ්ගචලන, මනොද්වාරාවජ්ජන, පරිකම්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ" යන ධ්‍යාන වීථිය පිළිබඳ වූ ඥාන සම්ප්‍රයුක්ත කාම ජවන් සතරෙන් එකක් පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ නාමයෙන් උපදනා බව මෙයින් කියැ වේ. මෙහිදී යම්බඳු සංවරයක් ඇතිවේ ද එය අධිශීල ශික්‍ෂාව ය. යම්බඳු සමාධියක් වේද එය අධිචිත්ත ශික්‍ෂා ය. යම්බඳු නුවණක් වේද එය අධි ප්‍රඥා ශික්‍ෂා ය. මේ ත්‍රිවිධ ශික්‍ෂාවෙහි, එම ආශ්වාස ප්‍රශ්වාස අරමුණ සිහියෙන් මෙනෙහි කිරීමෙන් හික්මෙයි.

"පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති.
පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති."

ආශ්වාස ප්‍රශ්වාස සංඛ්‍යාත කායසංස්කාරය සංසිඳවමින් ආශ්වාස කෙරෙමි යි ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙ යි.

ආශ්වාස ප්‍රශ්වාස නම් වායෝ ධාතුව අධිකව ඇති අවිනිර්භොග ශුද්ධාෂ්ටක රූප කලාප සමූහයයි දත් එය චිත්තසමුට්ඨාන නමුදු කරජකාය යැයි කියනු ලබන ශරීරය පිළිබඳවූ පවත්නා හෙයින් කරජ කායයෙන් සකස් කෙරේනුයි කාය සඞ්ඛාර නම් වේ.

සියුම්වූ ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් මෙසේ භාවනා වඩන යොගියාගේ සිතෙහි අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥාවන් යෙදේ. (මෙහි දීඝ හ්‍රස්ව වශයෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කිරීමේදී උද්ග්‍රහනිමිත්ත ලැබිය යුතු ය. "සබ්බකාය පටිසංවේදී- පස්සම්භයං කාය සඞ්ඛාරං" යන දෙවිදියෙන් ආශ්වාස, ප්‍රශ්වාසයන් භාවනා කිරීමේ දී ප්‍රතිභාග නිමිත්ත හා ධ්‍යාන අවස්ථාව බව යැගේ )

තවද අර්ථකථා දේශනාව අනුව, "ගණනා, අනුබන්ධනා, ඵුසනා, ඨපනා" යැයි (පළමු) යොගියා විසින් (ආදිකම්මික) ප්‍රථමධ්‍යානය දක්වා භාවනා වැඩිය යුතු අයුරු දක්වන ලදී.

එහි දීඝී ආශ්වාස ප්‍රශ්වාසයන් පවත්නා කල හුස්ම ගැණ්මේදී නාසයෙහි ගැටෙන තැන සිහිය පිහිටුවා, එකයි- එකයි යනුවෙන් හුස්ම පිටවන තුරු (ප්‍රශ්වාසය එනතුරු) ද ප්‍රශ්වාස වාතය ගැටී පිටවිමේදී දෙකයි, දෙකයි යනුවෙන් නැවත ආශ්වාසය එනතුරුදයි-

මෙසේ 1 ආශ්වාසය = එකයි- එකයි- එකයි
2 ප්‍රශ්වාසය = දෙකයි- දෙකයි- දෙකයි
3 ආශ්වාසය = තුණයි- තුණයි- තුණයි
4 ප්‍රශ්වාසය = සතරයි- සතරයි- සතරයි
5 ආශ්වාසය = පහයි- පහයි- පහයි

පහෙන් නවතා නැවත එකේ සිට එම ක්‍රමයට සය දක්වා ද- සයෙන් නවතා නැවත එකේ සිට සත දක්වා ද- සතෙන් නවත්වා නැවත එකේ සිට අට දක්වාද- අටෙන් නවතා නැවත එකේ සිට නවය දක්වා ද- නවයෙන් නවතා නැවත එකේ සිට දසය දක්වා ද දසයයි දසයයි යන ක්‍රමයෙන් ගණන් කරණු. දසයෙන් නවතා නැවත එකේ සිට නවය දක්වා ද- නවයෙන් නවතා නැවත නැවත එකේ සිට අට දක්වා ද- අටෙන් නවතා නැවත එකේ සිට සත දක්වා ද- සතෙන් නවතා නැවත එකේ සිට සය දක්වා ද- සයෙන් නවතා නැවත එකේ සිට පහ දක්වා ද ආශ්වාස ප්‍රශ්වාසයන් ගණිමින් අරමුණු කරණු පහෙන් පහළ නොබැස්විය යුතු. දසයෙන් ඉහල නො නැංවිය යුතු.

හ්‍රස්වව හෙවත් ඉක්මණින් ආශ්වාස ප්‍රශ්වාස පිටවෙයි නම් "එකයි - එකයි" යනුවෙන් ප්‍රමාද නොවී එක - දෙක- තුණ- හතර- පහ- එක- දෙක - තුණ- හතර- පහ- හය- මෙසේම ගණිනු දහයෙන් උඩට නොයනු- පහෙන් පහලට ද නොයනු. මෙසේ භාවනා කල හැක්කේ දීඝී ආශ්වාස - ප්‍රශ්වාස හ්‍රස්ව ආශ්වාස - ප්‍රශ්වාස යන සතර පමණකි.

## අනුබන්ධනා නම

ආශ්වාස ප්‍රශ්වාසයන් අනුගමිත වශයෙන් සිතිය පැවැත්වීම යි. සිතිය ස්පර්ශවන තැනින් වාතය අනුව නොයවා එතනම සිතිය පිහිටුවා අනුගමනය කිරීම මෙයින් කියන ලදී.

ඵුසනං නම් = හුස්ම ගැටෙන තැන සිතිය පිහිටුවා ගැනීම යි. ඨපනා නම් = මනාව අරමුණෙහි සිත තැංවීම හෙවත් අර්පණා යි. අර්පණ මෙහි ආදි කාර්මිකයා හෙයින් ප්‍රථමධ්‍යානය යි. (මෙහි ගණනා අවස්ථාව සම්පූර්ණවීම උද්ග්‍රහ නිමිත්ත ලෙසද අනුබන්ධනා ඵුසනා ප්‍රතිභාග නිමිත්ත වශයෙන් ද ඨපනා අර්පණා අවස්ථාව වශයෙන් ද ගැණේ ) මෙහි නිමිත්ත හෙවත් ස්පර්ශවන තැන සිත පිහිටුවීම ද ආශ්වාසය ද ප්‍රශ්වාසය ද එක සිතකට නොව සිත් තුණකටම අරමුණු වෙයි එහෙත් ආශ්වාස ප්‍රශ්වාසයන් අරමුණු කරන්නේත් ස්පර්ශය අරමුණු කරන්නේත් එක තැනය. මේ අරමුණු තුණම එකක් මෙන් වැටහීමෙන් නො ෆ පෙණෙන්නා වූ වායුව ඒ ඒ අයගේ පරිකල්පනානුකූලව, පෙණෙන්නාක් මෙන් හෙවත් = තාරකා රූප, මැණික් ගුලි, මුතුගුලි, පුළුන් ඇට මෙන් ද තාසයේ සිට පපුව දක්වා තද ලී කැබෙල්ලක් මෙන් ද, දික් හවඩියක්, මල්දමක්, දුම්සිළුවක්, වලාපටලයක්, සුදු නෙලුම්, රථරෝද, සඳමඬල, ඉරුමඬල, ආදී වශයෙන් ද පෙණෙයි. මෙහි තාරකා රූපාදී කුඩා නිමිති උද්ග්‍රහ නිමිති වශයෙන් ද මැණික් ගුලි සඳමඬල ඉරුමඬල ආදී මහත් නිමිති ප්‍රතිභාග නිමිත්ත වශයෙන් ද ගැණීම ආචාර්‍ය්‍ය නියමය යි.

තවද ආශ්වාස, ප්‍රශ්වාස, ස්පර්ශ-නිමිත්ත, යන තුණෙහි සිත එකතැන් වීමේදී ශරීරය උඩට ඔසවා ලන අයුරු දැනේ. මේ උද්ග්‍රහ නිමිත්ත ඇතිවීමට තරම් සිත සියුම්ව නානා අරමුණින් තොරව පැවතීම ය.

### ආදිකර්මිකා ප්‍රථමධ්‍යාන වීථිය.

නි – න – ද – ම – ප – උ – අ – ගො – ඣා – භ – භ
ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo

මෙහි පරිකර්ම උපචාර අනුලෝම, ගොත්‍රභූ, යනුවෙන් දක්වන ලද්දේ මූල සඳහන් කළ ඥානසම්ප්‍රයුක්ත කාම ජවන්

සතරෙන් එකකි. අපීණ නම් ප්‍රථමධ්‍යානය යි. මෙසේ ප්‍රථමාදි ධ්‍යාන ලබාගත් කැනැත්තහු =

"**පීති පටිසංවෙදී**" ආදී වශයෙන් දක්වන වෙදනා, චිත්ත, ධම්ම, යන සතර සතිපට්ඨානයන් වඩා මාර්ගඵලාවබොධ කටයුතු. **ආන- ආශ්වාසයයි, අපාන- ප්‍රශ්වාසයයි.**

**මේ භාවනාරාමතා මහා ආර්ය වංශය යි.**

සූත්‍රානුකූල මහණකම නිමියේ ය.

---

**"ඣාය භික්ඛු මා ච පමාදො - මා තෙ කාම ගුණෙ භමස්සු චිත්තං**
**මා ලොහ ගුළං ගිලි පමත්තො - මා කන්දි දුක්ඛමිදන්ති ඩය්හමානො"**

මහණ, භාවනා කරව, ප්‍රමාද නොවව, තොපගේ සිත කාමගුණයන්හි නො හසුරුව! පමාවී ලොහගුලි නො ගිලුව! මේ දුකැයි දැවෙමින් නො හඬව!

## අභිධර්මානුකූල මහණකම.

අභිධර්මානුකූල මහණකම නම්- විදර්ශනා භාවනානුයෝගී වීමයි. තනිව තැනක වාසය කිරීමට තරම් උගත්කමක් ලද භික්ෂුවට පවා "**සමණධම්ම කරණත්ථං සමාධිවසෙන වා විපස්සනා වසෙන වා අරහත්ත පරියොසාන මෙකං කම්මට්ඨානං**" යනුවෙන් මහණකම් කිරීමට සමාධි වශයෙන් හෝ විදර්ශනා වශයෙන් අර්හත්වය කෙළවර කොට ඇති කමටහණක් උගත යුතුයැ යි නියම කළ හෙයින් විදර්ශනා භාවනාවට අභිධර්මය පිළිබඳ සෑහෙන දැනීමක් භික්ෂුවක විසින් ඇතිකර ගත යුතු ය.

"මහණුවම් කරන්නට අරහත් ඵල දක්වා පැවැති කමට හණුජු **නම් රූ** විනිසයි ඒ උගත්තෝ වියත් නම්" යන සිඛවළඳ විනිස පාඨයෙනුදු එ බව කියැ වෙ.

සතර පරමාර්ථ ධර්මයන්ගෙන් නිවණ හැර චිත්ත චෛතසික හා රූපයන් කැලම විදර්ශනා භාවනා ය. නිවණ ද අනාත්මානුදර්ශනා වශයෙන් විදර්ශනායෙහි අරමුණු වේ. මෙහිදී අභිධර්මය පිළිබඳ දැනීමක් ඇත්තවුන් විසින් ම විදර්ශනා

වැඩිය යුතු බව වැටහෙයි. නුවණැති සෑම බෞද්ධයකුට ම අභිධර්මය දත් කල්‍යාණ මිත්‍රයකු ඇසුරු කිරීමෙන් භාවනා වැඩීමට අවශ්‍ය අභිධර්ම ඥානය ලබාගත හැකි ය.

තවද පඤ්චස්කන්ධය, දොළොස් ආයතන අටළොස් ධාතූන් පිළිබඳ අනිත්‍ය දුක්ඛ අනාත්ම වාක්‍යයන් කිය කියා හෝ සිත සිතා ඉඳීම විදර්ශනා නො වේ. සංස්කාර ධර්මයන් යථා ස්වභාවයෙන් දැන ඉතා වේගයෙන් ඔවුන් ගේ අනිත්‍යතාවය ප්‍රත්‍යක්ෂ කරවීමට නම් පඤ්චමධ්‍යානයෙන් ලත් චිත්ත සමාධියක් හෝ උපචාර සමාධියක් අවශ්‍යමය.

ඉගෙනීම් දැරීම් සිහිකිරීම් වශයෙන් පඤ්චස්කන්ධය, දොළොස් ආයතන අටළොස් ධාතූන්හි සිත නිතර යෙදවීම විදර්ශනා භාවනාවට බහූපකාර ය

විදර්ශනා නම් = ලක්ෂණොපනිධ්‍යානය යි. එනම් සියලු සංස්කාරයන් ගේ අනිත්‍ය ලක්ෂණය, දුක්ඛලක්ෂණය, සියලු ධර්මයන් ගේ අනාත්ම ලක්ෂණය, නැවත නැවත එකඟ සිතින් බැලීම යි. සම්ථයානිකයා ආරම්මණොපනිධ්‍යානයෙන් ලත් සමාධියෙන් සංස්කාරයන් ලක්ෂණොපනිධ්‍යාන වශයෙන් පිරිසිඳ දැන විසංස්කාර බවට පැමිණෙන්නේ ය. හෙවත් නිවන් අවබෝධ කරන්නේ ය.

එහෙත් ශුෂ්කවිදර්ශකයා අනිත්‍යාදි ලක්ෂණයන් ම අරමුණුකොට ලබාගන්නා උපචාර සමාධියකින් හෙවත් විදර්ශනා භාවනා කරණ විට ඇතිවන චිත්තවීථීන්හි ප්‍රබල ඒකාග්‍රතා චෛතසිකයෙන් අනුබල ලත් කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත ජවන් සතරින් යම් ඒ ජවනයකින් පූර්වභාග විදර්ශනාව සම්පූර්ණ කරන්නේය.

**පළමුකොට මේ කරුණු තේරුම් ගත යුතුය.**

ව්‍යවහාරය අනුව අපි මෙසේ කියමු. "ඇසට පෙනෙයි. කණට ඇසෙයි, නාසයට ගඳ සුවඳ දැනෙයි, දිවට රස දැනෙයි, ශරීරයට ස්පර්ශය දැනෙයි, සිතට කලින් කල කී සිතූ දෙයක් හෝ එමෙල්ම ඇසූ දුටු ආදී දෙයක් හෝ අනාගතය ගැණ යමක් හෝ සිතෙයි, මෙසේ නො වන මොහොතක් වේනොත් සිත භවඞ්ග ගතවූ අවස්ථාවෙකි. මෙහි පෙණීම් ඇසීම්

ආදිය කෙසේ සිදුවේ දැයි කල්පනාකර බැලිය යුතුය. ඇසට හෙවත් චක්ෂු ප්‍රසාදයට රූපයක් (වර්ණ රූපයක්) හමුවෙයි. ඇසට අරමුණු වූ රූපය නිසා සිතක් පහළ වෙයි. එය චක්ඛු විඤ්ඤාණය යි. චක්ඛු විඤ්ඤාණය දශීන කෘත්‍යය කරමින් බිඳියයි. සම්පටිච්ඡන සිත ඉපද අරමුණු පිළිගැණෙමින් බිඳියයි. සන්තීරණ සිත අරමුණු සුභ – අසුභාදී වශයෙන් තීරණය කරමින් බිඳී යයි වොත්ථපන සිත අරමුණු ව්‍යවස්ථාපනය (සම්පූර්ණ තීරණය) කරමින් බිඳීයයි. ඉක්බිති අරමුණු රස විඳිමින් ජවන් සිත් සතක් වේගයෙන් ඉපද බිඳි බිඳි යයි. ජවනයන්ම අරමුණු කරමින් තදාලම්බන සිත් දෙකක් ඉපද නැසී යයි. මෙයින් ඒ රූපාරම්මණය ද බිඳියන්නේය. චක්ෂුප්‍රසාද රූපයද බිඳියන්නේ ය. චක්ඛු විඤ්ඤාණ සිත පහළ වන්නට පෙර එම රූපාරම්මණය ගැටීමේදී චේන අරමුණක තිබී භවාඞ්ගගත වූ සිත එම අතීත භවාඞ්ගයද භවාඞ්ග චලනයද භවාඞ්ග සන්තතිය සිඳී ඇමද කුමන දෙරවුවෙකින් පැමිණි අමුණ ගතයුතුදැයි ආවජ්ජනා කරණ පඤ්චචාරාවජ්ජන සිතද යන සිත් ඉපද නිරුද්ධ වන්නේය.

මෙම සිත් දහයන ඉපද බිඳීයනු සමගම එම රූපාරම්මණයද බිඳි යන්නේය. එම රූපාරම්මණය ගත් ඇස හෙවත් චක්ෂුප්‍රසාද රූපයද බිඳී යන්නේය. මෙසේ මේ ලෝකයෙහි කිසිවක් මෙම චිත්තක්ෂණ දහගත ඇතිව නැතිවන ඉතා සුළු කාලයක් පමණක් පවතින්නේය. එහෙත් කර්ම චිත්ත සෘතු ආහාරාදී ප්‍රත්‍ය බලයෙන් පහණෙහි තෙල් තිංබනතුරු නැගි නැගී බිඳි යන පහන් සිල නැවත නැවතත් උපදිමින් පවත්නා සේ අවිච්ඡෙදව පවත්නේ ය.

මෙහි = ඇසත් රූපයත් රූපස්කන්ධය යි.
චක්ඛු විඤ්ඤාණාදි සිත් විඤ්ඤාණස්කන්ධය යි.
ඒ සිත්හි පහළවන වේදනා චෛතසික වෙදනාස්කන්ධය යි.
ඒ සිත්හිම පහළවන සඤ්ඤා චෛතසික සඤ්ඤාස්කන්ධය යි.
ඉතිරි ඵස්සාදී සමපණස් චෛතසික සංස්කාර ස්කන්ධ යි.

කණට ශබ්දයක් අරමුණු වීමේදී ද මෙම ක්‍රමය මැයි. මෙසේ මේ සිත් 17 ක් ඉපද බිඳීම සමගම පඤ්චස්කන්ධයම

ඉපද බිඳෙන්නේය. චිත්තක්ෂණයකට ආයුෂ ඇත්තේ = උත්පාද (ඉපදීම) ස්ථිති (පැවැත්ම) භඞ්ග (බිඳීම) යන ඉතා සුළු ක්ෂණ තුනෙකි. රූපයක් ඉපද නැසෙන විට සිත 17 ක් වරක් ඉපද නැසෙන්නේ ය. මෙතරම් වේගයෙන් ඉපද නැසෙන අනිත්‍යතාවයට යන දෙයක් වෙන නැත. විදුලිය වත් වඩා ශත සහස්‍ර ගුණයෙන් වේගවත් ය. එහෙයින් බුදුරජාණන් වහන්සේ ද සිතේ වේගයට සමකළ හැකි උපමාවක් සොයා ගැනීම අපහසු බව වදාළ සේක.

මෙසේ චිත්තක්ෂණ දහගණනින් දහගණනින් බිඳි බිඳී අනිත්‍යව යන රූප සමූහයත් චිත්තක්ෂණයක් චිත්තක්ෂණයක් පාසා බිඳී බිඳී අනිත්‍යව යන නාම සමූහයත් හැර මේ ලෝකයෙහි අන් කිසිවක් නොමැත. එහෙත් ලෝකයා මුළා වී ඇත. ඒ මුළාව නැතිකර ගැණීම දුකින් මිදීම යි.

සත්ත්වයාය, පුද්ගලයාය, ස්ත්‍රිය, පුරුෂයාය, ආදී සන්තති ප්‍රඥප්ති (නො සිඳ දිගින් දිගට ඇතිවූ පැණවීම) සමූහ ප්‍රඥප්ති (අඞ්ග-උපාඞ්ග සමූහයක් නිසා "රථය" ආදී වශයෙන් ඇතිවූ පැණවීම) ඝනප්‍රඥප්ති ("ගල" ආදී වශයෙන් පඨවි ආදී ධාතූන් සමූහයක් නිසා ඇතිවූ පැණවීම) නාම ප්‍රඥප්ති (ධනපාල ආදී නාම වශයෙන් ඇතිවූ පැණවීම) යන සතර ප්‍රඥප්ති න්ගෙන් නාම රූප ධර්මයන් එහි අනිත්‍ය දුක්ඛ අනාත්මතාවයත් වැසී තිබේ. මේ ප්‍රඥප්තිය බිඳ සියලු ස්ත්‍රී පුරුෂ ගස් ගල් ආදිය නාම රූප වශයෙන් හා ඒ නාම රූපයන් ගේ ක්ෂණික අනිත්‍යතාවය ද එකග වූ සිතට වැටහේ.

**දුන් රූපයක් ඇසට හමුවියැ යි සිතමු** = එවිට ඉගත දක්වූ අයුරු අතීත භවඞ්ගය, එම භවාඞ්ග සන්තානය සෙලවීකැඞී, බිඳී යන්නේ ය. එවිට පඤ්චද්වාරාවජ්ජන සිත ඉපද නැසීයන්නේ ය. චක්ඛු විඤ්ඤාණ සිත ඉපද නැසී යන්නේ ය. සම්පටිච්ඡන, සන්තීරණ වොට්ඨපන, ජවන, තදාලම්බන සිත් ද ඉපද වහා නැසීයන්නේය. ඇසත්- රූපාරම්මණයත් නැසීයන්නේය.

මෙසේ-

තී-න-ද-ප-ච-ස-ණ-වො-ජ-ජ-ජ-ජ-ජ-ජ-ජ-ත-ත
ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo ooo o o

චක්ඛුවාරික අතිමහන්තාලම්බණ චිත්තවීථියේ අයුරින් අනිත් සොතවාරිකාදී සිත් ද ගත යුතු.

මුලින් දක්වූ අයුරු- රූපය අනිත්‍යය, වෙදනාවත් අනිත්‍ය ය, සංඥවත් අනිත්‍ය ය, සංස්කාරයන් අනිත්‍ය ය, විඤ්ඤාණය අනිත්‍යයැ යි, රූපය චිත්තක්ෂණ දහසයෙන් දහසතට ඉපදී- බිඳී නැසෙන්නේ ය. වෙදනා සංඥ සංස්කාර විඥණ යන සතර නාමස්කන්ධය චිත්තක්ෂණයක් පාසා ඉපද බිඳී නැසෙන්නේ ය.

මෙසේ බිඳි බිඳී- ඇතිවෙවී- විනාශවෙවී- අනිත්‍යව යන ලෝකයෙහි සැපයක් නැත. ලෞකික වූ සියල්ලම දුක් ය. දුක්වූ දෙය "මමය මගේ" යැයි ගත නො හැකි හෙයින් අනාත්ම ය. දූන් දොළොස් ආයතනයන් අරමුණු කර විදර්ශනා වඩන්න.

ඇසත් - රූපයත් = අනිත්‍යය,
කණත් - ශබ්දයත් = අනිත්‍යය,
නාසයත් - ගන්ධයත් = අනිත්‍යය,
දිවත් - රසයත් = අනිත්‍යය,
ශරිරයත් - ස්පර්ශයත් = අනිත්‍යය,
සිතත් - එහි අරමුණුත් = අනිත්‍යය,

මෙහි අනිත්‍යයැ යි සිතන විට එම අනිත්‍යතාවය කොතෙක් වේගවත් දැයි වටහා ගතයුතු. වගවගා වැසිබිඳු වැටෙන්නාක් මෙන්, විදුලිය කොටන්නාක් මෙන්, හෙණ පුපුරන්නාක් මෙන් එයටත් ශත සහස්‍ර ගුණයක් වේගයෙන් මේ අනිත්‍යතාවය සිද්ධ බව සලකන්න. ලෝකයෙහි ඒ සියලුම වේගවත් ධර්මයන් සිතට අරමුණු වන හෙයින් සිත ඒ සියල්ලටම වේගවත් ය. මේ වේගවත් අනිත්‍යතාවය අනුව අටලොස් ධාතූන් ද විදර්ශනාවට නගන්න.

1 ඇස, අනිත්‍යය- රූපය, අනිත්‍යය- ඇස නිසා හටගත් සිත් අනිත්‍යය.

2 කණ, අනිත්‍යය- ශබ්දය, අනිත්‍යය- කණ නිසා හටගත් සිත් අනිත්‍යය.

3 නාසය, අනිත්‍යය- ගන්ධය, අනිත්‍යය- නාසය නිසා හටගත් සිත් අනිත්‍යය.
4 දිව, අනිත්‍යය- රසය, අනිත්‍යය- දිව නිසා හටගත් සිත් අනිත්‍යය.
5 ශරීරය, අනිත්‍යය- ස්පර්ශය, අනිත්‍යය- ශරීරය නිසා හටගත් සිත් අනිත්‍යය.
6 මනස, අනිත්‍යය- එහි අරමුණු, අනිත්‍යය- මනස නිසා හටගත් සිත් අනිත්‍යය.

පාළි

1 චක්ඛුං අනිච්චං = රූපං අනිච්චං = චක්ඛුවිඤ්ඤාණං අනිච්චං

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 සොතං | ,, | = සද්දා අනිච්චා | = සොත | ,, | ,, |
| 3 ඝාණං | ,, | = ගන්ධා ,, | = ඝාණ | ,, | ,, |
| 4 ජිව්හා | ,, | = රසා ,, | = ජිව්හා | ,, | ,, |
| 5 කායො | ,, | = ඵොට්ඨබ්බා ,, | = කාය | ,, | ,, |
| 6 මනො | ,, | = ධම්මා ,, | = මනො | ,, | ,, |

ඉහත දක්වූ ආනාපානසති ආදී සමථාරම්මණයකින් දියුණු කරගත් සිතින් හෝ සමාධියට බාධකවූ පවත්නා පළිබෝධ දුරුකොට විවේකයෙන් යුතුව මනා ශීලයක පිහිටා මෙසේ සංස්කාරයන්ගේ අනිත්‍යතාවය භාවනා වඩනු. කලක් යන විට–

“රූපයක් දුටු ඇසිල්ලෙහි, ශබ්දයක් ඇසුණු ඇසිල්ලෙහි, ආදී යම් අරමුණක් පැමිණි කෙණෙහි එය අනිත්‍ය වශයෙන් වැටහී යා නම් සිත අකුසලින් දුරුව කුසලයෙහි පිහිටා සිට ගණී යි. ඔහු බුද්ධ ධර්මයෙන් උසස් ප්‍රයෝජන ලබ යි.

ශාසනයෙහි ආරබ්ධ විදර්ශකයාම දියුණු වූ “ගොත්‍ර භූ” සිත දක්වා වත් විදර්ශනා සිත් ඇතිකරගත් භික්ෂුව ම ශ්‍රමණය, “ඉධෙව භික්ඛවෙ සමණො” යන දේශනාවෙහි ආරබ්ධ විදර්ශක භික්ෂුවත්, සෝතාපත්ති මාර්ගස්ථයාත්, එම ඵලස්ථයාත්, ප්‍රථම ශ්‍රමණයන් වශයෙන් නියම කළසේක.

මෙසේ අභිධර්මානුකූල මහණකමෙහි යෙදෙන භික්ෂුව ඉන්ද්‍රිය බල ආදී ධර්මයන්ගේ දියුණුවීමෙන් දශ විදර්ශනාඥාන

ක්‍රමයෙන් සියලු සංස්කාරයන්ගේ අනිත්‍ය දුක්ඛ අනාත්ම තාවයන් දකියි.

**එවිට** අතීත භවඞ්ග භවඞ්ගචලන, භවඞ්ගුපච්ඡේද වී මනොද්වාරාවර්ජන සිත ද "පරිකර්ම, උපචාර, අනුලොම ගොත්‍රභූ" නාමයෙන් ඥානසම්ප්‍රයුක්ත කාම කුසල් ජවන් සතරින් එකක් ඇතිව නිරුද්ධ වූ පසු අර්පණා වශයෙන් **සොතාපත්ති මග්ග සිත දුක්ඛ දනිමින්, සමුදය දුරු කරමින්, මාර්ග වඩමින් නිවණ දකිමින් පහළ වන්නේ ය.**

**මඟ පහළ සොතාපත්තිමග්ග චිත්ත වීථිය**

○○○ ○○○ ○○○ ○○○ ○:○ ○○○ ○○○ ○○○ ○○। ○○○ ○○○ ○○○ ○○○

ති න, ද, ම, ප, උ, අ, ගො, මග්ග, ඵ, ඵ, භ, භ,

මෙසේ ප්‍රථමවරට නිවන් **දුටු** සොතාපත්ති - ඵල සිත් දෙකින් පසු සිත භවඞ්ග ගත වන්නේ ය. ඉක්බිති ප්‍රත්‍යවෙක්ෂා සිත් ද පහළ වන්නේ ය. මේ මහ පොළොවට අධිපති චක්‍රවර්ති රාජ්‍ය පදවියටත් දෙව්රජ බවටත් කාමරූප අරූප භවත්‍රයෙහි අධිපති බවටත් වඩා මේ සිත උතුම් ය. එම සොතාපත්ති මග්ග සිතෙහි පහළවන ප්‍රඥා, විතර්ක, විරති, වීර්ය, සමෘති, එකාග්‍රතා යන චෛතසිකයන් ගෙන් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ග වඩමින් නිවන ලබා දෙමින් දුක දූතගණි-මින් තෘෂ්ණාව සිඳ ලන්නේ ය.

මෙසේ අර්හත් මාර්ගඥානයෙන් සියලු කෙලෙසුන් සුන්කළ ඔහු සදෙවක ලෝකයාට මුදුන් මල්කඩක් වැ මහණකම සම්පූර්ණ කළ උත්තම ශ්‍රමණයන් වහන්සේ ය.

**"යො හවෙ දහරො භික්ඛු-යුඤ්ජති බුද්ධසාසනෙ**
**අධිගච්ඡෙ පදං සන්තං-සඞ්ඛාරූපසමං සුඛං"**

ඉදින් යම් දහර- ළදරු භික්ෂුවක් නමුදු මෙසේ බුදු සසුනෙහි යෙදෙයි නම් ඔහු සංස්කාරයන්ගේ ව්‍යුපසම-සුඛය වූ ශාන්ත නිර්වාණ පදය අවබොධ කරන්නේ ය.

**මහණකම සුරැකේවා !**

**බුදුසසුන බැබළේවා !!**

**නිමි.**

# පූරාණ සතිපට්ඨාන භාවනාව

**නමො සම්මාසම්බුද්ධස්ස**

**"නත්ථි ඣානං අපඤ්ඤස්ස - පඤ්ඤා නත්ථි අඣායතො
යම්හි ඣානඤ්ච පඤ්ඤා ච - ස වෙ නිබ්බාණ සන්තිකෙ."**

ප්‍රඥාව නැති තැනැත්තාට ධ්‍යානයක් නැත. ධ්‍යාන නොකරන්නහුට ප්‍රඥාවකුත් නැත. යමකුන් කෙරෙහි ධ්‍යානයත් ප්‍රඥාවත් ඇත් නම් ඔහු ඒකාන්තයෙන් නිවණ ලඟය.

ධ්‍යාන ඉපදවීමට ප්‍රඥාව අවශ්‍යය. ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිතකින් උපන් පින්වතකු විසින් කල්‍යාණ මිත්‍රයෙකු සොයා ගැණීම, ශීලවිශුද්ධිය, සප්පාය, අසප්පාය යන් දැන සප්පාය සේවනය, ඉන්ද්‍රිය සමතාවය ආදී ධ්‍යාන ඉපදවීමට ඕනෑකරණ දහසක් දෑ ඉතා සියුම් නුවණින් සලකා බලා සිදුකර ගත යුතුය. ඒ මූලික ප්‍රඥාව නො මැතිව ධ්‍යානය තබා භාවනා කරණුද නො හැකි.

මෙහි ධ්‍යාන නම් කුසල් සිත්හි එකඟතාවය යි. ඒකාග්‍රතා චෛතසිකය යි. එය සියලු සිත්හි සාධාරණව යෙදෙන නමුදු මෙහි උපචාර හා අර්පණා සිත්හි යෙදෙන ඒකාග්‍රතාවය ගණු ලැබේ.

**"උපචාර සමාධි අප්පණා සමාධිචෙති
දුවිධොපි සමාධි චිත්ත විසුද්ධිනාම"** යනු අභිධම්මත්ථ සඞ්ගහ යි. මේ උපචාර හෝ අර්පණා ධ්‍යානයක් ලබා ඒ ධ්‍යාන සිතින් විදර්ශනා කරන්නහුට විදර්ශනා ප්‍රඥාව ලැබේ. ඒ ධ්‍යානයත් විදර්ශනා ප්‍රඥාවත් යමෙකුන් කෙරෙහි වේ නම් ඔහු නිවණ ළඟ ය. විදර්ශනා ප්‍රඥාව සම්පූර්ණවීමෙන් ඔහුට නිවන් ලැබේ.

මෙහි අර්පණාධ්‍යානයෙන් විදර්ශනා වඩා මගපල ලබනුයේ සමථයානිකයා ය. උපචාරධ්‍යානයෙන් විදර්ශනා වඩා මාර්ගඵල ලබනුයේ ශුෂ්කවිදර්ශකයා ය. කොයිවිධියෙන් නිවන් ලැබු-වත් නිවනෙහි වෙනසක් නැත. හුදෙක් සෘද්ධිවිධාදී අභිඥා-වන් ශුෂ්කවිදර්ශකයාට නැත.

(1) අභිඤාධ්‍යාන සඳහා නියමිත ආනාපානාදී කමටහන් භාවනා කොට ප්‍රථමාදී ධ්‍යාන උපදවා විදර්ශනා වඩා නිවන් දැකීම,

(2) පවත්නා නාම රූපයන් ඒ ඒ අයුරින් අරමුණුකොට සිහිය පිහිටුවා භාවනා කිරීමේදී නීවරණ ධර්ම යටපත් කිරීමෙන් ලැබෙන උපචාර සමාධියෙන් තියුණු වූ විදර්ශනා ප්‍රඥවෙන් නිවන් ලැබීමත් මෙයින් පැහැදිලි වේ.

බුරුමරට "ශාසන යෙයිතා" මහා ආශ්‍රමයේ ද එහිම නොයෙක් ප්‍රදේශවල හා සියම් කාම්බෝජ රටවල පිහිටුවා ඇති සාඛාස්ථානවල ද දැනට ලඬකාවට වැඩමවා සිටින බුරුම කර්මස්ථානාචාර්ය හිමිවරුන් විසින් ද පුහුණු කරවනු ලබන්නේ මෙහි දෙවනුව ප්‍රකාශ කළ සතිපට්ඨාන භාවනා ක්‍රමය යි.

සතිපට්ඨාන සූත්‍රයේ දේසිත ආනාපාන කර්මස්ථානය සමථ භාවනාවක් හෙයින් එය එපරිදි නො ගෙණ ආශ්වාස ප්‍රශ්වාසයන් නිසා පහලවන පහසුවෙන් අරමුණුවන රූප ධර්මත් රූපධර්ම අරමුණු කිරීමෙන් ක්‍රමයෙන් එකාග්‍රවන සිතින් නාමධර්මත්- අරමුණුකොට පටන් ගණු ලබන මේ භාවනා ක්‍රමයෙන් සවැදෑරුම් ඉන්ද්‍රියයන්ට අරමුණුවන රූප හා අරමුණු ගණු ලබන නාම ද ඉරියාපථ, චතුසම්පජඤ්ඤ, ධාතු මනසිකාර කොටස්හි දැක්වෙන අයුරින් රූප හා නාම ද අරමුණු කොට කායානුපස්සනාව ද, සුඛ දුක්ඛාදී වේදනා අරමුණු කොට වේදනානුපස්සනාව ද, සරාගාදී සිත් අරමුණු කොට චිත්තානුපස්සනාව ද, කාමච්ඡන්ද නීවරණාදී ධර්ම අරමුණු කොට ධම්මානුපස්සනාවද යි මෙසේ වැටහෙන වැටහෙන අයුරින් සිහිය පිහිටුවා භාවනා වඩා අනුක්‍රමයෙන් දියුණුවන සමාධියෙන් හා විදර්ශනා ප්‍රඥවෙන් නාමරූප නිරෝධය හෙවත් නිවණ ලබාගන්නා අයුරු මෙයින් උගන්වනු ලැබේ.

බුරුමරට වනවාසී භික්ෂූන් විසින් ඈදුරු පරපුරින් රැකුණු මෙම **භාවනා ක්‍රමය** වර්තමාන බෞද්ධ ලෝකයාට මහත් අස්වැසිල්ලක් බඳු වූ "ශාසන යෙයිතා" මහා කර්මස්ථාන මධ්‍යස්ථානය ඇරඹූ එරට වාසීන් ආයතීයන් වහන්සේ

ශෝණකු මෙන් පිළිගත්, අග්ගමහා පණ්ඩිත අශින් සොභන මහාසී සයාදෝ, මාගේ කර්මස්ථානාචාර්යපාදයන් වහන්සේ විසින් බුරුම බසින් පිටු අටසියයක පමණ මහා ග්‍රන්ථයකින් ත්‍රිපිටකය අළලා සුවිශදකොට දක්වා ඇත. මෙහි දක්වනු ලබන්නේ බුරුමයේ "ශාසනයෙයිතා" ආශ්‍රමයේ දී මා ලැබූ පුහුණුව හා වටහාගත් අයුරු මූල්කොට ගෙණ එම භාවනා ක්‍රමය යි. දැනට සිංහලෙන් ලියැවී ඇති මේ භාවනා ක්‍රමය පිළිබඳ අනිකුත් පොත් ද බැලීම ප්‍රයෝජනවත් ය. ගිහි පැවිදි සැම සුධීන්ටත් විශෙෂයෙන් වනවාසීව ගුණධර්ම පූරණයෙහි යෙදෙන පින්වතුන්ටත් මෙයින් උසස් ප්‍රයෝජන ලැබේවා. මේ භාවනා ක්‍රමය පුහුණු කළ කල්‍යාණ මිත්‍රයෙකු ආශ්‍රය කරමින් දිනපතා අවවාද ලබමින් උත්සාහවත් වුවහොත් මෙහි නියම ඵල ඉක්මනින් ලැබිය හැකි බව සලකත්වා !

## පූර්වකෘත්‍යය.

1 සමාධි සංවත්තනික (සමාධිය පිණිස පවත්නා ඉතා පිරිසුදු) ශීලයක පිහිටීම,

**"අවිප්පටිසාරකො සීලෙ පතිට්ඨාය"** යනුවෙන් ධර්මයෙහි සඳහන් වන්නේ ද මෙම ශීලයයි. තමා රක්නා ශීලය කැඩී බිඳී පැල්ලම් ගැහී පොතු ගැලවී තිබේනම් දූෂිත සිල් ඇති විපිළිසර ගිහිපැවිදියනට භාවනා කිරීම නො කළ හැකි. ඵල නො ලැබිය හැකි. එබැවින් මෙහිලා ශීල පාරිශුද්ධිය මූල්-තැන ගන්නේ ය. උපසපන් පැවිද්දෙක් නම් භාවනාවට වාඩිවී සිල් බලනුහට දුක්කට දුබ්භාසිතාදී සුළු ඇවතකුදු නැතැයි සිහිකරණ විට ඇතිවන ප්‍රීතිය ශරීරය පිනායන ඉතා මිහිරි එකකි. එම ප්‍රීතිය සැපයටත් සැපය සමාධියටත් මූල් වන්නේ ය. **(පීති සුඛපජ්ජාය, සුඛං සමාධපජ්ජාය.)** මේ සමාධිසංවත්තනික ශීලය යි. එහෙයින් පළමුව තමා රක්නා සතර සංවර ශීලය මැනැවින් පිරිසුදු කරගෙණම භාවනා කළ යුතු ය. ශීල පාරිශුද්ධිය මෙන් ම අභ්‍යන්තර බාහිර වස්තු පාරිශුද්ධිය (ශරීරය- වස්ත්‍ර හා වාසස්ථානාදිය පිරිසුදුව තබා ගැණීම) ද අත්‍යවශ්‍ය ය.

2 විවේකස්ථානයට පැමිණ තෙල් මල් සුවඳ පුදා සුඛාසනයෙන් වාඩිවෙනු. සුඛාසනය නම් කවුරුන් දන්නා අරමිණිය ගොතා වාඩිවීම යි. පද්මාසන, වජ්‍රාසනාදියට වඩා මෙහිලා සුඛාසනය ප්‍රශස්ත ය.

දෙහොත් මුදුන් දී වැඳ නමස්කාරය, ඉතිපිසෝ භගවා ආදී සූවිසි මහා ගුණයන් කියා වැඳ සමාකරවා ගන්න. රත්නත්‍රය සමාකරවා ගැණීම නො වරදවාම කළ යුතු ය. නො දැනුවත්ව හෝ ආර්‍ය-උපවාද ආදී බලවත් අකුශලයන් ගෙන් පවා සමාකරවා ගැණීමෙන් නිදහස් වේ. බුරුම බෞද්ධයන් තිසරණ සමාදන් වීමටත් පෙරාතුව ම දීඝ-වාක්‍යයකින් සමාකරවා ගැණීම සිරිති. එය උසස් බෞද්ධ චාරිත්‍රයෙකි මෙහිදු ඒ අනුව කෙටි වාක්‍යයක් යොදනු ලැබේ.

**3 සමාකරවා ගැණීම**

ඕකාස, ඕකාස, ඕකාස, කායකම්, වාග්කම්, මනඃකම් යන තුන් දෙරින් සිදු වූ සියලු දෝෂ- සියලු වැරදි වලින් මිදීම පිණිස ද මාර්ගඥාන ඵලඥාන නිවන් සැප ලබාගැණීම පිණිස ද බුද්ධ ධම්ම සඞ්ඝ තෙරුවන් ද ගුරුවරුන් හා ගුණයෙන් වයසින් වැඩිහිටි උතුමන් ද, නමස්කාර කරමි, වඳිමි පුදමි.

අතීත සංසාරයේ පටන් දැන් මේ දක්වා මා ගෙන් සිදු වූ- කාය වචන සිතින් කළ වැරදි-කම් දොෂවලට සමාව අයදිමි. සමාවෙච්චා, මටද සිදුවූ සියලු වරදට මම ද සමාවෙමි.

**4 ජීවිත පරිත්‍යාගය හා චතුරාරක්ෂාව.**

බුද්ධාදී රත්නත්‍රයට ජීවිතය පරිත්‍යාග කළ යුතු ය.

කම්ස්ථානාචාර්යයන් වහන්සේට ද ජීවිතය පරිත්‍යාග කළ යුතු ය. මෙසේ ජීවිත පරිත්‍යාගයෙන් දුක්, වේදනා, භය, සන්ත්‍රාස, වේග ඉසිලීමට හා අදහස් ඉටුකර ගැණීමට හැකි මහත් බලයක් ලැබේ.

චතුරාරක්ෂා නම්= බුද්ධානුස්සති, මෙත්තා, අසුභ, මරණ-සති යනු යි. මේ සතර කමටහන් ආරක්ෂාය යි ව්‍යවහාර කරණු ලබන්නේ "සද්ධා"දී ඉන්ද්‍රිය ධර්මයන් දියුණු කොට

"අස්සද්ධා, විචිකිච්ඡා" ආදි කෙලෙශ මාර ධර්මයන් නැතිකාරණ නිසාත් එහෙයින් ම භූතොපද්‍රව ආදියක් වේනම් එයින් ආරක්‍ෂාව සලසා දෙන නිසාත් ය.

තුමා දූත තේරුම් ගත් සැටියට ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් වැඩි සිරුරටත් දැනී යන අයුරින් මෙනෙහි කරණු. ඒ සඳහා ද වාක්‍යයක් යොදනු ලැබේ. ඇස් පියා මෙනෙහි කරණු

**5 බුදුගුණ මෙනෙහි කිරීම.**

මාගේ ස්වාමී වූ භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ අනන්ත වූ අප්‍රමාණ වූ මහත් ගුණ ඇතිසේක. සිතා නිමකළ නොහැකි වූ කියා අවසන් කළ නොහැකි වූ බුදු නුවණින් ම දතයුතු වූ ගුණ ඇති සේක. සියලු කෙලෙසුන්- පාපයන් දුරින් දුරු කළා වූ ද සියලු පිණිත ගුණයෙන් ද සම්පූර්ණ වූ සේක. සියල්ල තමන් වහන්සේම අවබෝධ කළා වූ සෘද්ධි විධාදී විද්‍යාඥානයෙන් හා ශීලාදී ධර්මයන්ගෙන් ද සුන්දර වූ රූපයෙන් හා සියලු ලෝකය මනාව දත් නුවණින් ද දමනය කළයුතු වූ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය තිරිසනුන් ආදීන් දමනය කළ සමාධි ප්‍රඥාදී ශ්‍රේෂ්ඨ ගුණයෙන් ද යුක්ත වූ සේක.

ත්‍රිලෝගුරු වූ සතර සත්‍ය ධර්මයන් අවබොධ කළා වූ සියලු යසසිරි සම්පත් හා මාර්ගඵල නිර්වාණ ධර්මයන් භජනය කළා වූ අසමසම වූ මහා කාරුණික වූ ඒ මාගේ සම්මා සම්බුද්ධ අමා මෑණියන් වහන්සේට මාගේ ජීවිතය පූජා වේවා! ධර්ම රත්නයට ද සඞ්ඝ රත්නයට ද පූජා කරමි. පූජාවේවා!

**6 මෙත් වැඩීම**

මම සුවපත් වෙම්වා! (5 වරක් පමණ මෙනෙහි කරණු) මට හිතවත් වූ ද මැදහත් වූ ද අහිතවත් වූ ද සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා! (10-15 වරක් පමණ මෙනෙහි කරණු) මගේ ආරක්ෂක දෙවියෝ ද මේ ස්ථානයෙහි අරක්ගත් දෙවියෝ ද සියලු ශක්‍ර බ්‍රහ්ම සුයාම සන්තුසිතාදී දෙවියෝ ද සුවපත් වෙත්වා! (10-15 වරක්) සියලු මාරකායික දෙවියෝ ද සුවපත් වෙත්වා! මේ පින් අනුමෝදන් වෙත්වා! (10-15 වරක්)

**7 මරණය සිහි කිරීම**

ජීවිතය අනියත යි, මරණය නියත යි, සියලු සත්ත්වයෝ ද මරණය කරා එන එනා පැමිණෙති. මුළුලොව මාරාමිෂයකි. මාරයා ගේ ගොදුරකි. මරණය නියත යි. ජීවිතය අනියත යි. මරණය- මරණය යනුවෙන් විනාඩි දෙකක් පමණ මෙනෙහි කරණු. (අප්‍රමාදව භාවනා කිරීමෙන් මරණයෙන් මිදුණ හැකැයි විශ්වාස වැඩිය යුතු ය.)

**8 අසුභ මනසිකාරය**

දෙතිස් මහ කුණු කොටසකින් යුකත වූ මේ ශරීරය මහා අසුභයක්ම ය. නවදොරකින් නිති කුණු වැගිරෙන මෙම සිරුර මරණින් මතු පිළිකුල් වූ මහා අසුභයක් ම බව ප්‍රකට වන්නේ ය. අසුභය, අසුභයැ යි විනාඩි දෙකක් පමණ මෙනෙහි කරණු. (මෙසේ අසුභය මෙනෙහි කිරීමෙන් දුරුවූ කෙලෙස් ඇති විරාග සහගත සිතින් දැන් ඔබේ උදරයෙහි උස්වීම- පහත්වීම අරමුණු කරන්න.

### 1 - 2 අරමුණු

1 හුස්ම ගන්නා විට උදරය උස්වන්නේ ය.

හෙවත් පිම්බෙන්නේ ය.

2 හුස්ම හෙළන විට උදරය පහත්වන්නේ ය.

හෙවත් හැකිලෙන්නේ ය.

පටියක් බැඳ තිබේ නම් බුරුල් කොට උදරයේ උස්වීම පහත්වීම අරමුණු කරණු. එවිට පෙකනිය දෙස උස්වීම, පහත් වීම වඩාත් ප්‍රකටව වැටහේ. එතැන සිත තබා- උස්වීම පහත්වීම- උස්වීම- පහත්වීම මෙසේ දිගටම නෙත් පියා පෙකනිය ඇසින් පෙනෙන්නා මෙන් සිත තබා මෙනෙහි කරණු. උදරයේ උස්වීම නම් උස්වීමේ වායො රූපය යි. පහත්වීම නම් පහත්වීමේ වායො රූපය යි. චිත්තජ රූපයෝ යි. රූපය ඕලාරික ය. එහෙයින් රූප විදශීනාව ප්‍රථමයෙන් ගණු ලැබේ.

**රූප=** ඇස් පියා මෙසේ භාවනා කරණ ඔබට නොයෙක් මාදිලියේ රූප දර්ශනය විය හැකි. ප්‍රිය රූපයන් ද නොයෙක් බිහිසුණු රූපයන් ද පෙර ගණු ලැබූ රූපාරම්මණයන් ද

ඇතිවිය හැක. ඒ සියලු ඇසට පෙණෙන අරමුණු පෙනෙනවා, පෙනෙනවා යනුවෙන් ඒවා නො පෙනී යනතුරු මෙනෙහිකොට නැවත උස්විම්, පහත්වීම භාවනා කරන්න.

ශබ්ද= මිනිසුන්ගේ ශබ්ද බල්ලන් කුරුල්ලන් ආදී සතුන්ගේ දැයි නොයෙක් නාලයේ ශබ්ද ඇසෙන්නට විය හැක. ඒ සියලු ශබ්දයන් ඇසෙනවා, ඇසෙනවායැ යි නිරුද්ධ වනතුරු මෙනෙහි කොට භාවනා කරණු. යම් ශබ්දයක් නො නැවතී දිගටම පවතී නම් එය ද කිහිපවරක් මෙනෙහි කොට (ඒ ගැණ නොසලකා) භාවනා කරන්න.

ගන්ධ= නොයෙක් ගඳ සුවඳ දැනෙන්නට පුළුවනි. ගඳයි, ගඳයි, සුවඳයි, සුවඳයි, යනුවෙන් මෙනෙහිකොට භාවනා කරණු.

රස= නොයෙක් රස විරස දිවට දැනෙන්නට හැක. එසේ දැනුනහොත් පැණි රසයි, පැණි රසයි, තිත්ත රසයි, තිත්ත රසයි, යනුවෙන් මෙනෙහි කොට භාවනා කරණු.

ස්පර්ශ= ශරීරයට ශීත සුළං වැදීම්, උෂ්ණය ආදී නොයෙක් ස්පර්ශ දැනුනහොත් ශීතයි, ශීතයි, උෂ්ණයි, උෂ්ණයි, යනුවෙන් ඒ ස්වභාවය නැතිවන තුරු මෙනෙහි කොට භාවනා කරණු

ධර්ම= සිතට අතීත, අනාගත, වර්තමාන, යම් කල්පනා සිතිවිලි එහොත් ඒවාද කල්පනා කරණවා, සිතනවා, යනුවෙන් මෙනෙහි කොට භාවනා කරණු. පෙර ගිය වන්දනා ස්ථාන රටවල් වෙහෙර විහාරාදී යමක් කරා හෝ යම් අරමුණක් කරා සිත ගියේයැයි හැඟුණොත් ගියා ගියා යනුවෙන් මෙනෙහි කොට උස්විම පහත්විම භාවනා කරණු

මෙසේ සදොරින් වැදගන්නා රූපාදී අරමුණු ඔබට හැහෙන පරිදි මෙනෙහි කිරීම ද විදර්ශනා භාවනාවම ය.

"පෙනෙනවා" යනු ඇසත්- රූපාරම්මණයත් ඒ අනුව උපදින සිතත්- ඒ සිතෙහි උපදින චෛතසිකත් යැ යි පඤ්චස්කන්ධයක පහළවීමත්- ඒ සම්ගම නැති වීමත් ය.

(i) ඇස (චක්ඛුප්‍රසාදය) ත්- රූපාරම්මණයත් රූපස්කන්ධය යි. (ii) ඒ අනුව උපදින සිත (චක්ඛු විඤ්ඤාණය) විඤ්ඤාණස්කන්ධය යි. (iii) ඒ සිත්හි හටගත් වේදනා- වේදනාස්කන්ධය යි. (iv) ඒ සිත්හි යෙදුණු සඤ්ඤා- සඤ්ඤා- ස්කන්ධය යි. (v) ඵස්සාදී ඉතිරි චෛතසික සංඛාර- ස්කන්ධ ය යි මෙහි විඤ්ඤාණ ආදී ස්කන්ධ සතර නාම ය. රූපස්කන්ධය රූප ය.

දැන් ඔබ පෙනෙන වා, ඇසෙනවා, ගඳ සුවඳ දැනෙනවා, රස දැනෙනවා, ස්පර්ශකරණවා යනුවෙන් මෙනෙහි කරන්නේ ඇති වෙමින් නැතිවෙමින් පවත්නා නාම-රූප සමූහය යි.

උදරයේ උස්වීම උස්වීමේ රූපය බව කලින් සඳහන්ව ඇත. උස්වීමේ සැමැත්ත යෙදුණු සිත නාමය යි මෙසේ උස්වීම පහත්වීම යනුවෙන් මෙනෙහි කරන්නේ ද එකෙණෙහි හැදෙමින් බිඳෙමින් පවත්නා නාම රූප පරම්පරාව යි.

**ආයුෂ**= නාමයන ආයුෂ චිත්තක්ෂණයකි. ඉතාම සුළු කාලයකි. එබඳු චිත්තක්ෂණ 17 ක් රූපයේ ආයු කාලය යි. මේ තරම් ඉක්මණින් සිදුවෙතැ යි උපමාවකුදු නො පෙන්විය හැකි. ලෝකයේ ඉතා වේගයෙන් සිදුවන දෙය නම් මේ නාම රූපයන් බිඳි බිඳී යෑම යි. මෙසේ වාඩිවී භාවනා කරණ ඔබට මැසි මදුරු ආදී සතකු විදීමෙන් හෝ යම් කැසීමක් දැනුනොත් කසනව, කසනවා, යනුවෙන් මෙනෙහි කරණු. කැසීම පවතී නම් අතින් එතැන කසන්නට සිතුණහොත් කසන්නට සිතෙනවා, යැයි මෙ[illegible]ණෙහි කරණු. ඉන් අත ගණ්මි, ගණ්මියි අරම්ණිය මතින් අත ගෙණ (ඉතා සෙමින්) වකුටු කරමි වකුටු කරමියි හෝ ඔසවමි, ඔසවමියි කසන තැනට අත කිට්ටුකර තබමි තබමියි එතන අත තියා කසමි, කසමියි කසා ගණ්මි, ගණ්මියි ගෙණ, දිග හරිමි, දිග හරිමියි දිගහැර තබමි තබමියි මෙනෙහි කොට පෙර තිබූ තැන අත තබනු. නැවත උස්වීම පහත්වීම භාවනා කරණු.

මෙසේ අත පය හිස ආදී සියලු ශරීරය පිළිබඳ ඒ ඒ ක්‍රියාවන් අනුව ඉතා සියුම්ව සිහිය යොදවා මෙනෙහි කරණු. කොළගසන්නට සිතුණ හොත් සිතෙනවා සිතෙනවා යැයි මෙනෙහි කොට හිස පහත් කරමි යි පහත්කොට කොළගසමි යි කොළ ගසා ඔසවමියි ඔසවනු.

මෙසේ සති චෛතසිකය යොදවා පවත්නා සියලු නාම රූප කායයන් අරමුණු කිරීම කායානුපස්සනා සතිපට්ඨානය යි

මෙසේ වාඩිවී භාවනා කරණ ඔබට දෙපතුලේ සිට හිස් මුදුන තෙක් නානාවිධ දුක්ඛ වේදනාවන් රිදීම්, හිරිවැටීම් දැනෙන්නට පුළුවන. "රිදෙනවා - රිදෙනවා" හිරිවැටෙනවා හිරිවැටෙනවා, යනාදී දැනෙන අයුරින් රිදීම් හිරිවැටීම් නවතින තුරු මෙනෙහි කොට භාවනා කරණු. සමහර විට සුඛ වේදනාවක් සැහැල්ලු බවක් දැනෙන්නට පුළුවන. සැපයි, සැපයි, සැහැල්ලු යි යනාදීන් මෙනෙහි කොට භාවනා කරණු. මෙසේ ඇතිවන වේදනාවන් ඒ ඒ අයුරින් සිහිය පිහිටුවා මෙනෙහි කිරීම **වේදනානුපස්සනා** වයි.

රාග සහගත සිත්, තරහ හෙවත් ද්වේෂ සහගත සිත්, විතර්ක වික්ෂිප්ත ආදී නොයෙක් සිත් ඇතිවන්නට පුළුවන. ඒවාද රාගය, රාගය, තරහ, තරහ, විතර්ක, විතර්ක, අවුල්වීම, අවුල්වීම යනාදි ඒ ඒ සිත් නමන්ට වැටහෙන අයුරින් සිහියෙන් මෙනෙහි කොට නිරුද්ධ වූ පසු භාවනා කරණු. **මේ චිත්තානුපස්සනායි.**

මෙසේ උස්වීම පහත්වීම භාවනා කිරීමේදී නිදිමත, මැලිකතිය, ඇවිස්සීම, කුකුස, සැකය, ආදී ස්වභාවයන් දැනෙනු ඇත ඒ සියල්ලද නිදිමත යි, මැලි යි, ඇවිස්සෙනවා, සැක යි, ආදී වශයෙන් ඒ ඒ ස්වභාවයන් නැතිවන තුරු මෙනෙහි කරණු. මේහි සැකය බෙහෙවින් බලපවත්ව යි. රත්නත්‍රය කෙරෙහි පමණක් නොව මේ භාවනා ක්‍රමය, භාවනා කියාදුන් ආචාර්යවරයා ශීලය, භාවනා කිරීමේදී පෙනෙන අරමුණු ආදී නොයෙක් දේ කෙරෙහි බෙහෙවින් සැක ඇතිවිය හැකි සැකය සැකය ය නිරුද්ධ වනතුරු මෙනෙහි කොට භාවනා කරණු **මේ ධම්මානුපස්සනාව යි.**

මෙසේ පැය භාගයක් පැයක් භාවනා කරණ විට ආසනය වෙනස් කරණු කැමති නම් සිතනවා සිතනවා යි මෙනෙහි කොට වෙනස් කරමි යි පාදයක් මඳක් එහාට මෙහාට කිරීම් වශයෙන් ආසනය වෙනස් කොට භාවනා කරණු. ඇලවෙනු කැමැත්තෙහි නම් ඇලවෙනු කැමැත්තෙමි යි සිතා ඇලවී

භාවනා කරණු නැගිටින්නට සිතුණහොත් සිතෙනවා, සිතෙනවා යි සිහිය යොදවා, දෙකකුල් දිගහරිමි යි ඉතා සෙමින් දිගහැර නැගිටිමි යි සිතමින් නැගිටිනු. කාලක් රෝගීව සිටියකු යන්තම් සුවය ලබා යැම් ඊම් ආදී ඉරියව් පවත්වන්නට පුරුදු වෙන්නාක් මෙන් ඉතා සෙමින් සියලු ඉරියව් පවත්වනු.

## සක්මන් භාවනාව

සක්මන් කරන්නට සිතුණොත් සක්මන් කරණු කැමැත්තෙමි.. යි සිහිය උපදවා වම්පය තබමි, දකුණු පය තබමි, වම්පය - දකුණු පය, වම - දකුණ තබමි යි මෙසේ සෙමින් සක්මන් කොට නවතිනු කැමැත්තෙමි යි අරමුණු කොට නවතිමි යි වේගය අඩුකොට නවතිනු. සිටිමි යි සිට හැරෙණු කැමැත්තෙමි...යි හැරීම අරමුණු කොට හැරෙමි... යි හැරී යනු කැමැත්තෙමි යි අරමුණු කොට වම්පය තබමි- දකුණු පය තබමි යි මෙසේ සෑම ආකාරයක් ම සිහියෙන් හසුකොට සක්මන් භාවනාව කරණු.

මේ සක්මන් භාවනාව ද ඉතා ප්‍රකට ව නාම රූප ධර්ම අරමුණු කිරීමකි. වම්පය තබමි යි ඇතිවන සිත්-නාමධර්ම හා වම්පය තැබීමේදී මුළු සිරුරම චිත්තජ රූපධර්ම පරම්පරාවත් අරමුණු කිරීම යි සක්මනේදී ද රූප දැකීම් ශබ්ද ඇසීම් ආදිය පෙර මෙන් සක්මන නවතා පෙනෙනවා, ඇසෙනවා, ආදී වශයෙන් මෙනෙහි කරණු. සක්මන් කිරීමට සක්මන් මළුවක් නම් වඩාත් මැනවි. මෙසේ පැය බාගයක් පැයක් සක්මන් භාවනා කොට වාඩිවන්නට සිතුනොත් සිතෙනවා... යි අරමුණු කොට වම්පය තබමි යනාදීන් ආසනය ළඟට ගොස් වාඩිවෙමි...යි සිතමින් වාඩිවී අත් පා ඒ ඒ තන්හි තබමි යි තබා පූර්වකෘත්‍යාදිය නැවත මෙනෙහි කොට පෙර මෙන් උස්වීම පහත්වීම අරමුණු කොට භාවනා කරණු.

වැසිකිළි කොසකිළි කිසකරණු සිතුනහොත් සිතෙනවා... යි ඒ සිත අරමුණු කොට යමි. වම්පය දකුණු පය තබමි යි ගොස්, නවතිමි, අත ඔසවමි, දොර අල්ලමි, දොර හරිමි...යි ඉතා සෙමින් සියලු ක්‍රියා සිහියට හසුකොට පැවැත්විය යුතු. මුහුණ සෝදන්නට සිතුණවිට සිතෙනවා...යි අරමුණු කොට

යෑම, වතුර ගැණීම, මුහුණ සේදීම, තුවාය ගැණීම, පිස දැමීම ආදී සෑම ක්‍රියාවක් ම සිහිය යොදවා කරණු. දිය නෑමේදී ද මෙසේම සිහිය යොදවා සියලු ක්‍රියාවන් අරමුණු කරණු. ආහාර ගැණීමේදී ද සිතීම, යෑම, වාඩිවීම, පිළිගැණීම, පිඩු-කිරීම, මුඛයට ගැණීම, සැපීම, ගිලීම, නැවත අත පහත දැමීම යනාදී සෑම සියුම් ක්‍රියා මාත්‍රයක් ම ඒ ඒ අයුරින් මෙනෙහි කිරීමෙන් කරණු. මෙසේ සිහියෙන් ඒ ඒ ක්‍රියාවන් කරණවිට ප්‍රත්‍යවෙක්ෂාවත්ද සම්පූර්ණ වන්නේ ය. නිදගන්-නට සිතුණවිට සිතීම, යෑම, ඇඳමත වාඩිවීම, කොට්ටයේ හිස තැබීම, හිසේ හැපීම, අතපය නැත්පත් කර තැබීමාදී සෑම ක්‍රියාවක්ම මෙනෙහි කරණු. නිදගණ ද උස්වීම පහත්වීම අරමුණුකර භාවනා කරන්න. ඇහැරෙණ විටද ඇහැරෙමි සි හෝ උස්වීම පහත්වීම හෝ ඉබේ අරමුණු වේනොත් ඔබේ සිහිය මනාව ක්‍රියා කරණ බව සිතා ගන්න.

ඉක්මනින් මේ භාවනා ක්‍රමයෙන් උසස් ඵල ලබාගන්නට කැමැත්තන් විසින් නින්දක් නො තැකිය යුතු ය. සක්මණින් හා වාඩිවීමෙන් හැකිතාක් භාවනා කොට නො-හැකි ම අවස්ථාවක ඇඳක හෝ සනීප පුටුවක ඇලවී උස්වීම පහත්වීම අරමුණු කිරීමේදී නින්ද ගිය හොත් පැය හතරකට වඩා දවල් හෝ රෑ නො නිදීමට උත්සාහ ගතයුතු. **නින්දත් ආහාර ගැණීමත් සාධාවක්** පදෙන් පාලනය කරගත යුතු ය.

ලියුම් ලිවීම පොත්පත් බැලීම ආදී සෑම බාහිර වැඩක් ම නැවැත්විය යුතු. අලෝභාදී හොඳ අදහසින් භාවනා කිරී-මෙහිම යෙදුණ හොත් සතියෙන් දෙසොස් මාසයෙන් උසස් ප්‍රතිඵල දක්ක හැකි. එහෙයින් මේ සඳහා මසක් දෙකක් සියලු කටයුතු වලින් නිවාඩු ගෙණ උත්සාහවත් වුවද ඉතා වැදගත් ය. යම් අභව්‍යත්වයකින් ප්‍රතිඵල නො ලදද ඔහු සියලු හැඩි දුඩි කමින් තොර වූ ජීවිතය පාලනය කරගත් ශාන්තදාන්ත මනුෂ්‍යයෙක් ව අනාගතයේ ඉක්මණින් බවදුක කෙළවර කරණු ඇත.

## 2. සක්මන් භාවනාව

පළමුවෙනි සක්මන් භාවනාව ඉතා හොඳින් පුහුණු වූ පසු- වම් පය- දකුණු පය හැඬීම බොහෝ වේලාවකින් නමුදු නො වරදින්නවිත්, බාහිර අරමුණු කරා සිත නො නොස් පයත් සමගම සිතත් ගමන්කරන්නා සේ සක්මනෙහි සිත එක්තැන්වීමට පැමිණි පසු මේ දෙවෙනි සක්මන් භාවනාව කරන්න.

වම්පය **ඔසවමින්** ඔසවමි යි ද **තබමින්** තබමියි ද දකුණු පය ඔසවමින් ඔසවමි ද තබමින් තබමියි ද මෙසේ **ඔසවමි - තබමි - ඔසවමි - තබමි යි** පය එසවීම පටන් ගැණී-මත් සමගම, තැබීමත් සමගම මෙනෙහි කරමින් භාවනා කරන්න. නැවතීම, සිටීම, හැරීම පෙර මෙන් මෙනෙහි කරණු පෙනෙනවා, ඇසෙනවා ආදී මෙනෙහි කිරීම් ද පෙර මෙනි.

දවස් කීපයක් මෙසේ "ආතාපී" කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, "සම්පජානො", මනා නුවණ ඇතිව, "සතිමා" සිහි ඇතිව භාවනා කරණවිට සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්‍මයන් දියුණුවීමෙන් ප්‍රීතියෙන් භාවනායෙහි යෙදෙන්නට හැකිවන්නේ ය. නාම රූප පිළිබඳ යම් යම් වැටහීම් ද ඇතිවිය හැකි ය.

මුලදී ඉතා දුෂ්කරවූ ඉරියවු පැවැත්වීම පිළිබඳ මෙනෙහි කිරීම දැන් එතරම් දුෂ්කර නො වන බව වැටහෙන්නේ ය වඩ වඩා සියුම්ව ඒ ඒ ක්‍රියාවන් මෙනෙහි කිරීමට හැකි වන්නේ ය. එහෙයින් යටත්පිරිසෙයින් ඇසිපිය ගැහීම පවා මෙනෙහි කොට කිරීමට ඉටාගන්න. ක්‍රමයෙන් වාඩිවී භාවනා කිරීමේ කාලය පැය, පැයයි විනාඩි 10 – 15, වශයෙන් දික්කරණු

දැන් වාඩිවී භාවනා කරණ යෝගියාට පිම්බීම හා හැකි-ලීමේ අරමුණු ක්‍රමයෙන් සියුම්ව යන බව වැටහේ. බඩේ පිම්බෙන හැකිළෙන ප්‍රදේශය මණ්ඩලාකාරයෙන් හෝ මලක පෙලුම් මල් කැකුලක ආකාරයෙන් වැටහෙන්නට පුළුවන. සමහරවිට පිම්බීම පමණක් හෝ වැටහෙන්නේ ය. එවිට පිම්බීම යනුවෙන් එය පමණක් මෙනෙහි කරණු. එය ද

කිහිපවරක් පැවතී, බඩේ පිම්බීම සම්පූර්ණයෙන් නැවතී තදවුණු බව වැටහේ. එවිට පපුව උස්වෙමින් පහත්වෙමින් පවතින්නට පුළුවන. එසද පිම්බීම හැකිළීම යනුවෙන් ම මෙනෙහි කරණු.

පපුවෙහි *උස්වීම පහත්වීම ද ක්‍රමයෙන් සිහින් වෙමින් උගුර සමීපයට එනතුරු සියුම් සියුම් උස්පහත් වීම් වැටහෙන්නට පුළුවන. එද මෙනෙහි කරණ විට සම්පූර්ණයෙන් උස් පහත්වීම නැවතී දැනෙන නොදැනෙන තරමේ ආශ්වාස ප්‍රශ්වාස නාසයෙන් පවතින්නේ ය. දැන් බඩේ සිට මුළු ශරීරය ඍජුව ශක්තිමත් ගතියක් දැනෙන්නේ ය. බඩේ සිට පපුව මැදින් නාසය තෙක් හින් පොලු කැලි දෙකක් තදව තිබෙන්නාක් මෙන් වැටහෙන්නට පුළුවන. මේ අවස්ථාව මෙම භාවනා ක්‍රමයෙහි ප්‍රථම කොටස සම්පූර්ණවීම බව සලකන්න

## 3 - 4 අරමුණු

3 හිදීම, 4 හැපීම, හිදීම යනුවෙන් අරමුණු කරන්නේ හිසේ සිට පයඹිඩකායත් සමග හිදීමේ මුළු රූපය යි.

හැපීම නම් පයඹිඩකායෙන් වාඩි වූ විට බිම හෙවත් අසුනේ හැපෙන සට්ටම පාදෙක ආදී තන්හි හැපීම අරමුණුකිරීම යි.

නියුණු නුවණැති විතර්ක බුද්ධිචරිතාදීන්ට මේ අරමුණු දෙකම එකවර ගැණීම වඩාත් හොඳයි. නො නියුණු පුද්ගලයන්ට එක අරමුණක් ගැණීම වඩා පහසු ය. මෙයින් එක අරමුණක් ගන්නහු පෙරසේ භාවනාවට වාඩිවී පූර්වකෘත්‍යාදිය නිමවා, උදරයේ සිත තබා උස්වීම, පහත්වීම ද හිසේ සිට පයඹිඩකායත් සමග හිදීම ද අරමුණු කරණු.

උස්වීම, පහත්වීම, හිදීම, මෙසේ දිගටම මෙනෙහි කරණු. පෙර කීයන ලද සියලු කරුණු පිළිපදිනු උස්වීම පහත්වීම නැවතුණහොත් හිදීම - හිදීම යනුවෙන් හිදීම පමණක් මෙනෙහි කරණු.

3–4 මේ අරමුණු දෙකම එකවර ගණු කැමැත්තහු විසින්- උස්වීම, පහත්වීම, හිදීම, හැපීම යනුවෙන් දිගටම

*උස්වීම පහත්වීම හෝ පිම්බීම හැකිළීම මේ වචන පණවා ගැණීමය. නමන්ට පහසුවෙන් වැටහෙණ වචන භාවිතා කරන්න. සමාධියට බාධා නොවේ.

මෙනෙහි කරණු. මෙහි හැපීම නම් කායප්‍රසාද රූපයන්ගේත් බාහිර පඨවිධාතු රූපයන්ගේත් ගැටීම යි. හිඳීම අරමුණු කරණවිට මුලදී සම්පූර්ණ හිඳීමේ රූපය නොවැටහෙත්නට පුළුවන. මෙහි දක්වනු ලබන ඡායා ක්‍රම අනුව මෙනෙහි කිරීම ඉක්මණින් හිඳීම - හැපීම අරමුණු අල්වා ගැණීමේ උපක්‍රමයෙකි.




1 හිසේ සිට සට්ටම තෙක් කෙලින් හිඳීම මෙනෙහි කොට සට්ටමේ යටපැත්තේ හැපීම මෙනෙහි කරණු.

2 දකුණු උරහිසේ සිට කතිර ආකාරයෙන් වම් පාදය දිගේ හිඳීමත් වම් පාදයේ බිම හැපෙන තැන් හැපීමත් මෙනෙහි කරණු.

3 වම් උරහිසේ සිට දකුණු පය දිගේ කතිර සටහණින් හිඳීමත් දකුණු පයේ බිම හැපෙන තන්හි හැපීමත් මෙනෙහි කරණු.

නැවත හිසේ සිට සට්ටම තෙක් මෙසේ තුන්වරකට මෙනෙහි කරණු. මෙසේ උස්වීම, පහත්වීම, හිඳීම (හිසේ සිට සට්ටම තෙක්), හැපීම (සට්ටමේ යටිපැත්ත), උස්වීම පහත්වීම හිඳීම (දකුණු උරහිසේ සිට වම්පාදය), හැපීම (වම් පාදයේ හැපෙන තැන්), උස්වීම පහත්වීම හිඳීම (වම් උරහිසේ සිට දකුණු පාදය), හැපීම (දකුණු පාදයේ හැපෙන තැන්)

මෙසේ දිගටම භාවනා කරණු. උස්වීම, පහත්වීම, නැවතුණු විට හිඳීම් හැපීම පමණක් මෙනෙහි කරණු. නැවත උස්වීම පහත්වීම දැනුණ හොත් එද අරමුණු කරණු.

ඇඟෙක ඇලවී හෝ පුටුවෙක හාන්සි වී භාවනා කරණ විට- උස්වීම, පහත්වීම, ඇලවීම, හැපීම- උස්වීම පහත්වීම හාන්සිවීම හැපීම යනුවෙන් ඒ ඒ ඉරියව් පවත්නා අයුරින් මෙනෙහි කරණු ඇඳේ ඇලවී භාවනා කිරීමේදී හිසේ හැපීම, පිටේ හැපීම, ආදී ඒ ඒ හැපෙන තැන් අරමුණු කරණු. හාන්සිවීමේදී ද එසේය.

උස්වීම, පහත්වීම, නැතිවී හිඳීම, හැපීම, පමණක් අරමුණු කරණ කල ශරීරය සෙලවීම, පැද්දීම සමහරවිට කැරකැවීම දැනෙ සි. එවිට සෙලවෙනවා, සෙලවෙනවා, පැද්දෙනවා, කැරකෙනවා යනාදීන් ඒ ඒ ආකාරයෙන් නවතින තුරු මෙනෙහි කරණු. වාඩිවී ඉන්නා කාලසීමාව දිනපතා විනාඩි දහය දහයවත් දික්කරන්න. පළමු සතියේදී පැයක් පර්යංකයෙන් හිඳ භාවනා කෙළේනම් දෙවෙනි සති-යේදී දෙපැයක් පමණ ද තුන්වැනි සතියේදී තුන් පැයක් පමණ ද සතර වැනි සතියේදී පැය තුනහමාරක් සතරක් පර්යංකය වෙනස් නො කොට භාවනා කළ හැකි නම් ඉතා මැනවි.

මෙසේ වැඩිවේලා වාඩිවී භාවනා කිරීමේදී ශරීරය ඉස්සර-හට පස්සට හෝ ඇලයකට ඇලවී- නැමී යන බව වැටහෙන්නට පුළුවන. ඇලවෙනවා, නැමෙනවා යනුවෙන් නවතිනතුරු මෙනෙහි කරන්න. නැවතුණු පසු නැවතීම නැවතීම යනුවෙන් මෙනෙහි කරණු. නැවත ශරීරය නැඟී ඒනම් නැඟෙනවා නැඟෙනවා යනුවෙන් මෙනෙහි කරණු. ශරීරය කෙළින් වූ පසු නැවත හිඳීම, හැපීම, භාවනා කරණු. උස්වීම පහත්වීම වැටහෙතොත් එද අරමුණු කරණු.

මේ කාලයේදී භාවනා කරණවිට සවකීය කම්ඨානා-චාර්යවරයා පෙනියන්නේ ය. බුදුරජාණන්වහන්සේ චෛත්‍යයන් හා බෝධීන්වහන්සේලා ද දර්ශනය විය හැකි. පෙනෙනවා පෙනෙනවා යැයි මෙනෙහි කරණු.

## 3 සක්මන් භාවනාව

දෙවෙනි සක්මන් භාවනාව ඉතා හොඳින් පුගුණ වූ පසු- පය එසවීමේ දී එසවීම පටන් ගැණීම, අවසානය, තැබීම පටන් ගැණීම, අවසානය මනාව සිතට හසුවෙමින් සිතත් සමගම පාද ගමන් කරන්නා මෙන් ඔසවමින් තබමින් ආ-මාංගීය රෙද්දක ගසනලද මැසින් පහරක් මෙන් සිතට අරමුණු වී ගියේ නම් මෙසේ දෙවෙනි සක්මණින් මනාව සිත එකඟ වූ පසු මෙහි දක්වන තුන්වැනි සක්මන් භාවනාව ආරම්භ කරණු.

3 වම්පය ඔසවමින් ඔසවමියි ද ඉදිරියට දික්කරමින් දිග හරිමියි ද තබමින් තබමියි ද මෙසේ දකුණු පය ද මෙනෙහි කරමින් භාවනා කරණු. ගමනේදී මේ කරුණු තුනම සිදුවේ. එහෙයින් දික්කරමියි අමුතුවෙන් ඉදිරියට දික්කිරීම අවශ්‍ය නොවේ. මේ අවස්ථා තුන හොඳින් වටහා ගැණීමට ඉතා සෙමින් පළමුව සක්මන් කරණු හොඳින් අරමුණු වී එනවිට මඳක් ඉක්මණින් සක්මන් කළ ද නිවරද ය.

මෙසේ ඔසවමි, දිගහරිමි, තබමියි සිත පාදයේ පිහිටුවා මේ තුන්වැනි සක්මන් භාවනාව කරන්න. නැවතීම, සිටීම, හැරීම, පෙර මෙන් මෙනෙහි කොට කරණු.

වම් පය තබමි- දකුණු පය තබමි යි ප්‍රථම සක්මන් භාවනාව නාම රූප සනමශීත ඥානය සඳහා ද ඔසවමි- තබමි යන දෙවන සක්මන් භාවනාව උත්පාද භඞ්ගයන් වටහා ගැණීමට ද ඔසවමි- දිගහරිමි තබමි යන තුන්වන සක්මන් භාවනාව උත්පාද ස්ථිති භඞ්ගයන් අරමුණුවීමට හේතුවෙයි. මේ සක්මණින් සිත වඩ වඩාත් එකග්‍රවීමේදී ඇතිවන නාම රූප ධර්ම සමූහය එතැනම බිඳී බිඳී යන බව ද දිගහැරීමේ දී ඇතිවන නාම රූප සමූහය දිගහැරීමේදී බිඳී බිඳී යන බව ද වැටහෙනු ඇත.

දැන් යෝගාවචරයාගේ සිහිය දියුණු වෙමින් රූපාදී අරමුණු පැමිණෙනවිටම පෙනෙනවා, ආදී මෙනෙහි කිරීම් ද ශීඝ්‍රව පැවැත්විය හැක.

## ප්‍රඥප්තිය බිඳියෑම

විදර්ශනා භාවනාව වනාහි ලක්‍ෂණොපනිධ්‍යානය යි. නාම-රූපයන් ගේ අනිත්‍ය දුඃඛ අනාත්ම ලක්‍ෂණයන් අරමුණු කිරීම යි. නාම රූපයන් ප්‍රඥප්තියෙන් වැසී තිබේ. ප්‍රඥප්තිය නම් ඒ ඒ වස්තූන් හඳුනා ගැණීම සඳහා ලෝකයා විසින් පණවා ගන්නා ලද සම්මුතිය යි. සිහිය යොදවා ප්‍රඥප්තිය අරමුණු කිරීමෙන් ඇතිවන සමාධියෙන් තියුණු වන ප්‍රඥවෙන් ප්‍රඥප්තිය බිඳී නාම රූපයන් අරමුණු වන්නේ ය.

උස්වීම පහත්වීම, හිඳීම, හැපීම, ප්‍රඥප්තිය. පැණවීම් ය. මේ අරමුණු අණුව සිත එකඟවීමේදී- උස්වීමක් නැත, ඇති-වෙවී නැතිවෙවී යන නාම රූප සමූහයකි. ඇතිවීම නැතිවීම අනිත්‍යය- එහෙයින් ම දුකය. එහෙයින් ම අනාත්මය.

මෙසේ නිරතුරුවම ඇතිවෙමින් බිඳෙමින් පවත්නා නාම රූපයින් අරමුණු කරණ කල්හි සත්ත්ව පුද්ගල වෘක්‍ෂ පර්වතාදී වශයෙන් ද මෙතෙක් කල් ව්‍යවහාර කළේ මේ ඇතිවෙමින් නැතිවෙමින් පවත්නා නාම රූප සමූහයකට බව ඉබේ තේරුම් යන්නේ ය.

ස්ත්‍රී පුරුෂාදී හෝ මල්ගෙඩි ආදී වූ පණ ඇති නැති සෑම දෙයක්, පෙණෙන අරමුණු වන කල්හි ස්ත්‍රී පුරුෂාදී සංඥ වෙන් තොරවූ කලකිරීම් ස්වභාවයෙන් යුත් වූ මේ නාම රූප ධර්මයෑ යි වැටහිමේ සිත් පහල වන්නේ ය. ඒ සිත් ද නාම ධර්ම වශයෙන් අනිත්‍යාදී ලකුණු විසින් අරමුණුව යන කල්හි කෙසේවත් කෙලෙසුන්ට අවකාශ නො ලැබෙන්නේ ය.

සක්මන් භාවනාවේදී ද මෙසේ නාම රූප සමූහ වශයෙන් අරමුණු වෙමින් අභිධර්ම ඉගෙණීම් ඇසීම් ආදියෙන් නො-ලැබිය හැකි අවබොධයක් ලැබෙන්නේ ය.

මේ කාලයේ යෝගාවචරයාගේ සමාධිය මෝරන්නට පටන් ගන්නේ ය. යෝගාවචරයා උගතෙක් නම් විතර්කාදී චෛතසික පිළිබඳ සියුම් කල්පනාවන් ඇතිවනු හැක. මුළු ශරීරය පැතිරියන ස්ඵරණ ප්‍රීතිය ද වැටහෙන්නේ ය. එවිට ප්‍රීතිය, ප්‍රීතිය යනුවෙන් මෙනෙහි කරණු. නීවරණ ධර්මයන්

බොහෝ යටපත්ව ඇති. නොයෙක් ආලෝකයන් පෙණෙන්නට හැක. ආලෝකය, ආලෝකය යනුවෙන් මෙනෙහි කරණු.

උස් පහත්වීම නැවති හිඳිම මනාව අරමුණු වීමේ දී හිසේ සිට ශරීරය අභ්‍යන්තරයෙන් පෙනීයන හැක. උගුරු ඇට පපු ඇට, පිටකොඳු ඇට පෙනී යන හැක. සක්මන් කරණ විට ද හිසේ සිට පාදපතුල දක්වා ශරීරය පෙනීයන්නේ ය. නාම රූප ධර්මයන් පිළිබඳ නානාවිධ වැටහිම් ඇතිවිය හැකි. පොතින් නො ලද හැකි ඒ සියලු වැටහීම් සටහන් කර තබා ගැණිම ප්‍රයෝජනය ය.

උස්වීම, පහත්වීම, හිඳීම, හැපීම මෙසේ ටික කලක් භාවනා කරණ විට ඉතා ඉක්මනින් උස් පහත් වීම් නැවතී වැඩි වේලාවක් හිඳීම් හැපීම් අරමුණු කළ හැක. හිඳීමේ හැපීමේ අරමුණු ඉතා ප්‍රකටව යන්නේ ය. කිසිම අපහසුවක් නොමැතිව වහා අරමුණු වන්නේ ය. ඇතැම් විට හිඳීමේ අරමුණ විශාලවී පැතිරී යන්නේ ය. ඇතැම්විට ඉතා ගීත්වී සුදු තනි ඉරක් මෙන් වන්නේ ය.

ඇතැම්විට හිඳීමේ අරමුණ වළාකුල් හෝ දුම් රැසක් බවට පරිවර්තනය වන්නා සේ වැටහෙන්නේ ය. වළාකුළින් වැසී යන අයුරු ද දර්ශනය විය හැකි. එසේම හිඳීමේ අරමුණ මී මැසි පොදියක් විහිදෙන්නා සේ ඉතා සියුම් කැබලිවලට විහිදී යන හැකි. මෙසේ ගොස් හිඳීමේ රූපය සම්පූර්ණයෙන් අරමුණු නො වී නො පෙනී යන්නේ ය.

එවිට හැපීමේ අරමුණු පමණක් වැටහෙනු ඇත. හැපීම, හැපීම, යනුවෙන් එය භාවනා කරණු. මුලසිට අරමුණු මෙනෙහි කළ වේගය අඩු වැඩි නොකරණු. හැපීම සට්ටම් පුවරු වල හා පා දෙකෙහි බිම හැපීමත් පාදෙක එකට ගැටෙන තන්හිත් අරමිණිය මත තබා ඇති අතුල් දෙක අතුල් දෙකේත් හැපීම එකවර අරමුණුවිය හැකි ය. හැපීම ක්‍රමයෙන් සියුම්ව නො දැනීයන්නේ ය. ඇතැම්විට සට්ටම් දෙකේ හැපීම නැවතී පාදෙකේ බිම හැපීම ඉතිරිවිය හැක. එවිට ඒ හැපීම දැනෙන තැන් පමණක් මෙනෙහි කරණු. මෙසේ

දිගටම මෙනෙහි කිරීමේදී හැපීම නො දැනියන්නේ ය. දිය පාරක් මත ඉඳගෙණ ඉන්නාසේ වාතයෙන් එසවී සිටින්නා සේ දැනෙන්නට හැකි. ඇතැම්විට ඒ සමග පිට දිගට හිස හොත් සියුම් සියුම් හැපීම් දැනෙන්නට පුළුවන. ඒවාද මෙනෙහි කිරීමේදී නොදැනී යනු ඇත.

දැන් උස්වීම, පහත්වීම, හිඳීම, හැපීම යන අරමුණු සතරම නිරුද්ධ ය. එහෙත් ඉතා ඉක්මණින් නැවත හැපීම අරමුණු විය හැකි. නැවත හැපීම මෙනෙහි කරණු. හැපීම නිරුද්ධ වේ. හිඳීම දැනෙන්නට හැක. එද මෙනෙහි කරණු. උස්වීම, පහත්වීම දැනෙන්නට හැක. ඒවාද මෙනෙහි කරණු.

මෙසේ උස්වීම පහත්වීම හිඳීම හැපීම යන අරමුණු සතරම නිරුද්ධවූ කල්හි උපචාරධ්‍යානයෙන් සිත සමාහිතවූ අවස්ථාව ලෙස සැලකිය හැකි. නීවරණ ධර්ම යටපත්ව ඇත. උගත් යෝගාවචරයෙකුට විතර්කාදී ධ්‍යානාඞ්ග පිළිබඳ අවබෝධවීම් ඇතිවිය හැකි. එහෙත් ඒවා ප්‍රබල නොවිය හැකි.

නාම රූපයන් ලක්ඛණ රස පච්චුපට්ඨාන පදට්ඨානාදී යම් අයුරකින් අවබෝධ විය හැකි. උස්වීමේ කැමැත්ත ඇති නාම ධර්මයන්ගේ පහළවීම එයින් හටගණු ලබන උස්වීමේ රූපය ඒ රූපය දෙස ඇදී නැමී නැමී ඒ රූපය අරමුණු කිරීම් වශයෙන් පවත්නා නාම ධර්ම ද-- උස්වීමේ රූපය වෙනස් වෙවී යැම ද-- මෙසේ අතිකූත් සැම නාම ධර්මයන් අරමුණු වීමේදී අරමුණු කරා නැමී නැමී යන "නමන ලක්ඛණං නාමං" කියනලද නාම ධර්මයන් ගේ ලක්ෂණ වශයෙන් නාම ද, වෙනස් වෙවී යන "රුප්පන ලක්ඛණං රූපං" යයි කියන ලද රූපධර්ම ද අවබෝධ වන්නේ ය. මෙසේ මේ නාම රූපයන් වෙන්ව කොටස්ව අවබෝධවීම, **නාම රූප පරිච්ඡේද ඤාණයැයි** කියනු ලැබේ.

## 6 - අරමුණ

5. **දැනීම**= උස්වීම, පහත්වීම, හිඳීම, හැපීම යන සියලු අරමුණු නිරුද්ධව - නො වැටහී ගිය පසු රූප ශබ්ද ආදී

අරමුණක් පැමිණියහොත් පෙනෙනවා ඇසෙනවා යනාදීන් ඒ මෙනෙහි කරණු. එසේත් කිසිම අරමුණක් නොමැතිනම් දැනීම, දැනීම යනුවෙන් දිගටම මෙනෙහි කරණු. මෙහි "දැනීම" නම් "ජානන චිත්තං" දැනීමේ සිතයි. සියුම් වූ සමාහිත වූ සිතෙන් සිතම අරමුණු කිරීම හෙවත් නාම ධර්මයෙන් නාමධර්මයන් - ශුද්ධ වූ නාමධර්මයන් අරමුණු කිරීම බව වටහා ගත හැක.

මෙසේ දැනීම අරමුණු කිරීමේ දී රූප දර්ශනය බෙහෙවින් අඩුය. නොයෙක් ආලෝක දර්ශනය වියහැකි, පවත්නා නොයෙක් ශබ්දයන් ඇසෙන්නට හැක පෙර මෙන් ආලෝකය, ආලෝකය, ඇසෙනවා, ඇසෙනවා, යනාදීන් මෙනෙහි කරණු. පෙනීම්, ඇසීම් ආදිය ද දැනීමම බව වැටහෙන්නට පුළුවන. නිරතුරුවම භාවනානුයෝගී වන්න. දැන් ඉන්ද්‍රිය- බොජ්ඣඞ්ගාදී අවශ්‍ය ගුණධර්මයන් දියුණු නම් ඉක්මණින් නාම රූප නිරෝධය දකින්නට හැක. ඉනා ප්‍රවේසමෙන් නිරතුරුවම භාවනාහි යෙදීමෙන් විදර්ශනා ඥාන හා විශුද්ධීන් ද මුහුකුරා යන්නේ ය. ආලෝකය, ප්‍රීතිය, සැහැල්លු බව, බොහෝ වේලා භාවනා කරණු කැමැත්ත ඇල්ම, ආදී නොයෙක් ආකාරයන් (විදර්ශනොපකෙලශ) හට ගැණෙන්නට පුළුවන. ඒ සියල්ලම ඒ ඒ අයුරින් මෙනෙහි කිරීමෙන් නිරුද්ධව ගිය පසු නැවත භාවනා අරමුණට බසිනු.

මෙසේ නිරතුරුවම අණුමාත්‍රවූ ද කායික වාචසික මානසික සෑම ක්‍රියාවක් ම සිහිය පිහිටුවා මෙනෙහි කරමින් සිටීමෙන් බොහෝ සේ වැලකී භාවනා කිරීමේදී බොහෝ ඉක්මනින් උස්වීම්, පහත්වීම්, හිඳීම්, හැපීම්, නැවතී දැනීමට වැටෙන්නේ ය. කලක් දැනීම අරමුණු කිරීමේදී සිත ඉතා සියුම් වේගත යන්නාසේ දැනේ. සමහර විට මොළය අරමුණු වන්නාසේ හිසෙහි යම් සුළු දැනීම් තදවීම් ඇතිවන්නට පුළුවන. ඒවාද ඒ වැටහෙන අයුරින් මෙනෙහි කරණු. තව තවත් මෙසේ "දැනීම" අරමුණු කොට භාවනා කිරීමේදී වඩාත් සියුම් වූ චිත්ත සන්තතිය අරමුණු වේ, ඒ සියුම් සිතට රූප ශබ්දාදී අරමුණු පැමිණීමේදී ඒවා වඩාත් සියුම්ව දැනීමේ මාත්‍රයක් ම අරමුණු වේ. දැන් ඉතා සියුම් නාම ධර්මයන්

සංස්කාර වශයෙන් අරමුණු වන බව වැටහේ. මෙසේ තවදුරටත් දැනීම් අරමුණු කිරීමේදී සිත ඉතා සියුම්ව **ගොස් භවාංගයට බස්නා වැනි, ගැඹුරු දියක කිමිදුනා වැනි, නාම රූප ධර්ම කිසිත් අරමුණු නොවන කිසිත් නොදන්නා වැනි අවස්ථාවකට බසින්නේ ය.**

මේ කුමන අවස්ථාවක්දැයි යෝගාවචරයා විසින් තීරණය කරගත යුතු ය. මේ වනාහි නාම රූප නිරෝධය, ප්‍රථම මාර්ග ඵලාවබෝධය බැව් සාමිස්ථානාවාසීයන් වහන්සේලාගේ නිගමනයයි. යෝගාවචරයා හට වනාහි මේ අවස්ථාවේ අමුතු ජීවිතයක් ලද්දෙකුට මෙන් මහත් **සන්සුන්** ගතියක් දැනෙන්නට හැක.

**"සන්තිලක්ඛණං නිබ්බාණං"** යනුවෙන් නිර්වාණ ධාතුවගේ ශාන්ති ලක්ෂණය නම් නාම රූප ධර්ම නිරෝධය බව ප්‍රකාශිතය. **"අච්චුති රසං"** නැති නොවීම කෘත්‍යයයි. **"අනිමිත්ත පච්චුපට්ඨානං"** නිමිත්තක් සංස්කාර ස්වභාවයක් නොවැටහීම, එළඹ සිටින ආකාරයයි.

**"පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි"**

## අධිෂ්ඨාන

නැවත භාවනා කිරීමේදී පූර්වකෘත්‍යයන් නිමවා මෙම අධිෂ්ඨාන කරන්න. **"මම හැකිතාක් ඉක්මණින් ඒ උසස් තත්වයට පැමිණේවා!"** මෙ අධිෂ්ඨානය කොට උස්වීම, පහත්වීම, හිඳීම, හැපීම- භාවනා කිරීමේදී ඒ සතර අරමුණු නිරුද්ධව "දැනීම" අරමුණු කොට එය ද නිරුද්ධ වූ පසු මුලින් ඇතිවූ අවස්ථාව හා සමාන තත්වයකට යෝගාවචරයාට පැමිණිය හැක. මේ වනාහි ඵල සිත් වලට පැමිණීම බව ඇදුරු නියමයයි. දැන් ඉතා ඉක්මණින් "දැනීමේ" අරමුණ නැවතී යනු ඇත. දවසක් පමණ මෙම අධිෂ්ඨානය පුහුණු කරන්න.

"මා ලැබූ උසස් තත්වයට පත්ව විනාඩි 30 ක් ඒ තත්වයෙන් ගත කෙරෙම්වා"

මේ අධිෂ්ඨානයෙන් භාවනා කිරීමේදී දැනීම නැවතී විනාඩි 30 ක් ගතකරන්නට හැකිවනු ඇත.

"මා ලැබූ උසස් තත්වයට පත්ව විනාඩි 40 ක් ඒ තත්ව-යෙන් ගත කෙරේම්වා"

මෙසේ පැයක් දෙකක් ආදී වශයෙන් අධිෂ්ඨානය පුහුණු කරන්න. පුහුණුව වැඩිවූ තරමට මිනාය.

'මම මෙතෙක් ලැබූ විදර්ශනා ඥානයන් අත්හරිමි. මෙතෙක් නොලැබූ විදර්ශනා ඥානයන් ලබම්වා"

මේ අධිෂ්ඨානය වනාහි ඉතිරි මාර්ගඵල සඳහා යැයි කියනු ලැබේ.

"මම විනාඩි 5 ක් ඇතුලත නාම රූප ධර්මයන් නිරුද්ධ කොට ඒ උතුම් තත්වයෙන් පැයක් ගත කරම්වා"

මේ ඵල සමාපත්තියට සමවැදීම යැයි උගන්වනු ලැබේ. මෙය කලක් පුහුණු කිරීමේ දී නිරෝගී යෝගියෙකුට කාලය ක්‍රමයෙන් දික්කොට දවස් දෙක තුනක් වුවද එක ඉරියව්-වෙන් ගත කළ හැකිවනු ඇත.

යෝගියා පැමිණි මාර්ගය හරිහැටි වටහා ගැණීමට විදර්ශනා ඥාන වලට ද සමවැදීම සඳහා පහත සඳහන් අධිෂ්ඨාන කොට භාවනා කරන්න.

"මම පැයක් උදයබ්බය ඤාණයට සමවදිම්වා."

"මම පැය භාගයක් භඞ්ගඤාණයට සමවදිම්වා."

"මම භය, ආදීනව, නිබ්බිද, මුඤ්චිතු කාම්‍යතා, ඤාණයනට සමවැද පැයකුත් විනාඩි තිහක් ගත කෙරෙම්වා."

"මම විනාඩි 30 ක් පටිසඞ්ඛාඤාණයට පැමිණ වෙසෙම්වා"

"මම සංඛාරුපෙක්ඛා ඤාණයට පැමිණ පැයකුත් විනාඩි 30 ක් ගත කෙරෙම්වා."

"මම ඉක්මණින් චිත්ත චෛතසික ධර්ම නිරුද්ධ කොට පැයක් වෙසෙම්වා."

මෙම අදිටඨානයන් අනුව ද කාලය ක්‍රමක්‍රමයෙන් දික් කිරීමෙන් කලක් පුරුදු කිරීමෙන් නීරෝගී යෝගාවචරයෙ-කුට දින ගණන් ගත කළ හැකි ප්‍රබල සමාහිතතාවයක් ලබාගත හැකිය.

සප්ත විශුද්ධිය හා සප්තරස විදර්ශනාඥාන යොගාවචරයා කෙරෙහි පහළවන පිළිවෙළ ද ඒ ඒ ධර්මයන් අවබෝධ විය යුතු ආකාරය ද මතු දැක්වෙන සාරාංශයෙන් ප්‍රකාශ වේ.

## සාරාංශය.

භදන්ත සෝභන. මහාසී සයාඩෝ කම්ස්ථානාචාර්ය පාදයන් වහන්සේ විසින් මෙම සතර සතිපට්ඨාන භාවනා ක්‍රමය සාර්ථක ලෙස සම්පූර්ණ කළ යෝගාවචරයන් ගේ ප්‍රයෝජනය සඳහා පහත සඳහන් සාරාංශය දෙනු ලැබේ.

යෝගාවචරයාට පෞද්ගලික පුහුණුවේදී ඇතිවූ නොයෙක් සිද්ධීන් හා සමාන කර බැලීමට මේ දේශනය උපකාරවනු ලැබේ. එසේම කොතෙක් දුර මුහුකුරා යනතුරු විදර්ශනාඥානය තමා සම්පූර්ණ කරණ ලද්දේ දැයි තීරණය කරගත හැකිවේ. යම්කිසි යෝගාවචරයෙකු විසින් මේ සතර සතිපට්ඨාන භාවනා මාර්ගය සම්පූර්ණ කරණ ලද්දේ නම් ඔහු විසින් සප්ත විශුද්ධීන් හා සප්ත රස විදර්ශනා ඥානයන් පිළිබඳ නානාවිධ අවස්ථාවන් පසුකළ යුතු ය.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "ධම්මාදාස" සූත්‍රයෙහි සෝවාන් පුද්ගලයාගේ චරිතය පිළිබඳ ප්‍රධාන ගුණ සතරක් දක්වා ඇත. ආදාස (කණ්ණාඩි) යෙන් මුහුණ බලන්නාක් මෙන් මුහුකුරා ගිය විදර්ශනා ඥානය ඇති පුද්ගලයා මේ කරුණු සතරින් බලාගත හැකි.

1. බුද්ධරත්නය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවීම, මක්නිසාදයත් බුදුරජාණන් වහන්සේගේ අත්‍යුත්කෘෂ්ට ගුණ සමූහය තමාම දැනගත් හෙයිනි.

2 ධර්මරත්නය කෙරෙහි නොසැලෙන පැහැදීමෙන් යුතුවීම, මක්නිසාදයත් ඔහු ප්‍රධාන සතර සත්‍යධර්මයන් මනා උත්සාහයෙන් තමාම අත්දැක විනිවිදගිය තියුණු නුවණින් අවබෝධ කරගත් හෙයිනි.

3 සඞ්ඝරත්නය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවීම, මක්නිසාදයත් ඔහු ආර්ය සඞ්ඝරත්නයේ උතුම් ගුණ දන්නා හෙයිනි.

4 අරියකාන්ත වූ ඉතා පිරිසුදු පඤ්චශීලයෙන් යුක්තවීම.

### නිවණ තේරුම් ගන්නා ක්‍රම තුනෙකි

1 නිරතුරුව ගලා බස්නා නාම රූප ප්‍රවාහය නැවතුණු බව, "සන්ති ලක්ඛණං නිබ්බාණං" නාම රූපයන්ගෙන් නිදහස් බවම ශාන්ති ලක්ෂණයයි.

2 **එය** ස්වාභාවික වෙනස්වීමෙන් තොර බව. අත්‍ය-ථාවයකට හෝ විනාශයට නොපැමිණීම, **"අප්‍රණිහිත රූපං"**

3 කිසිම නිමිත්තක් හෝ **ලක්ෂණයක්** නැතිවීම, **"අනිමිත්ත පච්චුපට්ඨානං"**

## චතුරාර්‍ය සත්‍යය

1 **සියලු** සංස්කාර (නාම-රූප) ඇතිවීම හා නැතිවීම **දුක්ඛ** සත්‍යය යි.

2 සංස්කාරයන් කෙරෙහි ආලය දුකෙහි හේතුවයි-**සමුදය** සත්‍යයයි.

3 නිරතුරු ගලා බස්නා **නාම** රූප ප්‍රවාහයේ නැවතීම නාම රූප නිරෝධයයි. නිවණයි.

4 නිරෝධය පිළිබඳ ස්වකීයවූ ම වටහා ගැනීමේ **ශක්තිය** පිළිබඳ අවබෝධ මාර්ගය මාර්ග සත්‍යයයි.

මේ චතුරාර්‍ය සත්‍ය ධර්මයන් එකවර කෙසේ අවබෝධ කෙරේ ද?

ස්වකීය වටහා ගැනීමේ **ශක්තියෙන්** ලත් අවබෝධය සම්පූර්ණ වීමෙන් **නිරෝධය ද**, දුඃඛ සත්‍යයාගේ මනා වැටහීම ද, තෘෂ්ණාව පලවා හැරීමෙන් විදර්ශනා ඥානයාගේ අවශ්‍ය මුහුකුරා යෑම වර්ධනය කිරීම වූ **මාර්ග සත්‍යය ද** යන සත්‍ය සතර එක්වර අවබෝධ වන්නේ ය.

## විශුද්ධි සහ ඥාණ

1 **ශීල විශුද්ධිය**= යෝගාවචරයා ගිහි හෝ පැවිදි වේවා තමා සඳහා දේශනා කර වදාළ සියලු ශික්ෂාපද- විනය නීතීන් දූෂිලෙස ආරක්ෂා කිරීමෙන් ශීල විශුද්ධිය ද,

2 **චිත්ත විශුද්ධිය**= බාහිර සියලු අරමුණු වලින් තොරවී ස්වල්පමාත්‍රවූ ද කැළඹීමක් නො මැති- නීවරණ ධර්ම යටපත්ව, භාවනා අරමුණෙහි එකඟ වූ සිත (උපචාර අවස්ථාව) මෙහි චිත්ත විශුද්ධියයි

1 **නාමරූප පරිච්ඡේද ඥාණය**= මේ භාවනාව පුහුණු කිරීමේදී **නාම** රූප ධර්මයන් වෙන වෙනම අවබෝධ වීමයි.

3 **දිට්ඨි විසුද්ධිය**= භාවනානුයෝගියාට මේ ශරීරය හා නොයෙක් ආකාර ක්‍රියාවන් (රූප) වෙනම දෙයක් බව ද, ඒ ක්‍රියාවන් **දත** ගැණීම (නාම) අනෙකක් බව **ද** මේ ප්‍රධාන කරුණු දෙක හැර සත්ත්වයෙක්, පුද්ගලයෙක්, මවත්තෙක්, නැයි බව පැහැදිලි ලෙස වැටහීම දිට්ඨි විශුද්ධියයි.

2 **පච්චයපරිග්ගහ ඤාණය**= භාවනානුයෝගියාට පළමු පළමුව ඇතිවන්නා වූ නාම ධර්මත්, ඒ නාම ධර්ම නිසා ඇතිවන රූප ධර්මත්, වැටහීමෙන් නාම ධර්ම හේතුකොට ගෙණ රූප ධර්ම පහළවන බව වැටහීම.

4 **කඞ්ඛාවිතරණ විසුද්ධිය**= භවනා මාර්ගයේදී පළමු පළමුව ඇතිවන නාම ධර්ම නැමති හේතූන් නිසා පසුව පහළ වන රූප ධර්ම දැයි මෙසේ නාම රූප හැර අතීතානාගත වර්තමාන යන තුන් කල්හිම අනිත් දෙයක් "මම" හෝ අනිකෙක් නැතැයි පැහැදිලිව අවබෝධවීමෙන් සියලු සැක පහවී යෑම.

3 **සම්මසන ඤාණය**= භාවනා මාර්ගයේදී භාවනා අරමුණු ඇතිව නැතිවී යන අයුරු මනාව පැහැදිලිවීමෙන් අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවයන් පිළිබඳ ඇතිවන නියම අවබෝධ ඥානයයි.

4 **උදයබ්බය ඤාණය**= (ප්‍රාරම්භ අවස්ථාව) භාවනා මාර්ගයෙහි යෝගාවචරයා හොඳින් පුහුණු වූ අවස්ථාවට පැමිණි පසු නිරුත්සාහයෙන් භාවනා අරමුණු වැටහේ. මේ අවස්ථාවෙහි ඔහුට ස්වභාව ධර්මය ඉක්මවූ ආලෝකයක් ද ශරීරය සුළු වශයෙන් කම්පනය වෙමින් ඇතිවන ප්‍රීතියද සැහැල්ලු බව ද, දැඩි විශ්වාසය ද, දැඩි වීර්‍යය ද, සැප සහගත බව ද, ගැඹුරු නුවණ ද, විදර්ශනාව පිළිබඳ සිහිය ගේ විපුල භාවය ද, මැදහත් ගතිය ද, භාවනාවෙහි ඇලීම වූ නිකාන්ති-ය ද ඇතිවේ. භාවනා අරමුණු වෙන වෙනම ඇතිවී නැතිවී යන අයුරු උදයව්‍යයන් ඉතා හොඳින් වැටහෙන්නේ ය.

5 **මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධිය**= ස්වභාවය ඉක්ම වූ මේ ආලෝකාදීන්හි ඇලීම, සතුටුවීම, නියම් මාර්ගය ලැබුවා නොවන්නේ ය. එහෙයින් මේවා නොබලා භාවනා

මාර්ගයේ ඉදිරියට යා යුතු ය. භාවනාව නො නැවැත්විය යුතු යයි මෙසේ වටහා ගැණීම මග නොමග දැකීමේ විසුද්ධියයි.

උදයබ්බය ඤාණයේ අවසාන අවස්ථාව ආලෝකාදී විදර්ශනෝපක්ලේශයන් දුරුකොට භාවනා මාර්ගයේ ඉදිරියට යැමේදී භාවනානුයෝගියාට ඉතා පැහැදිලි ලෙස අරමුණු පටන් ගැණීමත්, නැතිවී යැමත්, වැටහෙත්තේ ය. මෙසේ ඉතා නිපුණු ලෙස භාවනා අරමුණු ඇතිවීම නැතිවීම සැලකිලිමත්ව බැලීමෙන් උදයබ්බය ඤාණයාගේ අවසාන අවස්ථාව සම්පූර්ණ වන්නේ ය.

6 පටිපදා ඤාණ දස්සන විසුද්ධිය= උදයබ්බය ඤාණයාගේ අවසාන අවස්ථාවේ සිට අනුලෝම ඤාණය දක්වා නියම භාවනා මාර්ගය යෝගාවචරයාට පැහැදිලි වේ. මෙසේ භාවනා පුහුණුව පිළිබඳ නියම ක්‍රමය අවබෝධවීම පටිපදා ඤාණ දස්සන විශුද්ධියයි.

5 භඞ්ග ඤාණය= භාවනා මාර්ගයේ ඉදිරි ගමනේදී යෝගාවචරයාට අරමුණු සහ දැනගන්නා සිත් (නාම රූප) වහ වහා බිඳී බිඳී යනු පමණක් වැටහීමයි.

6 භය ඤාණය= තවදුර භාවනා මාර්ගයේ ඉදිරි ගමනේ දී යෝගාවචරයාට විනාස වෙවී යන යන සංස්කාර ධර්මයන් පිළිබඳ ඔවුන්ගේ නියම තත්වය ගැණ වැටහීමෙන් භය ජනක ආකාරයක් ඇතිවීම භයඤාණයයි.

7 ආදීනව ඤාණය= ඉදිරි භාවනාමාර්ගයේදී නොපෙනී හෙවත් විනාශ වෙවී යන නාම රූප ධර්මයන් පිළිබඳ නියම තත්වය අවබෝධ වීමෙන් සංස්කාරයන් බලවත් දොස් සහිත බව වැටහීමේ නුවණ යි.

8 නිබ්බිදා ඤාණය= ඉදිරි භාවනා මාර්ගයේදී සංස්කාරයන් ගේ නොදැනී යැම හෙවත් විනාශ වෙවී යැම පිළිබඳ තත්වාවබෝධයෙන් වෙහෙසවූ- කලකිරීම් සහගත අවබෝධ ඤාණයක් පහල වේ.

9 මුඤ්චිතු කම්‍යතා ඤාණය= තවදුරටත් භාවනාව දියුණුවීමේදී විනාශ වෙවී යන සංස්කාරයන් දුක් බව, මනාව අවබෝධ වීමෙන් ඒවායින් මිදීමට භාවනානුයෝගියාට මහත් බලාපොරොත්තු සහගත ඤාණයක් ලැබේ.

10 **පටිසඞ්ඛා ඤාණය**= මෙසේ සම්පූර්ණ තත්වාවබෝධයෙන් යුත් යෝගාවචරයා විශෙෂ උත්සාහ ගෙණ ඒ සංස්කාරයන්ගෙන් මිදීම සඳහා භාවනා මාර්ගයේ ඉදිරියටම යෑම මනාව තේරුම් ගන්නේ ය.

11 **සංඛාරූපෙක්ඛා ඤාණය**= දැන් යෝගාවචරයා සංස්කාරයන් කෙරෙහි උපෙක්ෂා ස්වභාවයෙන් නිරුත්සාහයෙන් ඉබේම භාවනා මාර්ගයේ ඉදිරියට යන්නේ ය.

(i) භයක් හෝ සතුටක් නැත. (ii) සුවදුක් දෙක්හි වෙනසක් නැත. (iii) භාවනා කිරීම නිරුත්සාහයෙන් සිදුවේ. (iv) බොහෝ වේලා භාවනා කිරීමේ කැමැත්ත. (v) එසේ භාවනා කිරීමේදී වඩා වඩාත් සිත පිරිසුදු වීම. (vi) භාවනාව ස්ථිර හා ශක්තිමත් වීම ද බොහෝ වේලා ගියද සිත බැහැරී අරමුණු කරා නොයෑම මේ සඞ්ඛාරූපෙක්ඛා ඤාණයාගේ විශෙෂ ගුණයෝ ය.

12 **වුට්ඨානගාමිනී ඤාණය**= භාවනාව ශක්තිමත් වූ මේ අවස්ථාවේ පටන් මුහුණ ප්‍රාණවත් පැහැදිලි ජවි වර්ණයකින් යුක්ත වේ. මේ කෙළින්ම මාර්ගඥානයට පැමිණීමේ නුවණයි.

13 **අනුලෝම ඤාණය**= සිත පිළිබඳ මේ විශෙෂ අවස්ථාව වනාහි යට දැක්වූ "දැනීමේ" අරමුණෙහි අවසාන අවස්ථාවයි.

14 **ගොත්‍රභූ ඤාණය**= මාර්ගඥානයට ඇතුළත් වීමේදී දැනීම අරමුණෙහි අවසාන අවස්ථාව නැවතීම. දැනීම අරමුණ නැවතී යෑම, නිරුද්ධවීමූ ගොත්‍රභූ ඤාණයයි. මේ ලෞකිකත්වයෙන් මාරුවෙමින් පවත්නා අවස්ථාවයි.

15 **මග්ගඵල ඤාණය**= සියලු සංස්කාරයන් ගේ නැවතීම තත්වාකාරයෙන් අවබෝධවීම මාර්ගඵල ඥානයයි.

7 **ඤාණ දස්සන විසුද්ධිය**= මාර්ගඵල පිළිබඳ විත්තඥාන යයි. ඉතා පිරිසිදු විදර්ශනාඥානයෙන් නිර්වාණ අවබෝධ කිරීමෙන් මාර්ගඥානය සම්පූර්ණ වෙයි. චතුරාර්ය සත්‍යයාගේ පැහැදිලි අවබෝධයයි.

16 **පච්චවෙක්ඛණ ඤාණය**= දැන් යෝගාවචරයා මේ තත්වයට පැමිණීමට ආ භාවනාමාර්ගය දෙස ආපසු බලන්නේය අවබෝධ කළ ධර්මමාර්ගය නැවත විමසා බැලීම ප්‍රත්‍යවෙක්ෂා ඥානයයි.

17 **ඵල සමාපත්ති ඤාණය**= නැවතත් භාවනානුයෝගියා ක්‍රමානුකූලව භාවනා කරගෙන යන විට අවශ්‍ය ප්‍රමාණ ශක්තිමත් සමාධිය ඇතිවීමෙන් ඉහත සඳහන් අවස්ථාවට- දැනීමේ අරමුණ නැවතීමට පැමිණෙන්නේ ය. එය ඵලඥානයයි. අධිෂ්ඨාන අනුව නැවත නැවතත් පුහුණු කිරීමෙන් ඉතා ඉක්මණින් ඵලඥානය ලැබීමට හා එහි කැමති වේලා ගත කිරීමට ලැබෙන්නේ ය.

1. මොහු කිසිකලෙක අන් ධර්මයක් සරණ නොයේ.
2. සියලු මිසදිටුවන්ගෙන් තොරය.
3. තෙරුවන කෙරෙහි නොසැලෙන ශ්‍රද්ධාවකින් යුතුය. සියලු සැකයෙන් තොරය.
4. මේ අෂ්ටාංගික මාර්ගය හැර අනිත් මිථ්‍යා ශීලයකින් ව්‍රතයකින් මේ ශාන්ත සුවය නොලැබිය හැකි බව තේරුම් ගන්නෙකි.
5. ඊර්ෂ්‍යාවෙන් හා මසුරු බැවින් තොරය.

---

**හැමට මෙම ශාන්ත සුවය හිමි වේවා!**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු